## 2019/04/09 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2019/04/09 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2019.04.09 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින්, සභාව පිහිටුවා වසරක් පිරෙන මේ මොහොතේ 2019 අප්‍රේල් මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. පෙර සභාවල පරිදිම ඔබ සියළු දෙනාගේ සහයෝගය මම ඉතා ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

ගරු මන්ත්‍රී වී.වී. සහබන්දු මන්ත්‍රීතුමාගේ වෙනත් කථාව යටතේ සඳහන් කරන ලද පොතේ නම **Grass for my feet** යනුවෙන් නිවැරදි විය යුතු වීම සහ කටුපොල් කර්මාන්තශාලාවේ අපදූව්‍ය හේතුවෙන් මාමනදොල ඇළේ සිටි ඒකදේශීක මත්ස්‍යයන්ගේ නම් සඳහන් කල මුත් එම නම් වාර්තාවේ සඳහන් නොවූ බව අඩුපාඩු ලෙස පෙන්වා දෙන ලදී.

**(අ)02. 2019.03.12 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුනසේකර මහත්මිය විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පෙරපාසල පිළිසකර කර ගැනීම සම්බන්ධව ජී. නිරෝෂා සඳමාලි, උක්ඹිටිට පෙර පාසල් පාලිකාතුමිය විසින් යොමු කරන ලද 2019.03.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා, ගරු මන්ත්‍රී සී.වී. සහබන්දු මහතා අදහස් දැක්වූ අතර ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ අනාගතය ගැන සිතා සැළසුම් සහගතව, කාලයක් පවතින පරිදි ,ක්‍රමවත් වැඩපිළිවෙලකට මෙම පිළිසකර කිරීම සිදු කල යුතු බවත්, තාවකාලික විසඳුම් සුදුසු නොවන බවත්ය

02. නාගොඩ ප්‍රාදේශීය සභාවේ J.C.B. යන්ත්‍රය වෙන්දේසි කිරීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද 2019.03.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

03. “බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට එරෙහි අවසන් අසිපත” ග්‍රන්ථය අලෙවි කිරීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද 2019.03.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04. උඩුගම මාවිදොල අමුණ සම්බන්ධව දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, ගාල්ල විසින් යොමු කරන ලද 2019.03.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. උඩලමත්ත කොට්ඨාසයේ සභාවට පවරා ගත යුතු මාර්ග සම්බන්ධව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් යොමු කරන ලද මාර්ග ලේඛනය සභාගත කරන ලදී.

06. බල ප්‍රදේශයේ සභාවට පවරා ගත යුතු මාර්ග සම්බන්ධව ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා විසින් යොමු කරන ලද මාර්ග ලේඛනය සභාගත කරන ලදී.

07. කැප්පිටියගොඩ කොට්ඨාසයේ සභාවට පවරා ගත යුතු මාර්ග සම්බන්ධව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යොමු කරන ලද මාර්ග ලේඛනය සභාගත කරන ලදී.

08. සේවය ස්ථිර කිරීම සම්බන්ධව හඟරන්වල දිමුතු පෙර පාසලේ ප්‍රධාන ගුරුතුමිය වන එච්.කේ. භාග්‍යා සඳමාලි මහත්මිය විසින් යොමු කරන ලද 2019.04.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා අදහස් දැක්වූ අතර, ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ මූලික සුදුසුකම් සපුරා නොමැති බැවින් සේවය ස්ථිර කිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බවයි.

09. මාර්ගය සකස් කර දෙන ලෙස , ජගත් සහබන්දු මහතා ඇතුළු ගම්වාසීන් විසින් යොමු කරන ලද 2019.03.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ ප්‍රධාන මාර්ගයේ මෙම පිවිසුම් මාර්ගයට ඇතුළු වන ස්ථානයේ ඇති මාර්ග සහ කොන්ක්‍රීට් කණුවක් හේතුවෙන් මාර්ගය සකස් කිරීමට අපහසු බැවින් මාර ගස සහ කොන්ක්‍රීට් කණුව ඉවත් කිරීම සඳහා අදාළ ආයතන දැනුවත් කරන බවයි.

10. නාගොඩ මහජන පුස්තකාලයට අවශ්‍ය පොත්, පුවත්පත් හා සඟරා මිළදී ගැනීම සඳහා අවසර ඉල්ලා බී.ඩී.එල්. දිල්රුක්ෂි කුමාරි, පුස්තකාලයාධිපති විසින් යොමු කරන ලද 2019.04.04 දිනැති ලිපිය සභාගත කරන ලදී.

11. LL 7366 ට්‍රක් බවුසරය සඳහා රක්ෂණ සහතිකය සහ ආදායම් බලපත්‍රය ලබා ගැනිම සම්බන්ධව රියදුරු, සම්පත් සංජීව මහතා විසින් 2019.04.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

12. RX 2239 ටේලර් බවුසරය සඳහා රක්ෂණ සහතිකය ලබා ගැනිම සම්බන්ධව රියදුරු, සම්පත් සංජීව මහතා විසින් 2019.04.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

13. RD 1637 ට්‍රැක්ටර් ඇන්ජිම සඳහා රක්ෂණ සහතිකය ලබා ගැනිම සම්බන්ධව රියදුරු, සම්පත් සංජීව මහතා විසින් 2019.04.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

14. RD 9457 ට්‍රැක්ටර් ඇන්ජිම සඳහා රක්ෂණ සහතිකය ලබා ගැනිම සම්බන්ධව රියදුරු, සම්පත් සංජීව මහතා විසින් 2019.04.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

15. RA 8570 ට්‍රැක්ටරය සඳහා රක්ෂණ සහතිකය ලබා ගැනිම සම්බන්ධව රියදුරු, සම්පත් සංජීව මහතා විසින් 2019.04.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

16. RA 8569 ට්‍රැක්ටරය සඳහා රක්ෂණ සහතිකය ලබා ගැනිම සම්බන්ධව රියදුරු, සම්පත් සංජීව මහතා විසින් 2019.04.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

17. LL 7650 කෘ කැබ් රථය සඳහා රක්ෂණ සහතිකය, ආදායම් බලපත්‍රය සහ දුම් වාර්තාව ලබා ගැනිම සම්බන්ධව රියදුරු, කැළුම් චාමර මහතා විසින් 2019.04.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

18. 252-6478 කැබ් රථයේ ටයර් ගෙවී ඇති බැවින් අලුතින් ටයර් 04 ක් ලබා ගැනීම සම්බන්ධව රියදුරු, බී.ජී. පියතිලක මහතා විසින් 2019.04.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

19. LL 7103 ටිපර් රථය සඳහා රක්ෂණ සහතිකය, ආදායම් බලපත්‍රය සහ දුම් වාර්තාව ලබා ගැනිම සම්බන්ධව රියදුරු, අනුර දිසානායක මහතා විසින් 2019.04.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

20. සෞඛ්‍ය කම්කරුවන් හා මාර්ග කම්කරුවන් සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම සම්බන්ධව කළමනාකරණ සහකාර, එස්.කේ. මල්ලවආරච්චි මහතා විසින් යොමු කරන ලද 2019.04.03 දිනැති ලිපිය සභාගත කරන ලදී.

21. උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානයේ ජල සැපයුමට අදාල ලැබී ඇති ජල බිල්පත හා තොරතුරු සම්බන්ධව සංවර්ධන නිලධාරී, අයි. චතුරි චින්තිකා මහත්මිය විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ සභාවට රු. 21000.00 ක බිලක් ලද බවයි. එවිට ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා එම බිල හෝ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. එමෙන්ම අපි ජල සම්බන්ධතාවය ගත්තෙ කවදද? මාස කීයක් පාවිච්චි කරලා තියෙනවද? මාස ගණනින් බෙදලා උත්තරය හරිනම් විතරක් මේක සභාවට දාන ලෙසද ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් තවදුරටත් අදහස් දක්වන ලදී. ගරු සභාපතිතුමා එයට පිළිතුරු දෙමින් ජල

සම්බන්ධතාවය ලබා දුන් දිනය කොහේවත් සටහන් වී නැති බවත්, ඒ සම්බන්ධ දැනුවත් වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අතර ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ප්‍රකාශ කර සිටියේ සාකච්ඡා කර, ආරවුල බේරුමක් කර, ලබන සභා වාරයට ඉදිරිපත් කරන ලෙසයි.

මේ සම්බන්ධව ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා, ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය, ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා වැඩිදුරටත් අදහස් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව දීර්ඝ ලෙස කරුණු සාකච්ඡා වූ අතර, මේ පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරි සභාවට යොමු කිරීමට තීරණය විය.

22. මාපලගම බස් නැවතුම්පොළ භූමියේ පොදු වැසිකිලිය ඉදිකිරීම සම්බන්ධව දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් 2019.03.12 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ප්‍රකාශ කර සිටියේ කාගෙවත් බලපෑමකට යටත් නොවී කටයුතු කරන ලෙසයි. ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ප්‍රකාශ කර සිටියේ සභාපතිතුමාට ලැබී ඇති බලතල අනුව තීන්දුවක් ගන්නා ලෙසත්, රටේ ජනාධිපති කිව්වත් තමාට පැවරී ඇති බලතල අනුව කටයුතු කරන ලෙසත් දැන්වීය. එවිට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ කාගෙවත් කීමටවත්, කාගෙවත් බලපෑමකටවත් යටත් වෙන්නේ නැති බවත්, ගිය වර එක්කෙනෙක් විරුද්ධ වුවත්, එය අදාළ නොමැති බවත්, අපි මේක හදන්න කටයුතු කරමු යනුවෙනි.

23. දකුණු පළාත් සභා සංවර්ධන සැළැස්ම - 2019 මන්ත්‍රී ප්‍රතිපාදන- නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඉසුරු දොඩංගොඩ මැතිතුමා විසින් එවා ඇති ප්‍රතිපාදන සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2019.03.29 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

24. දකුණු පළාත් සභා සංවර්ධන සැළැස්ම - 2019 මන්ත්‍රී ප්‍රතිපාදන- නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාර්ග සංවර්ධනය කිරීම සඳහා සම්පත් අතුකොරල මැතිතුමා සහ වානක මදුගොඩ මැතිතුමා විසින් එවා ඇති ප්‍රතිපාදන සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2019.04.03 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

25. තල්ගස්වල සති පොළ විදුලි පරිපථ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබා දෙන ලෙස ඉල්ලා විදුලි කාර්මික, ලෙස්ලි සිරිවර්ධන මහතා විසින් යොමු කරන ලද 2019.04.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

26. අංක 12 උඩවැලිවිටිය කොට්ඨාසයේ පැවැත්වෙන බක්මහ උළෙල සඳහා අනුග්‍රාහකත්වයක් ලබා ගැනීම සම්බන්ධව ගරු මන්ත්‍රී එච්.කේ. ලක්රුවන් සම්පත් මහතා විසින් යොමු කරන ලද 201.04.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ)1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

01. ඇල්පිටිය වතු සමාගම මගින් ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් ලබා දීමට එකඟතාවය පළ කර ඇති බැවින් වළකුඹුර ප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදි කිරීමට යෝජනා කරමි. ඒ සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමට සභාවේ සහයද අපේක්ෂා කරමි.

අදාහනාගාරය ඉදි කිරීමට ඉල්ලීම් කර තිබූ ඉඩම ලබාදීමට ඇල්පිටිය වතු සමාගමන් ගුළුගහකන්ද වත්තෙන් ඉඩම නිදහස් කරන්න ලියුම හෙට අනිද්දට එයි. එම ඉඩම නිදහස් කර ගැනීම තමයි ප්‍රශ්නෙ වෙලා තියෙන්නෙ. ඒ වගේම ඒ ආදාහනාගාරයට ඉඩම් ලබා ගැනීමේ කටයුතු, එම ඉදිකිරීම් කටයුතු සඳහා සභාවේ අනුමැතිය අවශ්‍යයි. ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ඉල්ලා සිටියේ සභාවේ මන්ත්‍රීවරු හැටියට අපට එම ස්ථානය ගැන කියන්න යනුවෙනි. ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාද අදහස් දක්වන ලදී.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් භුක්ති විදින නමුත් අපට අයිතිය නොමැති ඉඩම්වල අයිතිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. අප ප්‍රාදේශීය සභාවේ මාසික සභා වාරය පවත්වන දිනයන්හිදී තේ පැන් සංග්‍රහය ගරු මන්ත්‍රී මණ්ඩලයට සහ සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. ගාල්ල දිස්ත්‍රික්කයේ නාකියදෙනියවත්ත( සිඩ්න් ගාර්ඩන් කොටස) බලයලත් මිනින්දෝරු යූ.ජී.එන්.එම්. ජයවර්ධන මහත්මිය විසින් නාගොඩ ප්‍රාදේශීය සභාව නමින් අංක 1027 හා 1028 දරණ පිඹුරු පත් සකස් කොට අප වෙත ලබා දී ඇත. ඒ සඳහා මැණුම් ගාස්තු දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. LL 7366 ට්‍රක් බවසරය සඳහා රක්ෂණ සහතිකය සහ ආදායම් බලපත්‍රය ලබා ගැනිම, LL 7050 කෘ කැබ් රථය සඳහා රක්ෂණ සහතිකය, ආදායම් බලපත්‍රය සහ දුම් වාර්තාව ලබා ගැනිම, RX 2239 ටේලර් බවුසරය, RD 1637 ට්‍රැක්ටර් ඇන්ජිම, RD 9457 ට්‍රැක්ටර් ඇන්ජිම, RA 8570 ට්‍රැක්ටරය, RA 8569 ට්‍රැක්ටරය සඳහා රක්ෂණ සහතික ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. 252-6478 කැබ් රථයේ ටයර් ගෙවී ඇති බැවින් අලුතින් ටයර් 04 ක් ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. සෞඛ්‍ය කම්කරුවන් හා මාර්ග කම්කරුවන් සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් මාර්ග ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

- කංකානම්ගොඩ බීරිගෙවත්ත, නාරංගොඩවත්ත මාර්ගය
- කංකානම්ගොඩ මඤ්ඤොක්කාහේන මාර්ගය
- නයාමුල්ල නයාමුල්ලකන්ද මාර්ගය
- වාඩිගොඩ හඟරන්වල මාර්ගය
- කුරුපනාව සිට ඉහළ උග්ගල්ගොඩ දක්වා අතුරු මාර්ගය
- හොරගහකන්ද දෙහි ගෙදර අසළ සිට කුරුපනාව දක්වා අතුරු මාර්ගය
- උඩලමත්ත කනත්ත ඉඩමේ සිට මඤ්ඤොක්කාහේන මාර්ගය

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් මාර්ග ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

- තල්ගස්වල කුඹුරුහේන මාර්ගය
- තල්ගස්වල කලුකොත 2 පටුමග මාර්ගය
- වැව රවුම නාවින්න මාර්ගය
- 37 නාවින්න මාර්ගය
- දොළේකඩේ නාවින්න මාර්ගය
- ගොරකගස්තුඩුව මාර්ගය
- ඇටහේන මාර්ගය
- නො. 20 මානගොඩ මාර්ගය

- සෝභිත මාවත මාර්ගය
- කුඹුරුහේන කම්මල්ගොඩ මාර්ගය

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

10. ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් මාර්ග ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

- වළකුඹුර සිට කෝවිල් මාර්ගය
- කොරටුවවත්ත මාර්ගය ඩබ්. එල්.සිරිල් මහතාගේ නිවස දක්වා
- නාගොඩවත්ත දෙවන අදියර මාර්ගය
- නාගොඩවත්ත පළවන අදියර මාර්ගය
- කැප්පිටියගොඩ නියාගම්වත්ත පාර
- පඹේදෙණිය මංගල නානායක්කාර මහතාගේ නිවස දක්වා ඇති අතුරු මාර්ගය
- පියසෙන් ගම්මානය රත්නා වනිගසේකර නිවස ඉදිරිපිට ඇති එම්.කේ. ලීලාවතී යන අයගේ නිවස දක්වා ඇති මාර්ගය

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වී.වී. සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

11. නාගොඩ මහජන පුස්තකාලයට අවශ්‍ය පොත්, පුවත්පත් හා සඟරා මිළදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

12. තල්ගස්වල සති පොළ විදුළි පරිපථ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**13. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**<u>2019.04.09 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**<u>ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)</u>**

**01.2019 පෙබරවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4501090200 | - මාපලගම වෙළඳ සංකීරණ කොරිඩෝව | - රු. 3259.50 |

**<u>2019 මාර්තු මස විදුලි බිල්පත්</u>**

| | | |
|---|---|---|
| 4507357802 | -සමනළ පෙර පාසල | - රු. 331.50 |
| 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 258.30 |
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 276.60 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 5693.40 |
| 8617046104 | - උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය | - රු. 624.30 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1447.80 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 276.60 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 313.20 |
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 331.50 |

**02.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය ජල බිල්පත (2019.02.21 – 2019.03.21) -රු. 1372.91

**03. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (2019.02.16- 2019.03.15) - රු. 688.48

**04.මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාව සඳහා බිල්පත (2019.03.25) - රු. 68.86

**05. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

**2019 මාර්තු**

0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 9111.76

**2019 පෙබරවාරි සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම - 0912231201**

2019.02.01 – 2019.02.28 දක්වා - රු. 5188.83

**06.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 මාර්තු මස ඉන්ධන දීමනා ලබා දීමේ බිල්පත පියවීම -රු.81000.00

**<u>07.අතිකාල දීමනා ගෙවීම</u>**

**<u>2019 පෙබරවාරි මස</u>**

| | | |
|---|---|---|
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු.1762.66 |
| ඉෂානි දීපිකා ගනේවත්ත මිය | - පරිගණක ක්‍රියාකරු | - රු. 638.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු.9298.60 |

**<u>2019 මාර්තු මස</u>**

| | | |
|---|---|---|
| කේ.ජී. මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 950.32 |
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු.3582.18 |
| ඩබ්.ඒ.සී. මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 1524.32 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1144.00 |
| බී.ජී. පියතිලක මයා | - රියදුරු | - රු. 8031.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු.7075.50 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 7680.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.5016.00 |
| එන්.එම්.රජිත මයා | -අනියම් මුරකරු | - රු.4040.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු. 6165.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු.9053.90 |

**<u>08.2019 මාර්තු මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 3000.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 3000.00 |
| ආර්.ඒ.ඒ.එල් රත්නායක මිය | -සංවර්ධන නිලධාරී | - රු. 3000.00 |

**09.ගමන් වියදම් ගෙවීම**

**<u>2019 පෙබරවාරි මස ගමන් වියදම්</u>**

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

| | | |
|---|---|---|
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු. 876.00 |

**<u>2019 මාර්තු මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 466.00 |
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු. 480.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 1400.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 1940.00 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 350.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 430.00 |

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

| | | |
|---|---|---|
| කේ.ජී. මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1960.00 |
| ඉරේෂා මදනායක මිය | - සංවර්ධන නිලධාරී | - රු. 910.00 |
| ශ්‍රියානි කිරින්දගේ | - පුස්තකාලයාධිපති | - රු. 1760.00 |
| චන්දිමා සෙනවිරත්න මිය | - කළමනාකරණ සහකාර | - රු. 1712.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 1760.00 |
| ඩබ්. ආර්. අනුෂි වසන්තිකා මිය | - පුස්තකාල සහායක | - රු. 1756.00 |

**<u>සේවාරම්භක පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම වෙනුවෙන් ගෙවීම (දින 10 ක් සඳහා )</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 8800.00 |

**10.** **එල්.ඒ.ජේ. දිවාකර මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/03/29) - රු. 430.00

II. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/02/22) - රු. 430.00

**11.** **කේ.වී.පී. ඩයස් මයා, සහකාර කළමනාකර ඉංජිනේරු, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය**

නාගොඩ ප්‍රාදේශීය සභාව සතු RA 8569, RA 8570, RD 1637, RD 9457 අංක දරණ ට්‍රැක්ටර් රථ අළුත්වැඩියා කිරීම සඳහා පරික්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 2000.00

**12.** **විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

i. විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 10000.00

ii. 2017 වර්ෂයට අදාල විගණන ගාස්තු ගෙවීම (2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා - රු.158010.00

**13.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**<u>2019 පෙබරවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් - රු. 5150.00

RD 9457 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 81 ක් - රු. 8179.00

**14.** **කේ.ජී. ධනසිරි මයා තෙල් පිරවුම්හල, ගා/නාගොඩ**

**<u>2019 මාර්තු මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 564ක් - රු. 58482.00

LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 270 ක් - රු. 28040.00

252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 275 ක් - රු. 28480.00

LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 210 ක් - රු. 21250.00

**15.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 මාර්තු මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00

ii. 2018 මූල්‍ය ප්‍රකාශන වාර්තාව ඡායා පිටපත් කිරීමේ ගාස්තු ( පිටපත් 06 ක් සඳහා) - රු. 1890.00

**16.ඒ.ඩී. කරුණාරත්න,සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

2019 පෙබරවාරි - රු. 5570.00

2019 මාර්තු - රු. 6350.00

**17.එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

2019 මාර්තු - රු.5480.00

**18.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක පී 15977 අදාළව 2019.03.13 කැඳවන ලද නඩු වාරය සඳහා නීතිඥ පෙනී සිටීමේ ගාස්තු , 2019.03.22 නීතිඥ පෙනී සිටීමේ ගාස්තු හා 13874 දරන ඔප්පුවේ සහතික පිටපතක් ලබා ගැනීමට අදාළ ගාස්තු ගෙවීම - රු.6500.00

ii. නඩු අංක එල් 16242 අදාළව 2019.02.01 කැඳවන ලද නඩු වාරය සඳහා නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු.3000.00

**19.ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**

i. 2019 මාර්තු මස 12 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2324.00

**ii.** 2019.03.21 පැවති විශේෂ මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත - රු. 3287.00

**20. ආර්. ඒ. රංජිත් මානෙල් මයා, සීගිරි හොටෙල්, නාගොඩ**

i. 2019 මාර්තු මස 12 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සඳහා) - රු. 780.00

**21. එම්.පී.ජී. රසිකා උදය කුමාරි, හෝමදොල , උඩුගම**

2019.02.04 දින මාධූර්යා ළමා ගී ප්‍රසංගය පැවැත්වීම වෙනුවෙන් උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ල වෙන් කිරීමේ තැන්පතු ගාස්තු නැවත ගෙවීම - රු.5000.00

**22. ජී. පී. සඳුන් චතුරංග මයා, ඊබේස් කම්පියුටර්, මාපලගම**

i. පරිගණක සඳහා වෛරස් ගාඩ් මෘදුකාංගය මිළදී ගැනීමේ බිලිපත පියවීම - රු. 3400.00

ii. ප්‍රධාන කාර්යාලයේ ඇති ප්‍රින්ටර් සඳහා අවශ්‍ය ටෝනර් 04 ක් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු.39500.00

**23. පී.එල් රංජන් මයා, ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල**

i. මාපලගම, උඩුගම හා නාගොඩ මහජන පුස්තකාල 3 සඳහා අවශ්‍ය පොත් සමීක්ෂණයට අදාළ මුද්‍රා 03 සඳහා බිල්පත පියවීම. - රු. 4800.00

ii. මාපලගම, උඩුගම හා නාගොඩ මහජන පුස්තකාල සඳහා පොත් ලද දිනය තහවුරු කිරීමට අවශ්‍ය දින මුද්‍රා 03 ක් ලබා ගැනීමට අදාළ බිල්පත පියවීම - රු. 5850.00

iii. 252-6478 දරණ කැබ් රථයේ දෙපස අංක තහඩු සෑදීමේ බිල්පත - රු. 1750.00

iv. නව ලේකම්තුමියගේ නිල මුද්‍රා 02 ක් සකස් කිරීමේ බිල්පත - රු. 2000.00

**24. එස්.බී. ප්‍රින්ටර්ස් (පුද්) සමාගම**

වැය ලේඛන - ප්‍රාස 12 (කොටු) පොත් 04 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 2570.00

**25. අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්ගලික සමාගම, පිටිගල**

වීථි පහන් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීමේ බිල්පත පියවීම ( බි. අ. 21655) වයර් කොයිල්, ටූ පින් හෝල්ඩර්, CFL බල්බ් - රු.63200.00

**26. ධම්මික ලී මෝල සහ වෙළඳ සැල, උඩලමත්ත, ගාල්ල**

කුමුදුවිලට සඳරැස් කළා මංගල්‍යය වෙනුවෙන් නාගොඩ රාජකීය විද්‍යාලය විසින් ඉදි කල තොරණ සඳහා මුදල් ගෙවීමේ බිල්පත - රු. 7649.00

**27. ලංකා ෆිලිං ස්ටේෂන්, තල්ගස්වල**

2019.03.15 /16/17 යන දිනයන්හි තල්ගස්වල පත්තිනි දේවාලයේ පැවති උත්සවය සඳහා මාර්ගය ප්‍රතිසංස්කරනය කිරීම සඳහා යොදා ගත් බැකෝ යන්ත්‍රයට තෙල් ලබා දීමේ බිල්පත පියවීම ( ලීටර් 40) - රු. 4160.00

**28.ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව. නාවින්න.මහරගම**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ ආයුර්වේදය සඳහා අවශ්‍යා ඖෂධ මිලදී ගැනීමේ බිල්පත පියවීම. - රු.16400.00

**29. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා අප්‍රේල් මස මාසික කුලීය ගෙවීම - රු. 4000.00

**2019/03/27 හා 28 දෙදින තුල පැවති පිරිත් පිංකම හා පුස්තකාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව පියවීම.**

**30.ආර්. ඒ. රංජිත් මානෙල් මයා, සීගිරි හොටෙල්, නාගොඩ**

පිරිත් පිංකම දින රාත්‍රී සංග්‍රහ හා පුස්තකාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවයේ සංග්‍රහ වියදම - රු.15850.00

**31.ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**
පිරිත් පිංකම සඳහා අවශ්‍යා ද්‍රව්‍ය (පිරිත් මණ්ඩපයට හා රාත්‍රී ආහාර සඳහා අවශ්‍යා අමු ද්‍රව්‍ය )වෙනුවෙන් මුදල් ගෙවීම - රු.27147.00

**32.ටී.ජී.සුමනසිරි මයා. ටී.ජී.හාඩ්වෙයාර්. නාගොඩ**

පිරිත් දේශනයේ ආහාර පිසීම සඳහා ලබා ගත් ගෑස් සිලින්ඩරය සඳහා ගෙවීම - රු. 1775.00

**33.කේ.ජී.අශෝක උදය කුමාර මයා.කුමාර ඉලෙක්ට්‍රිකල්ස් ඇන්ඩ් සවුන්ඩ්ස්.නාගොඩ**

පිරිත් පිංකම හා පුස්තකාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් ලබා ගත් ශබ්ද විකාශන යන්ත්‍ර හා ආලෝකකරණය සඳහා ගෙවීම්. -රු. 13200.00

**34.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

පිරිත් පිංකම හා පුස්තකාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවයේ සඳහා ගරු සභාපතිතුමා දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම (කැවිලි,කෙසෙල්, කෝකියාගේ ගාස්තු. පිරිත් මණ්ඩප ගාස්තු, කලස්,නූල්,ලිපි කවර ආදිය සඳහා) -රු. 15265.00

**35. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
2019මාර්තු - රු.13000.00

**36. ප්‍රියන්ත මෝටර්ස්, තලගහ**

i. RA 8569 ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියා කිරීමේ වියදම්
(රියදුරු අසුන, ඩීසල් ෆිල්ටර් 02, ජියර් බෝල, AC පොම්පය) - රු. 16515.00
ii. RA 8570 ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියා කිරීමේ වියදම්
(රියදුරු අසුන, ඩීසල් ෆිල්ටර් 02, ජියර් බෝල,) - රු. 14765.00

**37.ඊ.ඒ.එස්.කේ. එදිරිසිංහ මයා, උඩුගම**

i. RA 8569 ට්‍රැක්ටර් රථය අළුත්වැඩියා කර සවිකිරීමේ බිල්පත් (ඩීසල් ටැංකිය ශුද්ධ කර නැවත සවි කිරීම, ඩීසල් ෆිල්ටර් අලුතින් සවි කිරීම, AC පොම්පය සවි කිරීම - රු. 2850.00

ii. RA 8570 ට්‍රැක්ටර් රථය අළුත්වැඩියා කර සවිකිරීමේ බිල්පත් - රු. 3750.00

**38. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

රාජකාරි අවශ්‍යතාවයන් සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ධාවනය කිරීමේ ගාස්තුව - රු. 1800.00

**39.මහින්ද අයන් වර්ක්ස්, නාගොඩ**

නාගොඩ කැකුළු පෙර පාසලේ වදුරු ඔන්චිල්ලාව සෑදීම සඳහා දරන ලද වියදම - රු. 1300.00

## පොදු අරමුදල් කර්මාන්ත

**40. ඒ.කේ.ජේ. ගයාන් සංජීව, ගයාන් එන්ටර්ප්‍රයිසස්, යටලමත්ත**

i. 70 කන්ද පංසල් මාවත ජේ.සී.බී යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම- රු.10000.00

ii. ගම්මැද්දේගොඩ බොකටියවෙල මාර්ගය ජේ.සී.බී යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම හා H.S. 2076 ටිපර් රථය එක දිනක් යොදවා ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 27000.00

**41. එස්.ඩබ්.සී.ප්‍රියදර්ශනී .උඩුගම**

28 ප්‍රදේශයේ මිනිරන්වල කන්ද මාර්ගය ජේ.සී.බී යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු.15000.00

**42. කේ.කේ.බී.රාජකරුණා .සී.පී.ආර් එන්ටර්ප්‍රයිසස් යටලමත්ත**

ඌරල නැහිනිගල මාර්ගයේ කාණු කපා සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා බැකෝ යන්ත්‍රය යෙදීම වෙනුවෙන් ගෙවීම. මීටර් පැය 10 - රු.25000.00

**43. එම්.වී. නාමල් ලක්රුවන් මයා**

i. නාකියාදෙනිය නො 04 කෝවිල ශුද්ධ කිරීම වෙනුවෙන් බැකෝ මීටර් පැය 07 - රු. 17500.00

ii. නාකියාදෙනිය නො 04 පාර කැපීම හා පිට්ටනිය ශුද්ධ කිරීම සඳහා බැකෝ මීටර් පැය 08 - රු. 20000.00

iii. ගෝණදෙනිය ක්‍රීඩා පිටිය ශුද්ධ කිරීම හා කාණු කැපීම සඳහා බැකෝ පැය 08 - රු. 20000.00

**44. පී.ජී. සමන්ත මයා**

ලෙහුවල කන්ද දිසානායක මාවත සංවර්ධනය කිරීම සඳහා බැකෝ මීටර් පැය 08 - රු. 20000.00

**45. හෂාන් චාමික ගොඩකන්ද මයා**

i. කැටගොඩ දකුණ කිඹුල්කොටුකන්ද මාර්ගය සංවර්ධනය සඳහා කොරිපස් කියුබ් 06 ක් ලබා ගැනීම - රු. 12000.00

ii. කැටගොඩ දකුණ කිඹුල්කොටුකන්ද මාර්ගය සංවර්ධනය සඳහා කොරිපස් ප්‍රවාහනය කිරීමේ ගාස්තු - රු. 3675.00

**46.** **ආසිරි ජොෂ්ය පුරවැසි සංවිධානය**

ප්‍රධාන කාර්යාලයේ සබාපති නිල කාමරය හා පුස්තකාලයේ අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම - රු. 467805.24

**රජයේ ආධාර (මන්ත්‍රී ප්‍රතිපාදන)**

**යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමාගේ ප්‍රතිපාදන**

**47.** **සී/ස බද්දේගම බටහිර ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, පුහුල්දූව**

i. නාගොඩ වළකුඹුර අත්කම් නිවාස 2 අදියර ප්‍රවේශ මාර්ග සඳහා $18^{11}$X $8^{11}$ හියුම් පයිප්ප 04 ක් හා $18^{11}$X $4^{11}$ හියුම් පයිප්ප 01 ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් - රු. 35000.00

**රජයේ ආධාර**

**48.** **කුරුපනාව ගොවි සංවිධානය, කුරුපනාව**

කැප්පිටියාගොඩ පඬේදෙනිය පංසල අසළ සිට සංවර්ධන ගම්මානය දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ 10% රුදවුම් නිදහස් කිරීම - රු. 103294.72

නාකියදෙනියවත්ත ඉඩම් මැණිමට අදාල බිල්පත අපි දැනුවත්ව සිදු කරන ලද එකක් නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කල අතර, මෙහදී ගරු මන්ත්‍රී අජිත් මහතා ප්‍රකාශ කර සිටියේ මැණුමට එන බව දන්වා නොතිබුනද, සභාවෙන් පවරා ගැනීමට ඉල්ලා තිබූ බවත්, ඒ සඳහා කටයුතු සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී. එහිදී ගරු සභාපතිතුමා ප්‍රකාශ කලේ මෙම මැණීම් කටයුතු කරන බව අපිවත්, අපේ නිලධාරියෙක්වත් නොදන්නා බවත්, මෙය පවරා ගැනීමට කටයුතු කරන ලද්දේ මේ ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම සඳහා ලක්ෂ ගණනක යෝජනාවක් ඇවිත් තිබූ අතර, එහිදී අපෙන් අයිතිය ඉල්ලූ බැවින් පවරා ගැනීමට කටයුතු සිදු කල බවත්, දන්වා සිටි අතර, මෙම ස්ථානය පිළිබඳ නොදන්නා බවත්, එහි වටිනාකමක් තිබෙන බවත් සභාවට දන්වන ලදී.

මේ ඉදිරිගෙවීම්වල ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීමකට අදාළ ගෙවීමක් තියෙනවා. අපේ ට්‍රැක්ටර් හතරම කැඩිලා, පසුගිය දවස්වල වතුර බවුසර් ඇද්දෙ මහලියද්දෙ ට්‍රැක්ටරේ ඉල්ලාගෙන බවටද අදහස් දක්වන ලදී. ක්ෂණික අවශ්‍යතාවය මත ඉංජිනේරු වාර්තාව අරගෙන ට්‍රැක්ටර් දෙක අළුත්වැඩියා කල බවද ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විමසා සිටියේ පැනෙන් ලියපු ගෙවීම් ගැනයි. එහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ බිල්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා යම් කිසි ක්‍රමවේදයක් ඇති බවත් එයට අනුකූල වන සේ සියළු මන්ත්‍රීවරුන් කටයුතු කල යුතු බවයි. හෙට අනිද්දා අවුරුද්ද නිසා මිනිසුන්ට මුදල් අවශ්‍යතාවය ඇති බැවින් මේ සියළු බිල්පත් සභාවට යොමු කල බවයි.

උඩුගම ඩිපෝව ලඟ පිට්ටනිය හදන කොට මොකක්හරි ප්‍රශ්ණයක් වෙලා මුදල් ගෙවීම නතර කරලා තියෙන බව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ප්‍රකාශ කරන ලදි. එවිට මේ කර්මාන්තය නිසියාකාරව කෙරුනෙ නැති නිසා ගෙවීමට නොහැකි බවත්, තාක්ෂණ නිලධාරී විසින් මෙම අඩුපාඩු

සකස් කලා කියලා වාර්තාවක් ලබා දිය යුතු බවත්, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ප්‍රකාශ කරන ලදී. මෙහිදී ගරු මන්ත්‍රී වෙරංග මහතා ප්‍රකාශ කර සිටියේ කාණුව කපා පස් ඉවත් කරන ලෙස තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබා දුන් බවයි. එම ගෙවීම සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවට යවා ඇතත්, තවම අනුමත වී ඇවිත් නැති බැවින් එම ගෙවීම සිදු කල නොහැකි බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
මේ සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා, ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා වැඩිදුරටත් අදහස් ප්‍රකාශ කරන ලදී.

**අංක 01 සිට 48 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපති තුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- **(ඉ).2 කර්මාන්ත යෝජනා**

**ගරු උප සභාපතිතුමා හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**
**ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. බණ්ඩාරනායකපුර බංඩිහේන මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීම
ii. උඩලමත්ත ගල්කන්දහේන මාර්ගය ආරම්භක ස්ථානයට සිළිංඩර් ලබා දීම
iii. පුහුල්හේන වෙදහේන මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සකස් කර කොරි පස් දැමීම

**ගරු උප සභාපති එම්.කේ.ගාමිණී සුසන්ත මහතා ගේ යෝජනා ගරු මන්ත්‍රි විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**11(8)** යටතේ කරනු ලබන යෝජනා

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**
උඩුගම හොමදොල තුම්මෝදර ක්‍රීඩා පිටිය J.C.B. යන්ත්‍රයක් යොදා සකස් කිරීම

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා ගේ යෝජනා ගරු මන්ත්‍රි ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**
අංක 12 උඩවැලිවිටිය කොට්ඨාසයේ පැවැත්වෙන බක්මහ උළෙල සඳහා අනුග්‍රාහකත්වයක් ලබා ගැනීම.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ගේ යෝජනා ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

## (ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

i. කිඹුල්කොටුකන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම 2000000.00

ii. උඩලමත්ත අලුත් නුවර සිට ධර්මදූත බෞද්ධ මධ්‍යස්ථානය දක්වා ගමන් කරන මාර්ගය කොන්ක්‍රීට් කිරීම 600000.00

iii. පංසල පාර (ප්‍රියදර්ශනාරාමයට යන පාර) කොන්ක්‍රීට් කිරීම 600000.00

iv. නෙළුඇළ ගමට යන මාර්ගය හිරිමඩුව අසලින් උඩට යන කොටස කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම 600000.00

v. හෝමදොලවත්ත නොම්මර 02 වතු නිවාසවලට යන මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම 500000.00

**ඉහත ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## (ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම

**ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපකරණ සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | ජයසුන්දර මෝටර්ස්, ගාල්ල | ගොල් මෝටර් ස්ටෝර්ස්, ගාල්ල | ප්‍රියන්ත මෝටර්ස්, තලගහ |
|---|---|---|---|
| • රියදුරු අසුන | රු. 17000.00 | රු. 17500.00 | රු. 13695.00 |
| • ඩීසල් පිල්ටර් 01 | රු. 400.00 | රු. 750.00 | රු. 390.00 |
| • ජියර් බෝල 01 | රු. 425.00 | රු. 890.00 | රු. 290.00 |
| • AC පොම්පය | - | රු. 1950.00 | රු. 1750.00 |

**ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ප්‍රියන්ත මෝටර්ස්, තලගහ වෙතින් ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය උපකරණ මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ප්‍රියන්ත මෝටර්ස්, තලගහ වෙතින් ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය උපකරණ මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

## මිළ ගණන් විස්තර - 2019 වර්ෂය

| විස්තරය | වර්ගය | ආසිරි ටයර ට්‍රේඩර්ස්, මාපලගම | මුතුහෙට්ටිගම ටයර් සෙන්ටර්, උඩුගම | හඳුන්නෙත්ති ටයර් සෙන්ටර්, උක්ඕවිට | නිව් විජය මෝටර්ස්, ගාල්ල |
|---|---|---|---|---|---|
| 650 × 16 ටයර් | Ceat | 15370.00 | 14919.00 | 15550.00 | 14700.00 |
| 650 × 16 ටියුබ් | Ceat | 1890.00 | 1595.00 | 1900.00 | |
| 650 × 16 රිම් ටේප් | Ceat | 600.00 | 550.00 | 630.00 | 500.00 |
| 600 × 12 ටයර් | Ceat | 8950.00 | 8688.00 | 8950.00 | 8650.00 |
| 600 × 12 ටියුබ් | Ceat | 1250.00 | 985.00 | 1250.00 | 950.00 |
| 600 × 12 රිම් ටේප් | Ceat | | | | |
| 750 × 16 ටයර් | Ceat | 21950.00 | 21288.00 | 22000.00 | 21100.00 |
| 750 × 16 ටියුබ් | Ceat | 2250.00 | 1550.00 | 2250.00 | |
| 750 × 16 රිම් ටේප් | Ceat | 600.00 | 550.00 | 600.00 | 500.00 |
| 600 × 16 ටයර් | Ceat | 14370.00 | 12921.00 | 14350.00 | 12900.00 |
| 600 × 16 ටියුබ් | Ceat | 1700.00 | 1266.00 | 1730.00 | 1250.00 |
| 600 × 16 රිම් ටේප් | Ceat | 600.00 | | 650.00 | 500.00 |
| 12.4 × 28 ටයර් | Ceat | 50780.00 | 53312.00 | 50780.00 | 50600.00 |
| 12.4 × 28 ටියුබ් | Ranvalley | 5900.00 | 4838.00 | 6000.00 | 4700.00 |
| 12.4 × 28 රිම් ටේප් | Ceat | | | | |
| 900 × 20 ටයර් | Ceat | 40680.00 | 40757.00 | 40650.00 | 40500.00 |
| 900 × 20 ටියුබ් | Ranvalley | 2850.00 | 3380.00 | 2850.00 | 2800.00 |
| 900 × 20 රිම් ටේප් | Ceat | 650.00 | 600.00 | 650.00 | 550.00 |
| 825 × 20 ටයර් | Ceat | 33200.00 | 32138.00 | 33350.00 | 31900.00 |
| 825 × 20 ටියුබ් | Ranvalley | 2750.00 | 2762.00 | 2800.00 | 2700.00 |
| 825 × 20 රිම් ටේප් | Ceat | 650.00 | 600.00 | 650.00 | 550.00 |
| 265 × 70 × 16 ටයර් | Maxxis | 34450.00 | 34400.00 | 34450.00 | 34200.00 |
| 205 × 16 ටයර් | Maxxis | 25050.00 | 25000.00 | 25000.00 | 24900.00 |
| ටියුබ්ලස් වැල් කරවල් | | 350.00 | 200.00 | | |

ටයර්,ටියුබ් හා රිම් ටේප් ආදිය සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මෝටර්ස්, ගාල්ල වෙතින් ටයර්,ටියුබ් හා රිම් ටේප් ආදිය මිල දී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මෝටර්ස්, ගාල්ල වෙතින් ටයර්,ටියුබ් හා රිම් ටේප් ආදිය මිල දී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

**වාහන සේවා කිරීම සඳහා ලැබී ඇති මිලගනන් 2019**

| විස්තරය | වර්ගය | ආසිරි ටයර් ට්‍රේඩර්ස්, ඇතුමලේ | වරුණ සර්විස් සෙන්ටර්, මාපලගම | මුතුහෙට්ටිගම ටයර් සර්විස්, උඩුගම | අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල |
|---|---|---|---|---|---|
| ඩිපරන්සල් ඔයිල් ලීටර 01 | | 1039.00 | 830.00 | 1078.00 | 860.00 |
| ග්‍රීස් නිපල් 01 ක් ගැසීමට | | 60.00 | 50.00 | 60.00 | 60.00 |
| බ්‍රයිටෝල් ලීටර 01 | | 40.00 | 25.00 | 25.00 | 40.00 |
| ඩී.එස්. ඔයිල් ලීටර් 01ක මිල | | 704.00 | 660.00 | 704.00 | 650.00 |
| යට තෙල් ගැසීමට ඔයිල් ලීටර් 01 | | 400.00 | 480.00 | 430.00 | 400.00 |
| ලාම්පුතෙල් ලීටර 01 | | 100.00 | 80.00 | 70.00 | 90.00 |
| ගියර් ඔයිල් ලීටර 01 ක මිල | | 915.00 | 1040.00 | 1202.00 | 900.00 |
| බැටරි වතුර බෝතල් 01 ක මිල | | 70.00 | 60.00 | 60.00 | 60.00 |
| බ්‍රේක් ඔයිල් මිලි ලීටර 250 | | 350.00 | 370.00 | 375.00 | 400.00 |
| **ඩබල් කැබ් රථ** | | | | | |
| සේවා කිරීමට | | 2500.00 | 1350.00 | 1650.00 | 1900.00 |
| ඩීසල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 3950.00 | 4050.00 | 1500.00 | 1780.00 |
| ඔයිල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 2600.00 | 2620.00 | 1100.00 | 2750.00 |
| එයාර් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 5680.00 | 3450.00 | 1800.00 | 5830.00 |
| **කෘ කැබ් රථ** | | | | | |
| සේවා කිරීමට | | 2800.00 | 1350.00 | 1950.00 | 2100.00 |
| ඩීසල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 3650.00 | 1175.00 | 2100.00 | 1380.00 |
| ඔයිල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 1450.00 | 1100.00 | 1500.00 | 1460.00 |
| එයාර් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 3800.00 | 2100.00 | 1800.00 | 3400.00 |
| **කියුබ් 03 ටිපර් රථය සහ වූක් බවුසර්** | | | | | |
| සේවා කිරීමට | | 3800.00 | 1650.00 | 2500.00 | 2800.00 |
| ඩීසල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 3600.00 | 1675.00 | 1800.00 | 1930.00 |
| ඔයිල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 1200.00 | 1375.00 | 1500.00 | |
| එයාර් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 3500.00 | 2950.00 | 2750.00 | |
| **හාඩිමෙක් රථය** | | | | | |
| සේවා කිරීමට | | 2500.00 | 1350.00 | 1100.00 | |
| ඩීසල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 800.00 | 550.00 | 600.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඔයිල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 1050.00 | 650.00 | 600.00 | |
| එයාර් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 2600.00 | 950.00 | | |
| **ට්‍රැක්ටර් (ටේලරය සහිතව)** | | | | | |
| සේවා කිරීමට | | 2800.00 | 1500.00 | 1950.00 | 1850.00 |
| ඩීසල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 650.00 | 850.00 | 950.00 | 1000.00 |
| ඔයිල් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 1450.00 | 950.00 | 750.00 | 1600.00 |
| එයාර් ෆිල්ටර් 01 ක මිල | වී.අයි.සී | 2950.00 | 1100.00 | | 2800.00 |

**වාහන සේවා කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල වෙතින් වාහන සේවා කටයුතු සිදු කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල වෙතින් වාහන සේවා කටයුතු සිදු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

වාහන සේවා කිරීම සම්බන්ධව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විමසා සිටියේ 252- 6478 කැබ් රථය මේ ළඟදි දවසක උඩුගමින් සේවා කල බව ප්‍රකාශ කරන ලදී. එයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා කියා සිටියේ එම කැබ් රථය හදිසි අවශ්‍යතාවය මත උඩුගමින් සේවා කිරීම් කල බවත්, ඊට පසුව සේවා කිරීම සඳහා මිළ ගණන් කැඳවූ බවත්ය. මේ සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාද අදහස් දක්වන ලදී.

**(ඊ)කාරක සභා වාර්තා**

❖ 2019.04.05 දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

**ලැබීම් ගෙවීම් වාර්තා සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම**

**11.වෙනත් කරුණු :-**

<u>ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා</u>

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ඒ වගේම අපේ නවක ලේකම්තුමිය අපි මේ අවස්ථාවේ පිළිගනු ලබනවා. ලබන්නා වූ අලුත් අවුරුද්ද සියලු දෙනාටම සෞභාග්‍යමත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, මෙම න්‍යාය පත්‍රය සෑදීමේදී රීති වලට අනුකූලව තමයි

සකස් කරලා තියෙන්නේ. ඒකෙදි අපේ සමන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව හරි. ඒක තේරුම් ගන්න ඕන. මෙතුමා තේරුම් කරලා දුන්නේ නැති නිසා තමයි කට්ටියට ප්‍රශ්නයක් ආවෙ. ඒ ප්‍රශ්නේ තියෙන්නේ මෙන්න මෙහෙමයි. යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ සෑම දැන්වීමක්ම ලිඛිත විය යුතු අතර, එය දැන්වීම්කරණ ප්‍රාදේශීය සභා සභිකයා විසින් එය අත්සන් කර තිබිය යුතුය. සෙනසුරාදා, ඉරිදා රජයේ නිවාඩු දින හැර ප්‍රාදේශීය සභාවේ රැස්වීමට දින 7කට කලින් එම දැන්වීම ලේකම් භාරයේ තැබුවහොත් මිස, ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුතුයි. ඒ වගේම ඊළඟ කාරණය තියෙනවා. 08 කල්තබා දැනුම් දෙනු නොලැබූ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට කලින් එය ලියා යෝජක විසින් අත්සන් කොට, ලේකම්වරයා වෙත භාරදිය යුතුය. ඒක තමයි සමන් මන්ත්‍රීතුමාගේ යෝජනාව. ඒ වගේම අංක 09 යටතේ කියලා තියෙනවා. ආපහු යෝජනාවක් රැස්වීමට ඉදිරිපත් කොට, ස්ථිර කරනු ලැබූ ඒ පිළිබඳ විවාදය අවසන් වූ පසු සභාපතිවරයා විසින් ඒ පිළිබඳව ඡන්දයක් විමසිය යුතුය. අන්න ඒ ආකාරයට තමයි රීති වල තියෙන්නේ. අපට තිබුණ කාරණය තමයි දැන් මාස දෙකකට කලින් අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය ගෙනා යෝජනා ටික එතැනට වැටුණෙ නැහැ. ඒ වගේම කටුපොල් සම්බන්ධව යෝජනාවක් ගෙනාවා. ඔබතුමාලා යනවා කිව්වා. ඒ සම්බන්ධව මේ සභාවේ අපි දැනුවත් වුණේ නැහැ. ඒ වගේම ඔබතුමා කිව්වා තල්ගස්වල තියෙන අනවසර මාළු ලැලි, කඩ ඉවත් කරන්න PHI මහත්තයා සමග යනවයි කියලා. ඒ ගියාද කියලා අපි දැනගන්න කැමතියි. ඒ පිළිබඳ දැනුවත් කරන ලෙස අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින අතර, තවත් දේවල් කතා කරන්න තිබුණත්, අපේ අනිත් මන්ත්‍රීවරුන්ට අවස්ථාව දී මම නිහඬ වෙනවා. ස්තුතියි.

❖ **ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

අපි ඊයෙ කටු පොල් කර්මාන්ත ශාලාව නිරීක්ෂණයට ගියා. ඩොක්ටර්ස්ලා, PHI මහත්වරු ඊයෙ සංකේත වැඩ වර්ජනයක් ප්‍රාදේශීය ලේකම්තුමිය, ග්‍රාම නිලධාරී, පරිසර නිලධාරීන් සහ මන්ත්‍රීවරුන් දෙපළක් වන ධනංජය මන්ත්‍රීතුමා සහ තරංග මන්ත්‍රීතුමා මේ සඳහා සම්බන්ධ වුණා. මේ වෙනකොට පිරිසිදු කරන මැෂින් filter හයි කරලා, ඒ කටයුත්ත දැන් පරීක්ෂණ මට්ටමේ යන්නේ. මේ සතියෙ පරිසර අධිකාරියෙන් ඇවිත් පරීක්ෂණය කරලා පිටට යවන වතුර සුදුසුද කියලා තීරණය කරනවා. මේ වන විට එතන යම් දෙයක් කරල තියෙනවා. නමුත් එය 100% ක්ම සාර්ථක වේද කියලා අපි හිතන්නේ නැහැ. නමුත් අපි එයින් සෑහීමකට පත්වුණේ නැහැ. අපේ වෙළඳ බලපත්‍රය දීමට නොහැකියි. ඒ වගේම එයාලා පරිසර බලපත්‍රය ලබා ගන්න කටයුතු කරනවා කියලා කිව්වා. එනමුත් කටු පොල් වගා කිරීමේ කටයුතු තවමත් සිදු වෙනවා කියලා අපට ආරංචි එනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය, අපේ නිලධාරී ශාන්ත මහත්මා, මාධ්‍යවේදී මහත්මා ඇතුළු සෑම දෙනාගෙන්ම අවසරයි. ඒ වගේම ලබන්නාවූ සිංහල දෙමළ අලුත් අවුරුද්ද සියලුදෙනාට සුභම සුභ අලුත් අවුරුද්දක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම පසුගිය කාලයේ අපි පත්වුණාට පස්සේ පරණතානායම්ගොඩ ඉඩම් වෙන්දේසියක් තිබුණා. මා දන්නා තරමින්, මම අහල තියෙනවා. ඉඩම් කැබලි පහකට වැඩි නම් පොදු කටයුතු සඳහා යම්කිසි කොටසක් වෙන් කරන්න ඕන කියලා. එම ස්ථානයේ ඉඩම් කැබලි පහලොවක් වෙන්දේසි වෙලා තියෙනවා. පොදු කටයුතු සඳහා වෙන් වුණ ඉඩම් කැබැල්ල, වෙන් කරලා තියෙනවද කියලා. ඒ ගැන සොයා බලා අපට අවශ්‍ය විදිහට පවර ගන්න කියන එක මම ඉල්ලා සිටිනවා. එම ස්ථානයේ ඉඩමක් වෙන් වෙලා තිබිලා, නැවත ඒක විකුණලයි කියලා මම දැනුවත් වුනා. ඒ නිසා නැවත ඒ ගැන සොයා බලන්න කියලා මම සිහිපත් කරනවා. ඒ වගේම අපි වසරක් ගෙවිලා අද වෙනකොට ඉතාමත් සාර්ථක ගමනක් ආව බව පේනවා. ඉදිරියටත් මෙවැනි ම සාර්ථක වසරක් නිමකිරීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරමින්, සියලුම දෙනාට තෙරුවන් සරණ ප්‍රර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන්, ලේකම්තුමිය, ශාන්ත මහත්මා, මාධ්‍යවේදී මහත්මා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. බොහෝ කාලයක සිට මාගේ ඉල්ලීමක් ගරු සභාපතිතුමා විසින් මේ දින දෙක, තුන තුල ඉටුකරනවා. පවතින අයහපත් කාලගුණික තත්ත්වය, නියගය නිසා වළකුඹුර පොදු ළිඳ මේ දින දෙක තුළදී පිරිසිදු කිරීමේ කටයුත්ත සිද්ධ කරනවා. ඒ පිළිබඳව මම මේ අවස්ථාවේදී ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ඉදිරියේදී ලබන්නාවූ සිංහල දමිල අලුත් අවුරුද්ද සියලුම දෙනාට සතුට, සෞභාග්‍ය පිරි සුභම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අපට අද හොඳ තේ පැන් සංග්‍රහයක් කලා. ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙමින් සියලුම දෙනාට තෙරුවන් සරණ ප්‍රර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් ලේකම්තුමියගෙන් නිලධාරිතුමාගෙන්ද අවසරයි. මා ප්‍රථමයෙන්ම මාගේ නිවසේ පැවති මාගේ බාප්පාගෙ මළගම වෙනුවෙන් සහභාගීවූ සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට මගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා. ඒ වගේම කුරුපනාව තේ කර්මාන්ත ශාලාව පාරේ විදුලිය ගැන මම වර්ෂයකට අධික කාලයක් විතර කතා කළා. ඒ පාරේ විදුලිය සම්පූර්ණ සකස් කරලා තිබුණා. ඒ ගැන සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ අධික නියං කාලය බැවින් මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. ගෝනදෙනිය ඇල්ලවත්ත කඩේ අසල තියෙන පොදු නාන ළිඳ සුද්ද පවිත්‍ර කරලා දෙන්න කියලා. ඒ වගේම පරණතානායම්ගොඩ රක්ෂණ ගම්මානයෙ තියෙන පොදු නාන ළිඳ සුද්ද කර දෙනවා නම් හොඳයි. මේ පායන කාලේ මිනිස්සුන්ට වතුර නැති අවස්ථා තියෙනවා. ඒ නිසා එම ළිං දෙක ගැනම අවධානය යොමු කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම අපට අද සභාවේ වැඩකටයුතු පොඩ්ඩක් ප්‍රමාද වුණත්, අද ඉදිරිපත් වුන යම් යම් යෝජනාවන් අපට ලැබුනු න්‍යාය පත්‍රයේ තිබුණේ නැති ඒවා. අද ඉදිරිපත් වුණා. එහෙම කරල තියෙන්නෙ රීති යටතේ. මෙතෙක් කල් කරගෙන ආවේ අපේ සභා පනත යටතේ. ඒ නිසා දින හතකට කලින් යෝජනා ඉදිරිපත් කරන්න තමයි තිබුණේ. ඉතින් මම මීට කලින් යෝජනා ඉදිරිපත් කර තිබුණා. දින හතක් වෙලා තිබුණත්, සභා වාර්තාව සම්පූර්ණ කරලා ඉවරයි කියලා යෝජනා දැම්මේ නැහැ. මීට මාස දෙකකට උඩදි මම කිව්වා නැවත යෝජනාව ගැන. ඊට පස්සේ ලියුමක් ඉදිරිපත් කළා ඊළඟ මාසයට දාන්න කියලා. ඉතින් ඒ මාසේ මම අපේ හිටපු ලේකම්තුමියගේ ඇහුවම, ලේකම්තුමිය කිව්වේ , යෝජනාව දාන්න අවශ්‍ය නැහැ කියලා සභාපතිතුමා කිව්වා කියලා. අද උදේ ලැබුණ යෝජනාව දැක්කම මම ඇහුවා ඇයි එහෙම වුණේ කියලා එතකොට දැනගන්න ලැබුණා. අලුත් විමර්ශන නිලධාරියෙක් ඇවිත් රීති යටතේ න්‍යාය පත්‍රය හදන්න කියලා තියෙනවා. ඒ නිසාලු එහෙම වුණේ. ඒ නිසා තමයි අද ප්‍රහේලිකාවක් වුනේ. ඉතින් ඒ ගැන මට පැහැදිලි වුණා. ඒ වගේම කියන්න විශේෂම දේවල් තවත් නැහැ. ලබන්නාවූ අලුත් අවුරුද්ද ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් සියළුම නිළධාරිතුමන්ලාට, නිළධාරිතුමියන්ලා ට සුභම සුභ අලුත් අවුරුද්දක් වේවායි, ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

ගරු සභාපතිතුමා මට බැහැර වීමට අවසර ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මම මීට කලිනුත් මතක් කළා. උඩුගම නගරය පිළිබඳව. උඩුගම නගරය දැන් බොහොම අපිරිසිදු තත්වයක තමයි තියෙන්නේ. නමුත් එයට ක්‍රියාමාර්ගයක් අරගෙන

නැහැ. උඩුගම බාරහන්දියේ තියෙන තාප්පයේ පෝස්ටර් අලවලා, ඉතාම අවලස්සන තත්ත්වයක් තියෙන්නෙ. ඒ සම්බන්ධව පිරිසිදු කිරීම් කටයුතු කරන්න පියවර ගන්න. ඒ වගේම නගරයේ වෙනදා සිදුවුන පිරිසිදුකිරීම් දැන් සිද්ධ වෙන්නේ නැහැ. ගිහිල්ලා කුණු ටික අරගෙන එන එක විතරයි සිද්ධ වෙන්නේ. නමුත් ඔබතුමා හැමදාම කියනවා. මීට පෙර හිටපු සභාපතිවරුන් කරල නැහැ කියලා. නමුත් මීට පෙර හිටපු සභාපති වරු සියලු දෙනාම ඒ කටයුත්ත සිදු කළා. ඒ නිසා ඒ කටයුතු පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම කැටගොඩ බස් නැවතුම්පොළ සම්බන්ධව කතා කරන විට, එහි තියෙන වැසිකිළි පද්ධතිය අපට අයිති දෙයක් නෙවෙයි කියලා දැනගන්න ලැබුණා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට කතා කළාම මේ පිරිසිදු කිරීම් කටයුතු සිදු කරන්න යම්කිසි ගෙවීමක් කරන්න සභාවේ මැදිහත්වීම් ඉල්ලා සිටියා. සභාව මගින් දැනුම් දීලා ඒ සඳහා යම් මුදලක් යනවනම්, සභාවට ඒ ගෙවීම් සිදු කරන්නම් කියන එක ගැන දැනුවත් කළා. ඒ නිසා කැටගොඩ බස් නැවතුම් පොළේ තියෙන වැසිකිළි පද්ධතිය මුදල් ලබාගෙන පිරිසිදු කරලා දෙන්න කියල මම ඉල්ලා සිටිනවා. ඒ වගේම විශේෂයෙන් කටු පොල් කර්මාන්ත ශාලාව පිළිබඳ ගැටලුව කතා කරන්න ඕන. මධ්‍යම පරිසර අධිකාරියෙන් නිකුත් කරන පරිසර ආරක්ෂණ බලපත්‍රය 2017 වර්ෂයේ ඉඳලා අරගෙන තිබුණෙ නැහැ. ඒ ආරක්ෂණ බලපත්‍ර නැතිව තමයි මේ දක්වා ක්‍රියාත්මක වුණේ. ඒ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගන්න කම්, කටු පොල් කර්මාන්ත ශාලාව නවතා දමන්න හෝ යම්කිසි නීතිමය ක්‍රියාමාර්ගයකට යන්න කියලා සභාවේ ඒකමතිකව තීරණය වුණා. නමුත් සභාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමිය අපේ හිටපු විපක්ෂ නායක තරංග සුදර්ශන මහතා ඇතුළු අපි සියලු දෙනා එහි ගියාම, අපි දැක්කා එහි යම්කිසි වැඩ කොටසක් සිද්ධවෙලා තියෙනවා. ඒ ගැන අපි සෑහීමකට පත්විය යුතු නැහැ. දළ වශයෙන් ලක්ෂ හැත්තෑ පහක විතර යුනිට් එකක් ප්‍රතිසංස්කරණය කිරීමක් සිද්ධවෙලා තියෙනවා. නමුත් තාවකාලික පිළියමක් විතරයි. කටු පොල් කර්මාන්ත ශාලාව හා ඒ නිලධාරීන් සම්බන්ධව මට තොරතුරු ලැබෙනවා. මම ඒ පිළිබඳව සොයා බලනවා. මේ වෙනකොට ඒගොල්ලො පොඩි ටෙස්ට් එකක් වශයෙන් ජලය සම්පූර්ණයෙන්ම පිරිසිදු ජලය විදියට එළියට මුදා හරින්න ක්‍රමවේදයක් සකස් කරලා තියෙනවා. මේ සඳහා මිලියන 18 ක් වැය වන බව සඳහන් කළා. අපේ අරමුණ වෙන්න ඕන මේ තාවකාලික පැලැස්තර විසඳුම නෙමෙයි. අන්න ඒ වගේ පිරිසුදු ජලය මුදාහරින තැනට කටු පොල් කර්මාන්තශාලාවේ ක්‍රියාවලිය සකස් කිරීමයි. දිනකට ජලය ලීටර් ලක්ෂ දෙකක් විතර මුදා හරිනවා. ඊයෙ අපි දැක්කා. ජලය ලීටර් ලක්ෂ 2ට කොහොමවත් ප්‍රමානවත් නැහැ. මොකද ඔය පද්ධතිය හරහා වතුර එළියට යන්නත් පුළුවන්, නිකන් යන්නත් පුලුවන්. ඒ පිළිබඳව අවධානය යොමු කරනවා. ඒ වගේම කටුපොල් වගා කිරීම දැන් දිගට හරහට සිදුවෙනවා. වතු සමාගමට හිමි ඉඩම් ප්‍රමාණයෙන් 20% ක උපරිමයකට යටත්ව කියලා තිබුනත්, දැන් නාගොඩ ප්‍රාදේශීය සභාවේ තියෙන වතු වල 100% ක්ම කටුපොල් වගාව ව්‍යාප්ත වෙලා තියෙනවා. ඉතින් මේක විශාල ගැටලුවක්. මේ පිළිබඳව විශේෂ අවධානය යොමුකර ප්‍රාදේශීය සභාව හරහා ආණ්ඩුකාරතුමාට ලියුමක් යවන්න කියලා මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. මොකද ප්‍රාදේශීය ලේකම්තුමිය සඳහන් කළේ, ආණ්ඩුකාරතුමා හරහා කැබිනට් තීරණයක් අරගෙන ගෙනත් තියෙන කටු පොල් බීජ පමණක් සිටුවීමට අවසර ලබාදීමේ හැකියාව තියෙනවා. ඉතින් මේ කරුණු ගැන සැලකිලිමත් වෙලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. අපේ ප්‍රාදේශීය සභාව හැල්ලුවට ලක් කරලා මේ වතු සමාගම් මේ දේවල් කරන්නේ. ඒ පිළිබඳ කනගාටුව ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රීනී කේ ඒ සී දිල්රුක්ෂි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම මුලින්ම අපේ නව ලේකම්තුමිය ගෞරවයෙන් පිළිගනු ලබනවා. සභාපතිතුමනි අපි අවුරුද්දක් තිස්සේ කතා කරන මාපලගම, ඇල්ලෙගෙවත්ත නිවස අසල වතුරෙන් යටවීම ගැන, වඳුරඹ උපකාර්යාලයේ ආණ්ඩුකාරතුමා කැඳවූ

රැස්වීමේදී අපේ ගරු නන්දන මන්ත්‍රීතුමා කතා කළා. ඊට පස්සේ ආණ්ඩුකාරතුමා ලිඛිතව ඉල්ලුවා. ඒක මම ආණ්ඩුකාරතුමාට යොමු කළා. ආණ්ඩුකාරතුමා එයට පිළිතුරු ලිපියක් වශයෙන්, ඒ ලිපිය මාර්ග සංවර්ධන අධිකාරියට යොමුකර, අවශ්‍ය පියවර ගන්න කියලා ඉල්ලීම් කරලා තියෙනවා. එනිසා ඒ පිළිබඳව සභාවේ සියලු දෙනාගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනවා. ඒ වගේම ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද ගරු සභාපතිතුමා ඇතුළු සියලුම දෙනාට සුබ අලුත් අවුරුද්දක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අපේ විලේගේ මන්ත්‍රීතුමා කටු පොල් ගැන කතා කළා. එකේ අර හදන මැෂින් එකේ වතුර යන්නෙ ඩවුන් පයිප්පයක ප්‍රමාණයකින්. ඒ බව අපේ මන්ත්‍රීවරු දැනගන්න ඕන. ඔය වගේ කර්මාන්ත ශාලාවක තාක්ෂණය නොදන්න නිසා අපි මන්ත්‍රීවරු විහිළුවට ගන්නවා ඇති. මොකද ඔය මැෂින් එකෙන් කටු පොල් කර්මාන්තශාලාවේ ඔක්කොම සුද්ද කරළා පිරිපහදු කරළා ජලයට දානවයි කියලා කියන්න බැහැ. අනිත් එක මේ දවස් වල පැවිල්ල. මේ දවස්වල ඇලේ වැටි බැඳලා, ජලය එකතු කරගෙන ඉන්නවා. ඒ වගේම මේ දවස් වල ජලයට අපද්‍රව්‍ය එකතු කරන්න බැරි තත්වයක් තියෙනවා. ඒ වගේම අලේ වැටි ගහන්න අයිතියක් එයාලට නැහැ. වහින කාලෙට වතුරත් එක්ක අපද්‍රව්‍ය පිට කරනවා. අපද්‍රව්‍ය වලින් ¾ක්ම මාමනදොල ඇළට මුදා හරිනවා. අපි මේවා දන්නේ නැහැ කියලා එයාල හිතනවා ඇති. ඒ වගේම කටු පොල් කර්මාන්තශාලාවට වෙළඳ බලපත්‍රය නොදී ඉන්න අපට පුළුවන්. එමගින් රුපියල් 3000 ක පමණ ආදායමක් තමයි අපට එන්නේ. මම හිතන්නේ සභාවේ යෝජනා ස්ථිර කර ගත්තොත් මීට වඩා ලොකු මුදලක් අයකර ගන්න පුළුවන් ඇති. ඒ වගේම මධ්‍යම පරිසර අධිකාරිය ගන්නා ක්‍රියාමාර්ග ගැන සෑහීමට පත්වෙන්න බැහැ. ඒ ගැන අපට බොහෝ සැක සහිතයි. සභාපතිතුමනි, ඒ අය කටු පොල් කර්මාන්ත ශාලාවත් එක්ක බොහොම ළඟින් සම්බන්ධතා පවත්වාගෙන යනවා. එයාලට ඕන දේ තමයි මධ්‍යම පරිසර අධිකාරිය මගින් සිදු කරන්නේ. සමහරවිට මොනවහරි සංතෝසම් ලැබෙනවා ඇති. ඒ නිසා ඒ අය දෙන පරිසර බලපත්‍රය අපට පිළිගන්න බැහැ. අපි මන්ත්‍රීවරු මේ ගරු සභාවේ මේ කර්මාන්ත ශාලාව සම්පූර්ණයෙන්ම තහනම් කරන්න යෝජනා කළා. මම අදටත් කියන්නේ හොරාගෙ අම්මගෙන් පේන අහනවා වගේ තමයි. අපි එතනට ගිහිල්ලා බොරුවට කතා කරනවා. අපි මන්ත්‍රීතුමන්ලා විදිහට හැල්ලුවට ලක් වෙනවා විතරයි. එයාලගේ කටයුතු ඒ විදිහටම කරගෙන යනවා. ඒ වගේම කටුපොල් වගාව දිගටම කරගෙන යනවා. පරිසර හානියත් සිදු වෙනවා. මේ පිළිබඳ දීර්ඝ වශයෙන් කථා කළාට, සමහර වෙලාවට පත්තර වලට යන්නෙත් නැහැ. ක්‍රියාත්මක වෙන්නෙත් නැහැ. ඒ පිළිබඳව නැවත ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මතක් කරමින්, සියලුම දෙනාට සුභ අනාගතයක්, සුබ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නතර වෙනවා. ඔබ සැමට ස්තූතියි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රණවිරු ගම්මාන තියෙන්නේ එකයි. ඒ මාපලගම රණවිරු ගම්මානයේ පවුල් 60ක් පමණ ඉන්නවා. ඔවුන් ආබාධිත වෙලා ඉන්නේ අපේ රට බේරගන්න යුද්ධ කරන්න ගිහිල්ලා. අපට නොපෙනුනාට ගොඩක් අය ප්ලාස්ටික් වලින්, ලී වලින් සකස් කරන ලද ද්‍රව්‍ය මත තමයි ඔවුන් ඇවිදින්නේ. අදත් සභාපතිතුමා හමුවෙන්න පැමිණි මහතාට පුටුවක ඉඳගන්න බැහැ. ඒ නිසා තමයි අර හිටගෙන හිටියෙ. මේ මිනිස්සුන්ගේ ඉල්ලීමක් තියෙනවා. මාර්ගය හදලා දෙන්න එහෙම නැත්නම් විදුලිය ලබා දෙන්න කියලා. සභාවට මුදල් නැති බැවින් මාර්ගය සංවර්ධනය කරන්න බැහැ. ඒ නිසා විදුලිය ලබා දීමක් සිදු

කරන්න. වීදි ලාම්පු පහළොවක් විතර අඩුයි. අපිත් සභාව පටන් ගන්න අවස්ථාවේදී මුලින්ම ආගම සිහි කළා. ඊට පස්සේ රණවිරුවන් සිහිපත් කරනවා. ඒ නිසා විශේෂත්වයක් දක්වලා, ඔවුන්ට අවුරුද්දට කලින් ඉතා ඉක්මනින් මේ වීදි ලාම්පු 15 පමණ ලබාදෙන්න කටයුතු කරන්න.

ඒ වගේම මාපලගම වෙළඳ සංකීර්ණ කොරිඩෝ්වෙ විදුලි බිල මේ සැරෙත් තුන්දාස් ගානක් තියෙනවා. මේක පාවිච්චි කරන්නේ කවුද? ඒ වගේම විලේගේ මන්ත්‍රීතුමා කිව්වා වගේ, තල්ගස්වල කොටසක් තියෙනවා. එතන ඉටිකොළවලින් පිරිලා. ත්‍රීවිල් රථ සංගමය විසින් රථ නවත්වන ස්ථානය. ඒ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු කරන්න පුලුවන්ද? බැරිද? කියලා තමයි දැනගන්න ඕන. ඒ කොටසේ කඩ ඇත්තෙත් නැහැ. පරණ ෂෙඩ් එකට හැරෙන පාර ලඟ ඉඳලා මෙහාට ඉටිකොළ ලොරියක් විතර තියෙනවා. ඒවා සුද්ධ කරන්න ඕන සභාවෙන්ද? එයාලා කියන විදියට හිටපු සභාපතිතුමා විලේගේ මහත්තයා ඒ කාලේ එම කටයුතු සිදු කලාලු. ඒ කාලේ මම සභාවේ හිටියේ නැහැ. හිටපු අපේ අනිත් මන්ත්‍රීවරු දන්නවා ඇති. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමුකරලා, ඉටිකොළ ටික එකතු කරගෙන යන්න. ඒ වගේම රණවිරු ගම්මානයට විදුලිය දෙන්න එක දවසක්වත් ගිහිල්ලා නැහැ. එමෙන්ම මාපලගම අර වතුර බහින්නේ නැති ආසිරි ටයර් සර්විස් එක අසළ, අපේ තාක්ෂණ නිලධාරී මහත්මයත් එක්ක ගිහිල්ලා බැලුවා සාමාන්‍යයෙන් පැය 4කින් 5කින් ඒක කරන්න පුළුවන් කියලා එතුමන් නිර්දේශ කලා. දැන් මෙතන තියෙන වාසිය තමයි ආසිරි සර්විස් එකේ අය කැමතියි. පොඩි ස්කවේටරයක් දාලා ශුද්ධ කරලා දෙන්න. ඒ මුදල තාක්ෂණ නිලධාරී මහත්තයා නිර්දේශ කලාට පස්සේ සභාවෙන් ඒ මුදල අරන් දුන්නට කමක් නැහැ. එයාලා ඒ වැඩේ කරනවා නම් සභාවෙන් මුදල් ගෙවන්න ඕනෙ නැහැ. එහෙම නම් සියලු දෙනාට සුබ අලුත් අවුරුද්දක් වේවා කියලා මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන්, නව ලේකම්තුමියගෙන්, මාධ්‍යවේදීතුමන්ගෙන් අවසරයි. මම මේ වෙලාවේ පුංචි සිහිපත් කිරීමක් කරන්න සුදානම් වෙන්නේ. අපි සිහිපත් කිරීම් ගොඩක් කලා. සමහර සිහිපත් කිරීම් වලදී මීට පෙර මම ඉල්ලීමක් කරා. ඉහළ ආයතනවලින් සිදු විය යුතු කටයුතු පිළිබඳ සභාවට යෝජනාවක් ඉදිරිපත් කළාම, සභාපතිතුමා හැටියට ඔබතුමා ඒ ආයතන වලට ඒක යොමුකරලා, ඒ පිළිබඳ දැනුවත් කරලා, අපටත් ඒ පිළිබඳ පිටපතක් එවන්න කියලා. මොකද අපේ ප්‍රදේශවල ඉන්න ජනතාව හිතන්නේ යම් ප්‍රශ්නයක් වුනහම ඒ පිළිබඳව පළමුවෙන්ම අපට තමයි කියන්නෙ. ඒ වෙලාවෙදි අපට නීත්‍යානුකූලවම මේ පිළිබඳව කතා කරන්න පුළුවන් තැන මෙතන. නමුත් මේ වන තෙක් ඒ කාරණය ඉටුවෙලා නැහැ. ඒ නිසා ඒ කටයුතු කරන්න කියලා මම නැවත වරක් ඉල්ලා සිටිනවා.

පසුගිය වැසි සමයේ අපේ ප්‍රදේශවල පාරවල්වල කණ්ඩි කඩාගෙන ගිහින් බරපතල ගැටලු ඇතිවුණා. උඩුගම බංගම පාරේ කණ්ඩියක් කඩා ගෙන ඇවිල්ලා රිය අනතුරු සිදුවිය හැකි ඉතාම භයානක ස්ථානයක් තියෙනවා. ඉතින් මම ඉල්ලීම් කරන්නේ සභාවෙන් මේවා කරන්න ක්‍රමවේදයක් නැත්නම්, ඒ මාර්ගය අයිති දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට. උඩුගම ආනන්ද විජය විද්‍යාලය අසල තමයි භයානක විදිහට මේ තත්වය ඇතිවෙලා තියෙන්නේ. එතන වාහන දෙකක් අයින් කරගන්න බැහැ. ලොකු වංගුවක් තියෙනවා. ඉතින් මම ඉල්ලීමක් කරනවා. අපට සභාවෙන් මේ පිළිබඳව කටයුතු කරන්න අපහසුතාවය තියෙනවනම්, මාර්ග සංවර්ධන අධිකාරියට සභාවෙන් මේ පිළිබඳව දැනුම් දීමක් කරලා අවශ්‍ය කටයුතු සිදුකරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කළොත්, අපිටත් ඒ සඳහා මැදිහත් වෙලා, ඒ වෙනුවෙන් කතා කරන්න අපට හැකියාවක් තියෙනවා. මීට කලිනුත් අපි කතා කරලා ඒ මාර්ගයේම බයිසිකලයක්වත් යන්න බැරි ස්ථානයක් සකස් කරගෙන තියෙනවා. ඒ නිසා ඒ ලිපිය යොමුකර ඒ කටයුතු ඉටුකර දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම පළවෙනි සභාවාරයේ ඉඳලම කුණු එකතු කිරීම පිළිබඳව කතා කළා. නමුත් උඩුගම දකුණු ප්‍රදේශයට ඒ කාරණය ඉටු වෙලා නැහැ. මේ අවස්ථාවේදී වීථි පහන් පිළිබඳව කතා කරලා වැඩක් නැහැ කියලා හිතෙනවා. මොකද විදුලි අර්බුදයක් තියෙන නිසා. මගේ කොට්ඨාශයේ අලුත්වත්ත වුනාට භූගෝලීය වශයෙන් වෙන් කිරීමක් කරලා තියෙන්නෙ. ඒකෙ බරපතලම ගැටලුව තියෙන්නේ ග්‍රාම නිලධාරී වසම් හතරක් සහ විශාල මාර්ග ප්‍රමාණයක් තියෙන කොට්ඨාශයක්. අපේ හිටපු සභාපති අජිත් මන්ත්‍රීතුමා දන්නවා. උඩුගම නැගෙනහිර ප්‍රදේශයේ ඒ සීමාවේ ඉඳලා කෙළවරට යනකම්ම එකම වීථි පහනක්වත් නැහැ. මේ වීථි පහන් ලබාදීමේදී ඔබතුමා කියන විදියට ගැටලුවකුත් තියෙනවා. දෙන්න පුළුවන් කමකුත් නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ගම්වාසීන් විදියට ඒ මිනිසුන් වීථි පහන් පිළිබඳ ඔබතුමාගෙන් ඉල්ලීම් කළොත්, ඒ පිළිබඳ ඇත්ත තත්වය සභාවට කරගන්න බැරි තත්වයක් තියෙන්නෙ කියන එක පිළිබඳ අවබෝධයක් ලබා දුන්නොත් වඩාත් හොඳයි කියලයි මම හිතන්නෙ. මොකද නැත්නම් ඒ අය හිතන්නේ අපට හැකියාව තිබිලත් අපි මේ කටයුතුවලට මැදිහත් වෙන්නේ නැහැ කියලා. ඒ වගේම අලුත්වත්ත ප්‍රදේශයේ අලුත්වත්ත හංදියේ ඉඳලා උඩුගම 18 ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගය උඩුගම ගාල්ල ප්‍රධාන මාර්ගයේ වීථි පහන් පිළිබඳව නිතර නිතර ප්‍රදේශවාසීන් අප සමඟ සාකච්ඡා කරනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන ගමන්, සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වෙද්දී, අපේ සිත් සතන් තුළ තිබෙන සිතුවිලි පවා වෙනස්වෙලා ඉදිරි වර්ෂයේදී මීට වඩා හොඳ, මීට වඩා වැඩි කාර්යභාරයක් ඉටු කිරීමට අපි සියලු දෙනාටම ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන්ද, නව ලේකම්තුමිය ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. එමෙන්ම මම ගරු සභාපතිතුමාට ස්තුතිය පුදකරන්න ඕන. කලකට පස්සේ වීථි ලාම්පු ටික ටිකක් දුරට නිම කරගන්න හැකියාව ලැබුණා. ඔබතුමාගෙන් පුංචි ඉල්ලීමක් කරන්න ඕන. වතු සමාගම් විසින් අපට පුංචි ලොසින්ජරයක් වගේ දෙයක් දීලා තියෙනවා. මේ කටුපොල් වගාව පිළිබඳව සාකච්ඡා කරන්න ඕන. අපි කටු පොල් කර්මාන්ත ශාලාවට ගිහින් බැලුවට පස්සේ මෙහෙම කරන්නම්, අරෙහෙම කරන්නම් කියලා ඔබතුමත් රවට්ටලා උපක්‍රමශීලීව කටයුතු කරනවා. මොකද අද උදේ බලනකොටත් අපේ හෝමදොල වසමෙ කටු පොල් ගස් දෙසීයක් විතර ඉන්දනවා. එතනදි කතා කරන්න බැලුවම තහනම් කරල නැති කතාවක් ආවා. ඒ නිසා කතා කරලා වැඩකුත් නැහැ. පොලිසිය කිව්වත් වැඩක් නැහැ. සභාපතිතුමාට කිව්වත් කිසි දෙයක් කරන්න බැරි තත්ත්වයක් තමයි තියෙන්නේ. ඒ නිසා මම කථා කලේ නැහැ. අපට මිනිස්සු මේ ගැන කිව්වම අපිත් අසරණ වෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, හෝමදොල ප්‍රධාන මාර්ගයේ පසුගිය කාලේ පාර කාපට් කරල අපට හදන්න උවමනාම තැනක් හැදුවේ නැහැ. තරංග මන්ත්‍රීතුමා දන්නවා. අද එතැන ස්කූල් බස් දෙකක් වැඩ කරනවා. ළමයි තුන් හාරසීයක් එහා මෙහා යනවා. වාහනයක් ආවොත් උඩට යන්න බැහැ. වාහනේ දාලා තමයි යන්න ඕන. ඒ නිසා ඔබතුමාට කරන්න පුළුවන් දෙයක් තියෙනවනම්, ඉහලින් හරි මොකක් හෝ දැනුවත් කිරීමක් කරලා එතන හදා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. පසුගිය දවස්වලත් අපි අපේ සල්ලි දාලා ශ්‍රමදානයක් පැවැත්තුවා. ඒ වගේම අපේ ජොෂ්ඨ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන්නේ ඔබතුමාලට තියෙන බලය මත, පක්ෂ භේදයක් බලන්නේ නැතුව අපේ පාර ගැන ඉතාමත් විමසිලිමත් වෙලා, ඒ වැඩ අවසන් කරන්න කටයුතු කර දෙන්න. මොකද තරංග මන්ත්‍රීතුමා පසුගිය කාලේ ඒ වෙනුවෙන් ඉතාමත් කැපකිරීම් කළා. ඒ වගේම විපක්ෂයේ ජොෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් තව ඉල්ලීමක් කරන්න තියෙන්නෙ, මේ දවස් වල හැම ගමකම පාලම් වලට මුල්ගල් තියෙනවා. ඒ මුල්ගල් කියද්දී අපි මුල්ගල් තියපු වැඩ ඉවර වුණේ නැති පාලම් තියෙනවා. ඒවායේ ඉතිරි වැඩ කටයුතු ටික කරලා දෙන්න කටයුතු කරන්න. ගල්ලන්දල කොන්ඩගල පාරේ තියෙන පාලමේත් වැඩ අවසන් කරල

නැහැ. මේ අවස්ථාවේදී පක්ෂ, පාට බලන්නේ නැතුව අලුතින් මුල්ගල් තියනවා වගේම වැඩ අවසන් නැති ඒවායිත් වැඩ නිම කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද ඔබතුමාලට තමයි දැන් බලය තියෙන්නේ. අපට බලය තිබුණ නම් අපි ඒ කටයුතු ඉටු කරනවා. නමුත් අපට ආණ්ඩු බලය නැහැ. ගරු සභාපතිතුමනි, මම දන්නවා අපි යම්කිසි දෙයකට බාධා කළත්, ඔබතුමා එක්සත් ජාතික පක්ෂයද, ජනතා විමුක්ති පෙරමුණද කියලා යෝජනා වලට විරුද්ධ වෙන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ යෝජනා වලටත් අපි එහෙම විරුද්ධ වන්නේ නැහැ. මොකද අපේ හෝමදොල වසමට එක්සත් ජාතික පක්ෂයේ යෝජනා දෙකක් ඇවිත් තිබුනා. මම තමයි ගිහිල්ලා ඇස්තමේන්තු කරන්න පාරවල් පෙන්නුවේ. අපි කිව්වා අපට පක්ෂ බේදයක් නැහැ කියලා. එහෙම කඩාකප්පල්කාරී දේවල් වලට අපි පෙළඹෙන්නේ නැහැ. ගමට පොදු වැඩක් කෙරෙනවනම්, අපි පක්ෂ භේදයක් බලන්නැතුව කටයුතු කරන්න ඕන. ඒ වගේම ඔය ඉහල දේශපාලන ගැටලු අපට අදාළ නැහැ. ඒ නිසා අපි ප්‍රාදේශීය සභාවක් විදියට ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලීමක් කරන්න ඕන. හෝමදොල සිමෙන්ති පාලම ගාව පාරට කුමන හෝ විසඳුමක් ඉතා ඉක්මනින් ලබා දෙන්න කියලා. ඒ වගේම එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා නාගොඩද, උඩුගමද කියලා බලන්නේ නැතුව ඒ කටයුතු ඉටුකර දෙන්න කියලා. ඒ වගේම දැන් ගමට කරන්ට් එක ඇත්තෙත් නැහැ. ගරු තරංග මන්ත්‍රීතුමනි, අවුරුදු තුනක් විතර ප්ලෑන් කරපු ආණ්ඩුවක් තියෙන්නේ. ඔබතුමාලගේ විදුලිබල ඇමති කෙනෙක් ඉන්නේ. ඔබතුමාලට වැඩපිළිවෙළක් හදන්න පුළුවන්. ඒ වගේම ගරු සභාපතිතුමා අපට කරන්න තියෙන යුතුකම් කොටස ඔබතුමා අපට කරනවා. ඒ ගැන මම ගෞරවයෙන් සිහිපත් කරන ගමන්ම, හෝමදොල පාරේ ගැටලුවත්, අවසන් නොකරපු වැඩ ටිකත් කරලා දෙන්න කියලා ඉල්ලීම් කරන ගමන්ම, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මුලින්ම අපේ සභාවට අලුතෙන් පත්වෙලා ආපු නව ලේකම්තුමිය ඉතාමත් ගෞරවයෙන් පිලිගන්නවා. අපේ සමන් මන්ත්‍රීතුමා කතා කළේ අපේ ප්‍රදේශයට ඉතාමත් අත්‍යවශ්‍යා යෝජනා ටිකක්. ඇත්තටම එතුමාට මතක ඇති ඔය හෝමදොල පාර ලක්ෂ එක් දහස් ගාණක පාරක්. වැඩ ආරම්භ කළ හැටි. අවුරුදු ගාණක් වැඩ නොකර තිබුණු පාරක්. දිගින් දිගටම ඉල්ලීම් කරාට පස්සේ 2015 අවුරුද්දේ තමයි වැඩ ආරම්භ කළේ. ඔය හෝමදොල වත්ත පාර ලක්ෂ එක් දහස් ගානක ව්‍යාපෘතියක්. I- ROAD ව්‍යාපෘති යටතේ වැඩ ආරම්භ කළා. සමන් මන්ත්‍රීතුමත් විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ සියලු විස්තර එතුමා දන්නවා. ගරු සභාපතිතුමනි, සමන් මන්ත්‍රීතුමයි, මමයි සෑහෙන්න කතා කරලා තමයි වැඩේ කරේ. සමහර කම්පැනි වල තියෙන අක්‍රමිකතා හින්දා වැඩ නතර කරලා තියෙනවා. ඒ වගේම කියන්න ඕන. සමන් මන්ත්‍රීතුමනි, අපේ වජිර අබේවර්ධන ඇමතිතුමා පළාත් පාලන විෂය බාර ගත්තු ගමන්, උඩුගමට පාලම් තුනක් ලබා දුන්නා. ලක්ෂ 900ක විතර පාලම් තුනක්. කටුඅත්තගොඩැල්ල පාලම, ගරු සභාපතිතුමා එකේ උත්සවයට සහභාගි වුණා. ඒ වගේම දොඩංඕවිට වත්ත, බෝපෙගෙදර වත්ත පාලම් තුනේ මුල් ගල් තියලා, වැඩකටයුතු ආරම්භ කරලා තියෙනවා. ඒ වගේම නාගොඩ ප්‍රාදේශීය සභාවට විශාල පාලම් තොගයක් මේ වෙනකොට අනුමත වෙලා ඇවිල්ල තියෙනවා. ඒ ගැන ඔබතුමාලගේ පුංචි සැකයක් ඇති. ඒ කාලේ පටන් ගත්ත පාලම් තවම කරගන්න බැරි වුණා. ඒවායේ මුල් ගල් තිව්වා විතරයි. නමුත් මේවා එහෙම නෙවෙයි. පාලම් නමයක වැඩ ආරම්භ කරලා තියෙනවා. ඒ වගේම ඒ කාලේ ඒ වැඩ කරපු නැති එක ගැන කනගාටු වෙනවා. ගරු සමන් මන්ත්‍රීතුමා, ඔබතුමාලගේ කාලේ සභාපතිතුමා හිටියා. ගොඩක් මන්ත්‍රීවරු හිටියා ඒගොල්ලන්ගෙන් අහන්න ඕන. ඒක අද අපෙන් අහනවට වඩා හොඳයි. මුලින්ම ඒ ගොල්ලන්ගෙන් අහන්න ඒවට මොනවද වුනේ කියලා. අපි දැනුවත්ව පාලම් තියෙනවා වැඩකටයුතු ආරම්භ කළා විතරයි. වනිගරත්න මහත්මයාගේ ගෙවල් වලට එහා තව පාලමක් තියෙනවා. ඒකත් එහෙමයි. පසුගිය දවසක අපේ අජිත් මන්ත්‍රීතුමත් හිටියා. අපි

රැස්වීමකත් ඔය ගැන සාකච්ඡා කළා. අපි ඒව ගැනත් අපේ වජිර ඇමතිතුමා හරහා නැවත ඉල්ලීමක් කරනවා. පහුගිය රජයෙන් ආරම්භ කරන්න හඳුනාගත් අත්‍යවශ්‍ය තැන් ඒ ගැන සලකා බලා ඒ කටයුත්ත කොහොමහරි මෙතුමාගේ මැදිහත් වීමෙන් කරන්න කියලා ඉල්ලීම් කරනවා. නැත්නම් අපි අලුතෙන් හරි යෝජනා දීලා, කොයි ආකාරයකින් හරි මුදල් වෙන් කරගෙන ඒ කටයුතු කොහොම හරි කරන්න අපි අවස්ථාව ලබාගන්නවා. සමන් මහත්තයාගේ උත්සාහය හොඳයි. කරන්න පුළුවන් කටයුතු ඔබතුමා සහ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම් වෙනුවෙන් කරන්න පුළුවන් හැම දේකටම පසුබට වෙන්නෙ නැහැ. මොකද පළාත් පාලන විෂය ගාල්ල දිස්ත්‍රික්කයට ආපු වෙලාවේ කරන්න පුළුවන් දේ අපි කරනවා. මේ ප්‍රාදේශීය සභාවට ලක්ෂ පන්සිය පමණ ශාලාවක් නුදුරු අනාගතයේදීම ලැබෙයි. ඒ වගේම ඔබතුමා කිව්වා වගේ පසුගිය මාස කීපය තුළ දහම් පාසල් ගොඩනැගිලි හතරක් පහක් ආරම්භ කළා. ලංකාව පුරා කරගෙන යන අතරේ, අපේ බල ප්‍රදේශයේ ලක්ෂ 40 ගානේ දහම් පාසල් 5කට 6කට නෙළී මන්ත්‍රීතුමිය, අජිත් මන්ත්‍රීතුමා ඇතුළු ඒගොල්ලන්ගේ යෝජනාවලට පියසේන ගමගේ ඇමතිතුමා හරහා, සුනිල් සේනානායක මන්ත්‍රීතුමා, බන්දුලලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම් වලට, සජිත් ප්‍රේමදාස මැතිතුමා ලක්ෂ 40 බැගින් ඒ නොදියුණු දහම් පාසලට බිල්ඩින් පහක්, හයක් වෙන්න එකම දවසේ ආරම්භ කලා. ඉදිරියේදී එම සංවර්ධන කටයුතු කොතලාවලටත් ඒ වගේ දෙයක් කෙරෙනවා නම් හොඳයි. හඟරන්වලට අපි ඉල්ලීම් කරලා තියෙනවා. මේ වන විට බණ්ඩාරනායකපුර 18 පන්සල, අක්කර 80 මාමනදොළ ආදී ප්‍රදේශවලට දහම් පාසල් ගොඩනැගිලි අනුමත වෙලා තියෙනවා. ඒවගේම තමයි LRC එක හරහා මේ ප්‍රදේශයේ විශාල ඉඩම් ඔප්පු ප්‍රමාණයක ඉඩම් මැනුම් කටයුතු කරගෙන යනවා. මෙච්චර කල් ඉඩම් ඇමතිවරු හිටියට ඒව කරලා තිබුණෙ නැහැ. ඔබතුමාලා තනියෙන් ගිහින් ඉල්ලීම් කලහම අපෙනුත් අහනවා අසවල් සභාපතිතුමා මේ වගේ ඉල්ලීම් කළා කියලා. ඒ වෙලාවෙදි අපිත් දෙන්න පුළුවන් උපරිම සහයෝගය දෙනවා. ඊට අමතරව ඊයෙ දිනයේ අපි උඩුගම ඩිපෝවෙන් බද්දේගම හරහා අධිවේගී මාර්ගයේ බස් රථයක් ආරම්භ කළා. යටලමත්ත වඳුරඹ හරහා බද්දේගමින් අන්න ඒ වගේ සංවර්ධන කටයුතු සිදු වෙනවා. ඒ වගේම අපේ චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා ඉන්න වෙලාවේ මේක කියන්න ඕන. බස්රථ ගැන කතා කරනකොට, උඩුගම නැගෙනහිර ඉහලගම කියලා බස් රථයක් ධාවනය වෙනවා. නමුත් එක ගමනාන්තයට යන්නේ නැහැ. ඉහළගමින් නෙවෙයි ආරම්භ කරන්නේ හෝමදොලින්. මම ඩිපෝවත් එක්ක පෞද්ගලිකව කතා කළා. දිග්දොල බස් රථයත් අඛණ්ඩව ධාවනය වෙන්නේ නැහැ. එය වෙනත් පාරක ගිහිල්ලා අපි දැන් නැවත දිග්දොලට ගෙන්නලා තියෙනවා. නමුත් නිසි ආකාරයෙන් ධාවනය වෙන්නේ නැහැ. මේ ආයතනවලින් පොඩ්ඩක් විමසීමක් කරන්න. මම මේ සභාවේ ලේකම්තුමිය ගෙන් ඉල්ලා සිටිනවා. අපි සභාවේ කතා කළාට මාධ්‍යවේදී මහත්තයෙක් හිටියොත් පත්තරේ ගියොත් මිසක්, මේ කිසිම ප්‍රතිඵලයක්නැහැ. අද වෙනකල් අපි කතාකරලා වාර්තාව පුරවනවා විතරයි. අඩුම ගානේ විමසීමක් කලා නම් ලිපියකින් දැනුම් දීමක් කරනවා නම්, ඒ ගොල්ලන් ඒවට ක්‍රියාමාර්ග ගන්නවා. සභාව ඇතුළෙ කතා කරහම මෙතුමාගේ හිතට වැදුනනම් එක කරයි. නැත්නම් ඒ ගැන ආයෙමත් සොයා බලන්නෙ නැහැ. ඒ වගේම වතු සමාගම් ගැන කතා කරනවා. ඔයිල්ෆාම් ගැන කතා කරනවා. කතා කළා කියලා වාර්තා පුරවනවා. අපේ වර්තමාන ලේකම් තුමිය ඒ ගැන පොඩ්ඩක් අවධානය යොමු කරන්න. ඒ අදාළ අංශ හරහා නිලධාරී හරහා එම කටයුත්ත කරලා ඊළඟ සභාව වෙනකොට ඒකේ ප්‍රතිඵලය මොකක්ද කියලා අපට දැනුම් දෙන්න.

ඒ වගේම පසුගිය දවස්වල පෙර පාසල්වලට නිල ඇඳුම් ලබා දුන්නා. කළින් නිල ඇඳුම් දෙකක් නොමිලේ ලබා දීලා, පහුගිය කාලේ වෙන විට අක්‍රීය වෙලා තිබිලා, නැවතත් නිල ඇඳුම් එකක් හරි දෙන්න කටයුතු කරපු එක ගැන අපි ස්තුතිවන්ත වෙනවා. ඒකත් හැබැයි නියමාකාරයෙන් කරාද කියලා පොඩි සැකයක් තියෙනවා. මොකද නිල ඇඳුම් දෙන දවසේ උදේ 9.30 ට කතා කරලා කියනවා. අසවල් පෙර පාසලේ නිල ඇඳුම් දෙනවා කියලා. ගරු සභාපතිතුමනි ඔබ තුමාට මේ සභාවෙන් නිල රථයක් දෙනවා, රියදුරෙක් හම්බවෙනවා, ඔබතුමා පූර්ණකාලීනව ඒ ගැන කටයුතු කරනකොට අපි

වෙන මොනවා හරි වෘත්තියක යෙදෙන ගමන් අපේ කටයුතු කරන්නෙ. උදේ 9.30 ට කියලා 9.45 ට එන්න බැරි වෙයි. මොකද අපි වෙනත් ප්‍රදේශයක රාජකාරියක නිරත වෙලා හිටියොත් ඒක අසීරු කටයුත්තක්. මේ පොදු අරමුදලින්, පොදු වැඩ වලදී තම තමන්ගේ දේවල් වගේ කරන්නේ නැතුව, මොකද මුදල් කමිටුවේ අනුමත කරන්නේ අපි සියලුම මන්ත්‍රීවරු එකතු වෙලා. එහෙම කරන එකේ අපිට මෙහෙම කරන්නේ ඇයි. සංවර්ධන නිලධාරිතුමිය ජයනි මිස්, එතුමිය කියනවා මට දැන්නූ කිව්වේ කියන්න කියලා. අපට වාහන නැහැ. රියදුරන් නැහැ. අපිට ඩීසල් දෙන්නේ නැහැ. අපි එන්නේ අපේ මෝටර් සයිකලේ හරි අපේ වාහනයෙන් හරි. අපේ වියදමින් තෙල් ටික ගහගෙන. ඒ නිසා අපි ඉල්ලන්නෙ වෙන මොනවත් නෙවෙයි. දිනකට කලින් හරි මේ දැනුවත් කිරීම් සිදු කරන්න. අඩුම ගානේ උප සභාපතිතුමා ට දැනුම් දෙන්න. ඒ කටයුත්ත නිවැරදි කරන්න.

ඒ වගේම තමයි කටුපොල් කර්මාන්තශාලාවෙ තත්ත්වය ගැන කතාකරනවානම්, අපි ඊයෙ ගියා. ඒ වෙලාවේ අපි දැක්ක දේ තමයි. මේ අය මේ පිරිපහදුවක් කියලා ඒ වතුර පිරිපහදු කරන්න සකස් කරලා තියෙන්නෙ අනුරුවක් කියලා තමයි මට හිතෙන්නෙ. ඒ කියන්නේ මේ වැඬේ සාර්ථකද කියලා බලන්න. ලක්ෂ ගානක වතුර ලීටර් ප්‍රමාණයකට එක අනුරුවක් විතරයි. මේ වැඬේ සාර්ථක වෙනවද කියලා බලන්න. අත්හදා බැලීමක් කරන්නේ. නමුත් ඒ වගේ එකට ගැලපෙන්නේ නැහැ. අඟල් 4 බටේකින් තමයි සියලු කටයුතු කෙරෙන්නේ. ඉතින් මේ වගේ කටයුත්තකදී අපි ගිහිල්ලා හා හරි වැඬේ කලයි කියල අපි පිළිගත්තොත්, ගැටලුවක්. එම කටයුත්ත ගැන මට නම් සෑහීමකට පත්වෙන්න බැහැ. ඒ වගේ කර්මාන්ත ශාලාවකට මිලියන කීයක් ගියත් ඒ කටයුත්ත හරි ආකාරයෙන් කරන්න ඕන. ඒක ඒ ප්‍රමාණයට මදි කියල තමයි මගේ දැනීම. අපි ඒ සඳහා සුදුසුකම් තියෙන විශ්වාසවන්ත කෙනෙක් යවලා පරික්ෂා කරල බැලුවොත් තමයි වඩාත් සුදුසු. ඒ අය වැරැද්දක් කරලා තියෙන්නෙ. වැරදිකාරයන්ට ඕන විදිහට තමයි දැන් අපි කටයුතු කරන්නේ. බලපත්‍ර නැති කෙනා කියන දිනයට අපි යනවා. ඒගොල්ලෝ ඒ අයට ඕන දිනයකට තමයි ඒ අය වැඩ කරන්නේ. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ සභාපති බලතල පාවිච්චි කරලා ඒ කටයුත්තක ක්‍රියාත්මක කරන්න කියලා නැවතත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි අපේ සමන් මන්ත්‍රීතුමා කතා කලා වගේ, ආවරණ සහිත ලොරි වලින් රැට තමයි ගෙනියන්නෙ. කම්කරුවන්ට වැඩිපුර අත්තම් දීලා, ටාගට් එකක් දීලා, මේ පැල සිටුවනවා. දවල්ට අත්තමක වැඩ කරන අය රෑට ගිහිල්ලා අත්කම් කිහිපයක වැඩ කරනවා. ඒ ගැනත් අපි සොයා බලන්න ඕන. දැන් පුදුම දෙයක් වෙලා තියෙන්නෙ. හැම කෙනාම ආණ්ඩුකාරතුමා ළඟට යන්න සුදානම් වෙලා ඉන්නේ. අපේ නන්දන මන්ත්‍රීතුමා කිව්වා වගේ ආණ්ඩුකාරතුමාට කරන්න පුළුවන් විශේෂ දෙයක් නැහැ. ආණ්ඩුකාරතුමා කරන්නේ නොකෙරෙන අක්‍රීය ආයතනවල තත්ත්වය තමයි එතුමට කරන්න පුළුවන්. එතුමා ගාවට ප්‍රශ්නයක් යොමු කරනවා කියන්නේ මේ සභාවේ හරි, වෙනත් ආයතනයක හරි කටයුතු නිසියාකාරයෙන් ක්‍රියාත්මක නොවීම ගැනයි. ඒ ගැන හොයා බලන්නම් කියලා එතුමා ඒ ආයතනයට තමයි දැනුම් දෙන්නේ. එහෙම නැතුව එතුමට වෙන කරන්න හැකියාවක් නැහැ. මම දන්න තරමින්, එතුමා ළඟට මේ සම්බන්ධව යනවා කියන්නේ අදාල විෂය කරන නිලධාරීන් හරි, ආයතනය හරි අක්‍රියයි කියන එක. ඉතින් මේ ප්‍රාදේශීය සභාව විදියට අපි එතනට යන්න ඕනේ නැහැ. බලය තියෙන්නෙ මෙතන නම් ඇයි අපට ඒක මෙතනින් කරගන්න බැරි.

ඒ වගේම තමයි, ගරු සභාපතිතුමා, උඩුගම හෝමදොල අර පූලියන් ගහ, කපලද කියලා දැනගන්න ඕන. මම කියන්නේ ඔබතුමා කියන එක බොරු කියලා නෙවෙයි. අපි 2015 වෙනකම් කටයුතු කළා. ඊට පස්සේ කොමසාරිස් පාලනයක් තිබුණා. එතනින් පස්සේ දැන් අවුරුද්දක් වෙනවා. අපිට තාම ගහක් කපන එකක් කරගන්න බැරිනම්, මේ විසි හත් දෙනෙක් මෙච්චර දීමනාවක් අරගෙන මෙතන ඉන්න එක තේරුමක් නැහැ. එක දවසට රුපියල් දහ නම දාහක් ගන්න ලෝකෙ වැඩිම පඩි ගන්නව ඇත්තෙ අපි. අපි කොච්චර කතා කළත්, මේ සභාව හරහා ඔබතුමාට තනියෙන් කරන්න බැරි වේවි. නිලධාරීන් ලවා කොයි විදිහට හරි ඒක ඉටු කරන්න. ඔබතුමා දන්නවා එම ප්‍රශ්නය ඔබතුමා පත් වෙන්නත් කලින්

ඉදලා තිබුණු ප්‍රශ්නයක්. ඒ මනුස්සයා 18 වතාවක් සභාවට ඇවිත් තියෙනවා. කවුරුහරි අවදානමක් ගැන ඉල්ලීමක් කළාම අවුරුදු ගාණක් තිස්සේ තියාගන්නැතුව ඔබතුමාට ඇයි බැරි මේ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න. දැන් මාස තුනක් තිස්සේ මම සහ සියළුම මන්ත්‍රීවරුන් ඔය ගැන දන්නවා. අපි ඒ මිනිස්සුන්ගෙන් මුදලක් අය කරලා තියෙනවා. ඉතින් ඒ ගැන ඇයි නිලධාරී කටයුතු නොකරන්නේ. සභාපතිතුමා ඔබතුමා රැස්වීමකදී හරි මේ පිළිබඳව කියන්න. ඊළඟ සභාවට මේ සම්බන්ධව කතා කරන්න තියන්න එපා කියලා.

උඩුගම දිසා රෝහලට මේ තියෙන පැවිල්ලක් එක්ක ඔබතුමාට පුළුවන් ආකාරයෙන් වතුර බවුසර ලබා දීලා තිබුණා. අද වෙනකොට දිසා රෝහලේ ඉල්ලීමක් තියෙනවා බඩේ අමාරුව තියෙන ලෙඩ්ඩුන්ට වතුර නවත්තන්නත් බැහැ. වහන්නත් බැහැ. රෑ 12:00 ට ද දෙකට ද පැයක්, දෙකක්වත් වතුර නැතුව තියන්න බැහැ. ඒ නිසා සහයෝගයක් විදියට මේ පැවිල්ල ටිකේ හරි පුළුවන් සහයෝගයක් ලබා දෙන්න කියලා ඉල්ලනවා. සභාපතිතුමා තවලම බවුසරය ගැන මම ඔබතුමාට පෞද්ගලිකව කිව්වේ. තවලම ප්‍රාදේශීය සභාවේ බෝඩ් එක ගහපු වතුර බවුසරයක් එතැන තිබිලා තියෙනවා. මෙතුමාට මම ඔය කතාව කිව්වා. මිනිස්සු අපට චෝදනා කරනවා ඔයගොල්ලොත් සභාව ඉන්නවා ඇයි මේක වත් කරන්න බැරි කියලා. එතකොට අපි ඇවිල්ලා සභාපතිතුමාට කියනවා. එතුමා කියනවා. සභාපතිතුමා තමයිලු වතුර බවුසරේ ගෙනැල්ල දුන්නෙ. නමුත් ඔය කතාව සභාවේ කිව්ව නම්, අපි දන්නවා. ඔබතුමා සද්භාවයෙන් කරපු දේ ගැන ඒ මිනිසුන් දැනුවත් වෙලා නැහැ. ඒ නිසා ඒ මිනිස්සු අපට චෝදනා කරනවා. රෝගීන් වෙනුවෙන් අපට කරන්න පුළුවන් වැඩ කටයුතු ගැන අවධානය යොමු කරන්න කියලා මම නැවතත් සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිමින්, ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සියලු දෙනාට සුභම සුභ අලුත් අවුරුද්දක් වේවායි,කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී නිහාල් වසන්ත පතිනායක මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මේ දිනවල රටේ පවතින දැඩි නියඟය නිසා ඌරල ග්‍රාම නිලධාරී වසමේ කොතේගොඩකන්ද ප්‍රදේශයේඋග්‍ර ජල හිඟයක් පවතිනවා. සභාපතිතුමා, නිවාස 20කට පමණ මේ වෙනකොට ජලය බිඳක් වත් නැහැ. ළිං හිඳිලා. මීට කලිනුත් නියගය ඇති අවස්ථාවල අපේ සභාවෙන් දින දෙකකට සැරයක් ජල බවුසරයක් ගිහිල්ලා ජලය බෙදා දුන්නා. ඒ ගැන ඔබතුමා අවධානය යොමු කරන්න. මොකද සිංහල හා හින්දු අලුත් අවුරුද්දට තියෙන්නෙ තව දින කිහිපයයි. මේ මිනිසුන් දැනුත් දුරකථන ඇමතුම් දෙක තුනක්ම ලැබුණා. ඒ ගැන ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

ඒ වගේම ඔබතුමාට මම යළිත් වතාවක් කාරුණිකව සිහිපත් කරනවා. වැඩිහිටි නිවාසයේ කුණු ටික ගන්න. මොකද ගමෙන් අපට දැඩි විරෝධයක් එල්ල වෙනවා. ඌරල තෙල් පිරවුම්හල ගාවට ගිහිල්ලා එතන කුණු ටික අරගෙන එනකොට, අර වැඩිහිටි නිවාසයේ මිනිස්සු ඇත්තටම ගොඩක් අසරණයි. මේ ගැන සභාවේ කීප සැරයක්ම කතා කළා. ඒ කාත් කවුරුවත් නැති වැඩිහිටියො එතන ඉන්නෙ. පොඩි ඉඩ ප්‍රමාණයක් තියෙන්නෙ. කුණු වලක් නැහැ. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ කුනු ටික ගන්න කියලා මම නැවත වතාවක් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඌරල විදුහල් ක්‍රීඩාංගණයේ අවුරුදු උත්සවයක් පැවැත්වෙනවා. ඒ සඳහා ජල බවුසරය නොමිලේ ලබා දීමට කටයුතු කරන්න කියලා මම ඔබ තුමාගෙන් ඉල්ලනවා. විදුහල් ක්‍රීඩාංගනය ට කෙසේ වෙතත් කොතේගොඩකන්ද ජල ප්‍රශ්නයට විසඳුමක් කොහොමහරි ලබාදෙන්න. ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සුබම සුබ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන්, නව ලේකම්තුමිය, මාධ්‍යවේදී හේමපාල මැතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම මේ අලුත් අවුරුද්ද ලබාගෙන එන අප්‍රේල් මාසයේ සභාවාරයේ මුලින්ම ඉල්ලීමක් කරනවා. මාපලගම - ගල්වාන උඩුගම මාර්ගය ප්‍රධාන මාර්ගයක්. පහුගිය කාල වකවානුවේ නම් මේ මාර්ගයේ පයින්වත් ගමන් ගන්න බැරි ආකාරයට තිබුණා. නමුත් 2015 ජනවාරි 8 වැනිදායින් පස්සේ අපි මේ මාර්ගය අලුත්වැඩියා කර ගත්තා. තාමත් හොඳ තත්ත්වයෙන් මාර්ගය තියෙනවා. ලබන අවුරුද්ද වෙනකොට ඊට වැඩිය දියුණු කරගන්න අපට අවස්ථාව ලැබෙනවා. අපි ඉල්ලීම් කරලා තියෙනවා. මම මේ වෙලාවේ තවත් ඉල්ලීමක් කරනවා. ජනතාවගේ ඉල්ලීමක් තියෙනවා මේ මාර්ගයට උඩුගම ඩිපෝව හරහා මාපලගම උඩුගම ගල්වාන හරහා ගාල්ල දක්වා බස් රථයකුත්, ඇල්පිටිය දක්වා බස් රථයකුත් ලබා දෙන්න කියලා. මම මේ වෙලාවේ සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා උඩුගම ඩිපෝවට සභාව හරහා මේ පිළිබඳ ඉල්ලීමක් කරන්න. අපිත් අපේ දේශපාලන අධිකාරිය හරහා දැනුවත් කරන්නම්. ඒක ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමක්. ඒ වගේම උඩුගම, තවලම, නෙලුව ප්‍රදේශයේ අයටත් ඇල්පිටියට, ගාල්ලට යන්න කිට්ටු මාර්ගයක් තමයි මේ මාර්ගය.

මේ වෙලාවේ, මම තවත් ඉල්ලීමක් කරනවා. අපේ කොට්ඨාශයේ ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමන් කිව්වා වගේ, මාපලගම කනිෂ්ඨ විද්‍යාලයට අල්ලපු ඉඩම අක්කර දෙකකට වැඩියි. අපේ මහ ගෙදර තියෙන්නේ අල්ලපු ඉඩමෙ. ඒ ඉඩම තමයි මේ කැබලි කරලා විකුණලා තියෙන්නේ. දැන් විකුණුම් කටයුතු අවසන් වෙමින් පවතිනවා. එතුමන් සඳහන් කලා වගේ යම් බිම් කොටසක් කැබලි කරලා වෙන්දේසියේ විකුණුනා නම්, එකේ යම් බිම් ප්‍රමාණයක් සභාවට අයිතියි. ඒ බිම් කොටස අපි විසින් ලබා ගත යුතුයි. මොකද මාපලගම ගල්වාන හන්දිය කියන්නේ රජයේ ආයතන තියෙන ස්ථානයක්. ඔය ඉඩම කොටස් කරලා විකුණන්න යනකොට මේ සභාවේ නිලධාරීන්ට අවශ්‍ය පිඹුරුපත් මෙහේට ඉදිරිපත් කරනවා. ඒ අවස්ථාවේදී අපේ සභාවේ ඉන්න නිලධාරි මහත්ම මහත්මීන් දැනගන්න ඕන. අපේ සභාවට යම් කොටසක් අයිති වෙනවා නම්, ඒ පිළිබඳ අවධානය යොමු කරන්න. හැබැයි මේ වෙනකම් සිදුවෙලා නැහැ. තව මේ වගේ ඉඩම් කීයක් මේ සභා බල ප්‍රදේශයේ විකුණන්න ඉල්ලීම් කරල තියෙනවද දන්නේ නැහැ. ඒවායේ නීති රීති අනුව සභාවට බිම් කොටසක් එනවා නම්, ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳ සොයා බලා පරීක්ෂණයක් කරන්න.

ඒ වගේම මාපලගම බස් නැවතුම්පොළේ වෙළඳ සංකීර්ණයේ තියෙන වැසිකිළි කැසිකිළි පද්ධතිය පිළිබඳ නැවත වාරයක් ජනතාවගේ කතාබහට ලක්වෙලා තියෙනවා. දැන් නැවත ඔබතුමන්ලා, පියල් මන්ත්‍රීතුමා මැදිහත් වෙලා යම් ආකාරයකට ප්‍රතිසංස්කරණය කළා. නැවත වාරයක් පහුගිය කාලේ වගේම අපවිත්‍ර වෙලා අහලකින්වත් යන්න බැරි තත්වයකට පත්වෙලා තියෙනවා. මේ සභාවේ තියෙන ආදායම් තත්ත්වයත් එක්ක සියලු දේ කරන්න හැකියාවක් නැහැ. නමුත් අපි මේක කිව යුතු වෙනවා. නමුත් පහුගිය කාලේ යම් මට්ටමකට සභාවට අයිති ප්‍රදේශ පිරිසිදු කරන්න, ඒ අවශ්‍ය කම්කරුවන් යොදවලා තිබුණා. තල්ගස්වලට වෙනම මුරකරුවෙක්, ඒ වගේම තල්ගස්වල, මාපලගම ටවුන් එක හැමදාම උදේට අතුගාන්න ක්‍රමවේදයක් සකස් කරලා තිබුණා. දැන් අපට ඒ ක්‍රමවේදය නැහැ. ඒක තමයි සියලු ප්‍රශ්න වලට හේතුව. පියල් මන්ත්‍රීතුමත් කිව්වා වගේ දැන් අර මාපලගම නගරයේ හැමදාම උදේට අර මනුස්සයෙක් සුද්ද පවිත්‍ර කටයුතු කරනවා. ඒ මනුස්සයා ඇත්තටම වයෝවෘද්ධයි. දැන් එතුමාට අතුගාන්න තියා හරියට ඇවිදින්නවත් බැරි තත්වෙට පත්වෙලා තියෙන්නේ. ඒ වගේ කෙනෙක් එතනට දාලා බැහැ. දැන් වතුර මෝටරේ අකුණක් වැදිලා පිච්චිලා කියලා පියල් මන්ත්‍රීතුමා කිව්වා. නමුත් අපේ සභාවේ කාර්මික නිලධාරි මහත්වරු ඉන්නවා. මහා ලොකු මුදලක් යන්නේ නැහැ. ඔය වැඩේට ඒක ප්‍රතිසංස්කරණය කරලා දෙන්න.

ඒ වගේම බදාදා සති පොල ගැන කතා කරනකොට, මම නම් මිනිස්සු ටිකක් අඩු වුනහම යන්නෙ. මොකද මිනිසුන්ගෙන් බැණුම් අහන්න බැරි හින්දා. මිනිස්සු ගිහිපු ගමන් පෙන්නන්නෙ කාණුවල තියෙන ගොඩගැහිච්ච පස් ගොඩවල්, සමහර කුටිවල ලයිට් නැහැ, වයර් නැහැ. මේවා දැඩි ප්‍රශ්න. සභාවෙ තියෙන ආදායම් තත්ත්වයත් එක්ක කරන්න බැරි කමක් ඇති. නමුත් කුමන හෝ වැඩපිළිවෙළක් යටතේ මේකෙ තියෙන යම් වැඩ කොටසක් හරි සකස් කරලා දෙන්න. මොකද මෙතන විකුණන ද්‍රව්‍යවල පිරිසිදුතාවයක් නැහැ. ඉදිරියේදී වරුසාව ඇතිවුනොත් මඩ වගුරක් වේවි. සභාවේ කම්කරුවෝ යොදවලා හරි සකස් කරන්න පුළුවන් නම් හොඳයි.

ඒ වගේම උඩුගම හෝමදොල ආදී මේ වතු සමාගම් දැන් දැඩි ලෙස තව ප්‍රශ්නයක් එල්ල කරනවා. මොකද මේ වතු ආශ්‍රිතව පහුගිය අවුරුදු විස්සක් තිහක කාලෙක ඉඳලා මේ අහිංසක මිනිස්සු රිසිවේෂන් ස්ථාන වල ගෙවල් හදාගෙන, පොඩි මඩු හදාගෙන ජීවත් වෙනවා. හැබැයි දැන් මේ වතු සමාගම් අලුත්ම ක්‍රියාදාමයක් කරගෙන යනවා. මේ වතු ආශ්‍රිතව රිශිවේසම් වල ඉන්න මිනිසුන්ට බලපෑම් කරලා, උසාවි ගිහිල්ලා, මේ ගෙවල් කඩලා එළියට ඇදල දානවා. හැබැයි ඇත්තටම මේ අහිංසක මිනිස්සු තමයි මේවායේ හිටියේ. මේ වතු සමාගම් අර අහිංසක මිනිස්සුන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග අරගෙන කටයුතු කරනවා. ඇත්තටම මම මේ ගැන කණගාටු වෙනවා. අපි අධිකරණයට ඇඟිල්ල දික් කරන්නේ නැහැ. උසාවි වලත් මේ වතු සමාගම් වලට වාසි වෙන විදියට තීන්දු තීරණ දීලා, මේ අය එළියට ඇදලා දානවා. මේක අපේ සභා බලප්‍රදේශයේ සිදු වන දෙයක් ලෙස වතු සමාගම් වලට මේ වැඩේ කරන්න එපා කියලා, යම් මට්ටමකට බලපෑමක් කරන්න ඕන. නැත්නම් මේ මිනිස්සුන්ට ඉන්න තැනක් දීලා තමයි මේ වැඩේ කරන්න ඕන. උඩුගම ප්‍රදේශයේ ඉන්න මන්ත්‍රීවරු මේ ගැන දැනුවත් ව ඇති. නමුත් කතා කළේ නැහැ. අපි මේ වතු සමාගම් එක්ක කටුපොල් වගාවට, කර්මාන්තශාලාවට විරුද්ධව කටයුතු කරනවාට වඩා වැඩිය සලකා බැලිය යුතු කාරණයක් තමයි මේ අහිංසක මිනිස්සුන්ට දෙන කරදරය. එහෙම ඒ මිනිස්සු එහෙම එළියට ඇදල දාන්න වතු සමාගම් වලට අයිතියක් නැහැ. ඒ පිළිබඳව ගරු සභාපතිතුමා ඔබතුමා අවධානය යොමු කරන්න.

ඒ වගේම සභාපතිතුමා දැන් ඔබතුමා දිගින් දිගටම මේ සභාවෙ සිදු වන යම් යම් පරිපාලන ගැටලු පිළිබඳව කතා කළා. ප්‍රදේශයේ ජනතාව බලාපොරොත්තු වන ආකාරයෙන් සභාව තුළින් ජනතාවට ඒ වරප්‍රසාද ලබා දෙන්න හැකියාවක් නැහැ. නමුත් මම මේ වෙලාවේ ඔබතුමාට මතක් කරනවා. පහුගිය කාලේ ඔය ටික අපේ ප්‍රදේශවල ජනතාව හිතුවේ නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයගේ කණ්ඩායමට බලය දීලා තමන්ගේ බලාපොරොත්තු ඉටුකරගන්න පුළුවන් කියලා හිතාගෙන තමයි ඡන්දෙ දුන්නෙ. දැන් අපට කතා කරනවා මේ ටික කරලා දෙන්න කියලා. නායකයන් ජනතාව මුලා කරමින්, බොරු පුරාජේරු කරලා බලය ගන්න තැත් කිරීමේ ක්‍රමවේදයක් හැටියට තමුන්නාන්සේලාට මේ සභාවට බලයට එන්න හැකියාව ලැබුණා. 2015 ජනවාරි 8 වැනිදායින් පස්සේ විප්ලවීය වෙනසක් අපේ සභා බල ප්‍රදේශයේත්, රටේත් සිද්ධ වෙනවා. ඉදිරියේදී සමෘද්ධිය ලක්ෂ හයකට දෙනවා. ඒ අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අයවැයෙන් මූල්‍යමය තත්ත්වය සපයලා දීලා තියෙනවා. ගම්පෙරළිය ආදී විවිධ වැඩසටහන් ප්‍රදේශවලට එනවා. ඉස්සර යන්න බැරි පාරවල් දැන් හොඳට යන්න පුළුවන් හැකියාවක් තියෙනවා. ගල්වාන උඩුගම මාර්ගය ඒකට උදාහරණයක්. මේ රටේ සංවර්ධනයේ ඉහළම ඉණි පෙත්තට ගෙනියන්න වත්මන් රජය දැන් පිඹුරුපත් සකස් කරලා ඉවරයි. ඒ නිසා කිසි දෙයකට බයවෙන්න එපා. සභාවේ තමුන්නාන්සේලාට විශාල සහයෝගයක් ඉදිරි කාලෙදි ලැබෙනවා. මම සභාපතිතුමාගෙන් ඉල්ලනවා තමුන්නාන්සේලාගේ 15 දෙනා ගැන විතරක් නෙවෙයි. අනිත් පැත්තෙන් කොටසක් ඉන්නවා. ඒ අය ගැනත් සැලකිලිමත් වෙන්න. සභාව යන ආකාරය දැන් මට තේරෙනවා. යම් යම් පැය ගණන් පාරවල් කපන්න තමුන්නාන්සේලට යෝජනා මෙහෙ අනුමත කරනවා. හැබැයි තවම අපට එකක්වත් දුන්නේ නැහැ. මම තමුන්නාන්සේට මාපලගම හන්දිය තියෙන තොටුපලවල් දෙක හරි හදලා දෙන්න කියලා කිව්වා. නමුත් ඒ පිළිබඳ සැලකිල්ලක් දැක්වුවේ නැහැ.

හැබැයි අද මේ වනවිට මේ මන්ත්‍රීවරුන්ට ලැබුණු ලක්ෂ 70 මුද්දර ගාස්තුවෙන් ඒ පහසුකම් වරප්‍රසාද ලබා දෙනවා. විපක්ෂය පැත්තෙ ඉන්න කණ්ඩායමට සොච්චමක් හරි දීලා හිත හොඳ කරන්න. නැත්නම් ඉස්සරහදි පොඩි ප්‍රශ්න ඇති වේවි. ලබන්නාවූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සාමය, සතුට පිරි වාසනාවන්ත අලුත් අවුරුද්දක් කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

❖ **ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා පිළිතුරු දෙමින්,**

ගරු සභාපතිතුමනි, අපේ වසන්ත මන්ත්‍රීතුමාට මම පුංචි පිළිතුරක් දිය යුතුව තියෙනවා. මොකද වැරදි අවබෝධයක් එන්න පුළුවන්. අර එතුමාගේ දේශපාලන නායකයෝ ගැන එහෙම නෙවෙයි කතා කරන්නේ. එතුමා අර සඳහන් කලා අර වතු සමාගම් වල ඉන්න පිරිස් ඉවත් කිරීම පිළිබඳව. මෙතුමා සඳහන් කරන්න ඇත්තේ උඩුගම අලුත් වත්ත ප්‍රදේශයේ තිබුණ ස්ථානය වෙන්න ඕන. එතනදි පැහැදිලිවම කියන්න ඕන. දැන් අපිත් සභාපතිතුමාත් එතනට ගියා. ඒ සිදුවීම සිද්ධ වෙච්ච වෙලාවේ. නමුත් උසාවිය මගින් තීන්දුවක් දීලා ඒ උසාවි තීන්දුවට අනුව පිස්කල් ගෙනැල්ලා ඒවා ඉවත් කරන කොට සභාපතිතුමාට තියා කිසි කෙනෙකුට ඒකට ඒ වෙලාවෙ මැදිහත් වීමේ හැකියාවක් නැහැ. ඔබතුමන්ලගේ ඉහළ නායකයන්ටවත් මැදිහත් වෙන්න හැකියාවක් නැහැ. ඉතින් ඒකෙ දී අර ගෙනාපු යෝජනාව හොඳයි. යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් නම් මින් ඉදිරියට එහෙම නොවෙන්න. මම දන්නා පරිදි උඩුගම ප්‍රදේශයේ සිදු වුණේ ඒක. ඒ නිසා එහෙම ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් නම් ඒක හොඳයි. අපි කතා කළේවත් නැහැ කියලා එතුමා සඳහන් කළා.

❖ **ගරු සභාපතිතුමා ඒ පිළිබඳ අදහස් දක්වමින්,**

ගරු මන්ත්‍රීතුමා, මමත් ඇත්තටම එතනට ගියා. මොනවත් නැති බොහොම දුප්පත් අහිංසක මනුස්සයෙක් කිව්වා. මම ගිහින් බැලුවම වාහන , ට්‍රැක්ටර්, ආදිය තියෙන කෙනෙක් . ඒ බව දිසාපතිතුමියත් මාත් එක්ක කිව්වා. මම අසරණ භාවයට පත් වුණා. මැදිහත් වෙන්නේ කොහොමද කියලා මමත් බ්‍රේක් වුණා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි දීර්ඝ වශයෙන් සාකච්ඡා වුනු වෙලාවේ සභාවෙ පොඩි නිවැරදි කිරීමක් සිදු කරන්න වෙලා තියෙනවා. මෙතන ඉන්නවා ඇත්තටම සභාවට පලවෙනි සැරේ ඇවිල්ලා ඉන්න කුඩා දරුවෝ වගේ පිරිසක්. ඒ නිසා මම කරන්නේ අවවාද කිරීමක් විතරයි. ඉතිහාසය වෙනස් කිරීමේ හැකියාවක් නැහැ. මම ෆේස්බුක් එකේ දැක්කා. නිල ඇඳුම් ගැන කතන්දරයක්. ඔබතුමාට වැරදිලා තියෙනව. ඒකෙ නිර්මාතෘවරයා මම. ඒ ගැන මම කියන්න ඕන නැහැ. අපේ උප සභාපතිතුමා, සභාපතිතුමා, අපේ හිටපු සභාපතිතුමා වන අජිත් මහත්තයා, නන්දන මන්ත්‍රීතුමා ඇතුළු හිටපු පරණ සියලු දෙනා ඒ ගැන දන්නවා. මේක මට ගෞරවයක් ගන්න ඕනෙ නැහැ. අනුන්ගේ ගෞරවය ගන්නෙත් නැහැ. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ කිසිම කෙනෙක් එහෙම ගෞරවය ගන්නෙ යන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාට කිව්වේ නොදන්න දේවල් නොලියා හිටියාම හරි. ඔබතුමාගේ පියා දැන් නැහැ. ඒ ගැන මම මෙතන කතා කරන්න සූදානම් වෙන්නේ නැහැ. දේශපාලන වශයෙන් නෙවෙයි. පෞද්ගලිකව අපි හිත මිත්‍රයෝ. මම ඔබතුමාට කියන්නේ ඒක නිවැරදි කරගන්න කියලා. මගේ කාලේ නිල ඇඳුම් ලබා දීමේ නිර්මාතෘ ලෙස ඇඳුම් මහලා හොඳ ප්‍රමිතියෙන් යුතුව නොමිලේ ලබා දුන්නා. ඊට පස්සේ ආපු සභාපතිතුමා ක්‍රියාත්මක කළා. අජිත් සභාපතිතුමා ඒක ක්‍රියාත්මක කළා. ඊට පස්සේ නැවතිලා තිබිලා, ඔබතුමාගේ පියාත් මේ කාර්යය ක්‍රියාත්මක කරන්න ඇති. දැන් වර්තමාන

සභාපතිතුමා නැවත ඒක ක්‍රියාත්මක කළා. මම ඒ ඇඳුම් වලට රුපියලක්වත් ගත්තෙ නැහැ. අවුරුදු 12 ක ඉතිහාසය කියන්නෙ. ඔබතුමාගේ වගන්තිය විතරයි වෙනස් වෙන්න ඕන. Facebook දකින මිනිස්සු අපෙන් අහනවා මොනවද මේ ෆේස්බුක් වල යන්නේ කියලා. ඒ වගේම ඔබතුමා මේවා දන්නේ නැහැ. ඔබතුමා තවම පොඩි දරුවෙක් වගේ. ඒ නිසා මම අවවාදයක් කරන්නෙ. ඉතිහාසය ගැන කතා කරනවනම්, උඩුගම දකුණේ අපේ අජිත් එඩේරආරච්චි සභාපතිතුමා එදා මන්ත්‍රීවරයෙක් හැටියට තමයි ෆවුන්ඩේෂන් එක දාල තිබුනෙ. මම කුහකකම් කරන්න ගියේ නැහැ. ඒ ප්‍රදේශයේ ජනතාව කිව්වා මේක ඉවත් කරලා දාන්න කියලා. මම එකේම තමයි පෙර පාසල ඉදි කෙරුවේ. ඒ වගේ කුහකකම් කරන්න ගියේ නැහැ. හෝමදොල තියෙන ක්‍රීඩාගාරය මේ පැත්තෙන් තියනකොට උඩුගම ඉහළ ක්‍රීඩාගාරය ගැන, මම මේ ඉතිහාසය මතක් කර දෙන්නේ මෙයාලා දැනගන්න ඕන. ඒවයි තිබුණ එලක ටික නම් සමහරු ගලවා දැම්මා. මේ සභාවේ ඉන්න ඉතිහාසය නොදන්න නොදරුවෝ ටිකක් ඉන්නවා. එයාලට දැනගන්න කිව්වෙ. මම ඊට එහා ඒ ගැන කතා කරන්න යන්නේ නැහැ.

ඒ වගේම පෙර පාසල් පද්ධතිය ගැන කතා කරන විට, තමුන්නාන්සේට මතක් කරන්නේ තල්ගස්වල ඉඩම් අල්ලගෙන තිබුණෙ ඒ පෙර පාසල ඉදිකරන්න බැරි වුණා. දැන් අපේ අජිත් මන්ත්‍රීතුමාගෙ JCB එකේ රියදුරා හැටියට හිටිය පුද්ගලයා ඒවා ඉවත් කරලා, ගොඩනැගිලි ඉදි කරලා දුන්නා. මට වැරදුනේ උඩුගමට වැඩියෙන් වැඩ කිරීම. ක්‍රීඩාපිටි හදපුවා, පෙර පාසල් හදපුවා, පෙර පාසල්වලට නොමිලේ ඇඳුම් දීපුවා. නමුත් මේ ඉතිහාසයත් එක්ක සමහර කෙනෙක් හිතන්න පුළුවන් වැඩ නොකරයි පැරදුනේ කියලා. අපේ ආණ්ඩුවත් තිබුණේ අවුරුදු දෙකයි. මුදල් ලක්ෂ 5යි මට අවුරුදු දෙකටම හම්බවෙලා තිබුණේ. ඒ දවස්වල අපි ඔය දඩ මුදල් වලින් තමයි මේවා ගොඩනංවාගෙන කටයුතු කළේ. ඉතිහාසයේ සභාපති වුන සියලු දෙනාම මේ ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු කළා. ඒ තැන්වලදී අපි විපක්ෂයක් හැටියට ඒවා කඩාකප්පල් කළේ නැහැ. මේකෙ තිබුන දේවල් නැති වුණා. මම ඒවා මුල ඉඳලම මතක් කරා. පයිප්ප, ජෙනරේටරය, සර්පිනාවේ ඉඳලා නැති වෙච්ච දේවල් මතක් කළා. ඒවට ඉතිහාසය වගකියන්න ඕන. තමුන්නාන්සේට එකපාරටම මේක නිරවුල් කරන්න බැහැ. ඒ වගේම තමන් කරපු හොඳ නරක තමන් අරගෙන යනවා. අනිත් එක අපේ ඉතිහාසය ලියන්නේ අපි නෙවෙයි. මේක බලාගෙන ඉන්න උදවිය අන්න ඒ ඉතිහාසයයි ගොඩනගන්න ඕන.

ඒ වගේම පොළවල් ගැන කතා කලහම, උඩුගම පොලේ අපට යම් කිසි මුදලක් අය වෙන්න තිබුණා. දැනට අධිකරණයට යොමු කරලද? එහෙම නැත්නම් ගෙවලද? කියලා මට දැනගන්න ඕන. ඔබතුමාගේ කතාවෙදි ඒ ගැන සඳහන් කරන්න. ඒ වගේම ඔබතුමාගේ අවුරුද්දක ප්‍රගතිය කිව්වා. උඩුගම පොළට ලක්ෂ දෙකක් විතර වියදම් කරලා, කැලේ ලී කපලා, කම්කරු මහත්වරු යොදවලා වැඩ කළා. මේ අවුරුද්දක් වෙනකොට ඒවා ගරා වැටිලා, කැඩිලා තියෙනවා. ඒක අපරාධ වියදමක්. එදා තමුන්නාන්සේ බුද්ධිමත්ව කල්පනා කරල කොන්ක්‍රීට් කණු දැම්ම නම් හොඳයි. තමුන්නාන්සේගේ පැවැත්මටත් හොඳයි. ඒ වගේ කටයුතු වලදී ඉතාමත්ම කල්පනාකාරීව කටයුතු කළ යුතු වෙනවා.

ඒ වගේම තමුන්නාන්සේ වතු සමාගම් පිළිබඳව කතා කළා. ඒ පිළිබඳව කතා කරනකොට ඇත්තටම ඔය ගෙවල් ඉවත් කිරීම පිළිබඳව මම දන්නේ නැහැ. අපේ පතිනායක මන්ත්‍රීතුමා කිව්වා. බීඩී5 ත් ඒ වගේ ස්ථානයක් තියෙනවා. කොහොම උනත් අපි ගන්න ඕන වතු සමාගම් පැත්ත නෙවෙයි. ගමේ අහිංසක මිනිස්සුන්ගෙ පැත්ත. ඊළඟට ශ්‍රී කුමාර කියන අධ්‍යක්ෂකවරයා මම සභාපති පුටුවෙ ඉන්නකොට මට ඔප්පු තුනක් ගෙනත් දුන්නා. උඩුගම ඉහළ පෙර පාසල තියන තැනට ඔප්පුව, අලුත් වත්ත පෙර පාසල තිබුන තැනට ඔප්පුව, ඔය බීඩී5 ඔප්පුව. නමුත් දැන් ඒ සියලු දේවල් අස්ථානගත වෙලා. තමුන්නාන්සේ බාරගත්තේ කුණුගොඩක්. අපි කවුරුත් සභාපතිතුමාට ඇඟිල්ල දික්කරනවා. නමුත් සභාපතිවරයාට කරන්න දෙයක් නැහැ. මේවා මම සද්භාවයෙන් ඇති කරපු දේවල්. පක්ෂ, පාට

බලලා අකුල් හෙළීම සිදු කළේ නැහැ. හැම කටයුත්තකදිම එකා වගේ නැගී සිටියා. ඒ නිසා තමයි අපට ඒ කටයුතු කරගෙන යන්න හැකියාව ලැබුණේ.

ඒ වගේම මම ඉල්ලීමක් කරනවා. මේ අයට ඉතිහාසය දැන ගන්න. මේ සභාපතිවරුන්ගේ, මේ මන්ත්‍රීවරුන්ට දැනගන්න. අන්න මේවා පරිත්‍යාග කරපු මිනිස්සුන්ගෙ ෆොටෝ ඇප්තොප්වත්තෙ කුණුගොඩක තියෙනවා කියලා ආරංචියි. මේවා පරිත්‍යාග කළේ සල්ලි වලට නෙවෙයි. ඒක නිසා කරුණාකරලා ඒව ගෙනැල්ලා මේ තැනක තියන්න. පාසල්වල ළමයින්ට ඉතිහාසය ගැන නිවැරදි දැනීමක් ලබා දෙන්න කටයුතු කරන්න. සභාපතිතුමා, පරණ මන්ත්‍රීවරු ඒ ඉතිහාසය දන්නවා. ඒ ඉතිහාසය පිරිසිදු කරන්න කියන එක තමයි මම තමුන්නාන්සේට කියන්නේ. ගරු සභාපතිතුමනි, තව පුංචි පණිවුඩයක් තියෙනවා කියන්න. උතුරු නැගෙනහිර බෝම්බ ගහන කාලෙ බෝම්බ වැදිලා, අපේ කැබ් එකක් ආව නේද? ඒක තියෙනවද? මම දන්නේ නැහැ වුනේ මොකක්ද කියලා. කැබ් එකේ පොත දුන්නෙ නැද්ද? මොකද පොතේ වටිනාකමක් තියෙනවා. ඔබතුමා අවුරුද්දක් ආපු ගමන් මග ගැන මම සෑහීමකට පත්වන්නේ නැහැ. ඊලඟට මම තමුන්නාන්සේට කිව්වා නැහිනිගල පාර, ඒකට දෙයියන්ගෙම පිහිටයි. ප්‍රාදේශීය ලේකම්, තාක්ෂණ නිලධාරි, ඉංජිනේරුතුමා ගියා. මම හිතන්නේ ඔබතුමත් යන්න ඇති. නමුත් වෙච්ච දෙයක් නැහැ. මාස තුනක් තිස්සේ කතා කරනවා. ලක්ෂ 25ක් ගෙන්නලා තියෙන්නේ. මම කියන්නේ අනවසර ඉදිකිරීමක් තියනවනම්, අනවසර වතුර පාරක් තියෙනවා නම්, අනවසර කානු ගොඩකිරීමක් නම්, සභාපතිතුමාට ඒවට අදාළ කටයුතු කරන්න හැකියාව තියෙනවා. තමුන්නාන්සේට කරන්න බැරිනම්, සභාවෙන් අධිකරණයේ නඩුවක් දාලා දෙන්න තමුන්නාන්සේලට නීතීඥවරු ඉන්නවා. මම නීතිඥයෙක් වෙනුවෙන් පෞද්ගලික සල්ලි වලින් හරි වියදම් කරනවා. මොකද ගමේ පවුල් තුන් හාරදාහක් ඉන්නවා. නානායක්කාර මහත්තයාගේ මතක ගෙදරට ගිහිල්ලා එනකොට මමත් වැටුනා. තවමත් ඔලුවෙ කැක්කුම තියෙනවා. හෙල්මට් එක තිබුන නිසා මම යන්තම් බේරුනා. නැත්නම් මොනවා වේවිද කියලා හිතාගන්න බැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම කියන්නේ නිර්භයව, පක්ෂ, පාට භේදයක් නැතුව ඉදිරිපත් වෙන්න මේ කටයුතු ඉටුකර දෙන්න. අද මට මේ දේ සිද්ධ වුණා. හෙට අහිංසක මිනිසෙකුට සිද්ධ වෙන්න පුළුවන්. එහෙම දෙයක් වුණොත් එක හරි පව්. මම ඊයෙ ප්‍රාදේශීය ලේකම් ට කතා කළා. ඒගොල්ලො බෝලේ මෙහාට විසි කරනවා. ඔබතුමා ඒ කටයුත්ත කරන්න අපි ඔබතුමාලට සහයෝගය දෙන්නම්. අද තාක්ෂණ නිලධාරි මහතා නැහැ. මම කිව්වා හැමදාම මේක බලලා යන්න එන්න එපා කියලා. විජිත් සහබන්දු මන්ත්‍රීතුමා ඔබතුමා ඇඹිලි ගැහීම් වලින් ප්‍රවේශම් වෙන්න. ඒක මම කියන්නේ, ඥාති කමටවත් වෙන මොකකටවත් නෙවෙයි අනුන්ගේ දේවල්වලට ඇඹිලි ගහන්න ගිහිල්ලා අමාරුවෙ වැටෙන්න එපා. එයා ගිහිල්ලා කියනවා මේක අවශ්‍ය නැහැ කියලා. ඉතින් එහෙම කිව්වහම ප්‍රාදේශීය ලේකම් කියනවා සහබන්දු කියල කෙනෙක් තමයි කිව්වෙ. මම කිව්වා එහෙනම් විජිත් සහබන්දු කියලා. හරියට හරි. ඒක නිසා මම අවවාද කරනවා. මම මූනට කතා කරන මිනිහෙක්. සල්ලිවලට නැවෙන්න එපා. දේශපාලනයට නැවෙන්න එපා. මේක සියලුම දෙනා මුස්ලිම් සිංහල ද්‍රවිඩ සියලු දෙනා ගමන් කරනවා. ජීවිත හානියක් වුණොත් මෙතන මෙහෙම කතා කරලා වැඩක් නැහැ. ඒ නිසා මම සභාපතිතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිනවා. සිංහල අවුරුද්දෙන් පස්සේ, අපි සල්ලි ගෙනල්ලා තියෙන්නේ, ඒ කටයුතුත කරලා දෙන්න. අපේ ස්වදේශ කටයුතු පළාත් පාලන ඇමතිතුමාගෙන් ඊට වැඩි යමක් කරන්න කියලා ඉල්ලීම් කළා. ඒ කටයුත්තත් කෙරෙන්න පුළුවන්. තමුන්නාන්සේලට වේදනාවක් ඇති වෙයි මේ වගේ වැඩ කටයුතු කරගෙන යන කොට. ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාගෙන් ඔයිට වැඩිය දෙයක් බලාපොරොත්තු වුණා. හිටපු සභාපති අජිත් මහත්තයා ඉන්නවා, උප සභාපතිතුමා ඉන්නවා ඒ අය පරිණතයි. ඔබතුමාට අපි ශක්තිය දෙනවා. විපක්ෂ කණ්ඩායමක් හැටියට නොවෙයි. අනිත් සභා වල වගේ බෝතල් පාර එන්නේ නැහැ. අපේ සහයෝගය දෙනවා. තමුන්නාන්සේ ම නිකන් ආපසු හැරිල බලන්න. අපේ යෝජනා කීයක් ක්‍රියාත්මක වෙලා තියෙනවද කියලා. මාපලගම අර පොල්කොට ටිකයි, ගල් ටිකයි අයින් කර ගන්න තවම බැරි වුණා. ඒ නිසා මම

කියන්නේ ශක්තිමත්ව යන්න. එතකොට ඔබතුමාගේ නම ඉතිහාසයේ ලියවෙයි. අනුන්ට කියලා ඉතිහාස ලියවන්න, බොරු ඉතිහාසය ලියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ශක්තිමත් ඉතිහාසයක් ගොඩ නගා ගන්න කියලා, තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිමින්, තමුන්නාන්සේලා සියළු දෙනාටම සුභ නව වසරකට ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

- ❖ **ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමනි, මට පිළිතුරු දෙන්න අවස්ථාව ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා. මෙන්න මෙහෙමයි facebook එකේ සඳහන් වෙන්නේ. මගේ පියාණන් වන හිටපු සභාපති විලේගේ හේමචන්ද මැතිතුමන්ගේ සංකල්පයක් අනුව සෑම පෙර පාසලකම දරුවෙකුට ප්‍රාදේශීය සභාව මගින් නොමිලේ නිල ඇඳුම් ලබා දීමට කටයුතු කරන ලදී. මේ කිසිම තැනක, මගේ පියා විසින් ප්‍රථම වරට ලබා දුන්නා කියලා කිසිම තැනක සඳහන් වෙලා නැහැ. මුල ඉඳලම කිව්වොත් ''නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු වන පෙර පාසල් පහළොවක් ඇති අතර, ළමුන් පන්සියයකට අධික ප්‍රමාණයක් අධ්‍යාපනය හදාරයි. මෙතරම් පෙර පාසල් ප්‍රමාණයක් නඩත්තු වන දකුණු පළාතේ එකම ප්‍රාදේශීය සභාව නාගොඩ ප්‍රාදේශීය සභාව වෙයි. මගේ පියාණන් වන හිටපු සභාපති, හේමචන්ද්‍ර විලේගේ මැතිතුමන්ගේ සංකල්පයක් අනුව ඒ සෑම පෙර පාසල් දරුවෙකුටම ප්‍රාදේශීය සභාව මගින් නොමිලේ නිල ඇඳුම් ලබා දීමට කටයුතු කර ලදී.

- ❖ **ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ගරු මන්ත්‍රීතුමා ඔය කතාව දැන් නවත්තන්න. නැත්නම් මට නීත්‍යානුකූලව කටයුතු කරන්න සිදුවෙනවා. ඒ නිසා තමන්ගේ වපසරිය දැන ගෙන කතා කරන්න. මූලාසනයට ගරු කරන්න. මූලාසනයට කතා කරන්න.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, අවුරුද්දක කාලයක් තුළ අපේ ප්‍රාදේශීය සභාවට තියෙන ආර්ථිකමය ශක්තිය අනුව යම් වැඩ කොටසක් අපි විසින් සිදුකළා. ඒ වගේම මම විශ්වාස කරනවා. දහතුන්දෙනෙක් වෙනුවට අපි මන්ත්‍රීවරු විසි හත් දෙනෙක් මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරනවා. එක කොට්ඨාශයක් මැතිවරණයේ ඡන්ද වලින් තේරිලා, ඒ වගේම තවත් කොට්ඨාශයක් ඒ අදාල දේශපාලන පක්ෂවලින් තෝරා පත් කරලා එවපු කොටසකුත්, මේ විසි හත් දෙනා දැන් එක හා සමානව දිවුරුම් දීලා ඉන්න අවස්ථාවකදී, මම සිහිපත් කරනවා. මේ විසි හත් දෙනා නොයෙකුත් හැකියාවන් වලින් පිරිපුන් 27 දෙනෙක් කියලා. මා දැකපු දෙයක් තමයි, පක්ෂ පාට භේදයකින් තොරව ජනතාවගේ බලාපොරොත්තුව, ඒකායන අරමුණ මේ 27 දෙනා නාගොඩ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයේ ඉදිරියට ගෙනයන්නට, පළාත් දේශපාලනයට හා මහආණ්ඩු දේශපාලනයට ඇරුණම ප්‍රාදේශීය සභා, ගම්සභා ඇති කරලා ගමේ වැඩකටයුතු කරන්නට තමයි මේ කණ්ඩායම නිර්මාණය කරලා තියෙන්නෙ. ඒ නිසා මේ වෙලාවෙදි මම අදහස් ප්‍රකාශ කිරීමේදී මේ මැතිවරණ ක්‍රමය ගැන පුංචි කණගාටුවකුත් ඇති වෙනවා. මම මීට පොඩ්ඩකට කලින් අපේ චන්ද්‍ර සම්බන්දු මැතිතුමා සමඟ කතා කළේ මේ මැතිවරණ ක්‍රමය ගැන. අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු කිසිම කෙනෙක් ගණන් ගන්නේ නැති තත්ත්වයක් තියෙන්නේ. ඒක අපේ වරදක් නෙවෙයි. මේ මැතිවරණ ක්‍රමය තුළ ඇති ප්‍රශ්නයක්. ඒ වගේම මාධ්‍ය දිහා බැලුවම, ඒ ඒ ප්‍රාදේශීය සභාවන්හි මන්ත්‍රීවරු හැසිරෙන ආකාරය බැලුවම, ඒ

ආකාරයෙන් තමයි හැමදෙනාම ගැනම හිතන් ඉන්නේ. අද මේ සභාවේ කතා කරපු සියලු දේවල් කරන්නට විශාල මුදල් ප්‍රමාණයක් යන්නේ නැහැ. ඒක සක්සුදක් සේ පැහැදිලියි. එනිසා මම යෝජනාවක් ගේනවා ගරු සභාපතිතුමනි, අපි සෑම කොට්ඨාශයකටම එක දවසක් වෙන්කරගෙන, ගරු සභාපතිතුමා, ලේකම්තුමිය සහ පක්ෂ පාට භේදයකින් තොරව ඒ අදාළ මන්ත්‍රීවරුන් සියලු දෙනා එකතු වී, ගමේ සියලු දෙනා සම්බන්ධ කරගෙන, ගම් වල තියෙන ස්වේච්ඡා සංවිධානවල ජනතාව සම්බන්ධ කරගෙන, පන්සලේ හාමුදුරුවෝ, ඒ වගේම ගමේ පාසලේ විදුහල්පතිතුමා ආදී ප්‍රභූවරුන් සම්බන්ධ කරගෙන, ගමේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරමු. ඒ වගේම මේ ස්වේච්ඡා සංවිධානවල විශාල මුදල් ප්‍රමාණයක් සංසරණය වෙනවා. මම කියන්නේ ඒ මුදල් ගන්න කියන එක නෙවෙයි. නමුත් මේ සියලු දෙනා එකතු වී ශ්‍රම ශක්තියෙන් කරන්න පුළුවන් කටයුතු ටික කරන්න අපි වැඩ පිළිවෙළක් හදාගනිමු. ඒ සඳහා මම ගෞරවයෙන් සියලු දෙනාට ආරාධනා කරනවා. මොකද අපි අසමත් වුණොත්, අපේ මන්ත්‍රීවරු විසි හත් දෙනාම අසමත් වුණා වෙනවා. ඔබතුමා ගේ කැපවීම ඉතාමත් හොඳින් තියෙනවා කියලා මම දන්නවා. ඒ නිසා ඔබතුමා යන ගමන් මග, මේ කරන කැපවීම, ශක්තිමත් කරන්න අප සියලු දෙනා සම්බන්ධ කරගෙන, මේ හැකියාවන් තියෙන අයගෙන් වැඩ අරගන්න කියලා මම යෝජනා කරනවා.

ඊළඟට තවත් සඳහන් කිරීමක් කරනවා. උඩවැලිවිටිය කොට්ඨාශයේ අක්කර පහකින් සමන්විත භූමියක් තියෙනවා. මතක ඇති කාලේ ඉඳලා ඉඩම හඳුන්වන්නේ පාසලේ ඉඩම කියලා. පහුගිය වකවානුවේ මේ රජයේ වැඩපිළිවෙලකින්, නිවාස ව්‍යාපෘතියක් සඳහා එම ඉඩම වෙන් කරලා තියෙනවා. ඒ ගැන මම සතුටු වෙනවා. පක්ෂ පාට භේදයකින් තොරව නිවාස ලබාදීම සඳහා සුදුසු නිර්ණායකයන් වලින් එම කණ්ඩායම් තෝරාගෙන තියෙනවා. ඒ පිළිබඳ අපේ කිසිම විරෝධතාවයක්, කනගාටුවක් නැහැ. නමුත් ඔතන තියෙන ප්‍රශ්නය ඒක නෙවෙයි. එදා මම සම්බන්ධීකරණ කමිටුවේදී අහගෙන හිටියා. ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩිම රජයේ ඉඩම් ප්‍රමාණයක් තියෙන්නේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ. නමුත් මෙතරම් ඉඩම් ප්‍රමාණයක් තිබුණත්, ඉදිරි අනාගතයේදී ඉන්න ජනගහනයක් එක්ක බැලුවම, මේ ඉඩම් ප්‍රමාණය ක්ෂය වෙලා යනවා. ඒ වගේම, මේ නිවාස ව්‍යාපෘතියේ එක් පුද්ගලයෙකුට එක් නිවසක් සඳහා ලැබෙන්නේ පර්චස් දහයක්, විස්සක් වගේ ප්‍රමාණයක්. ඒවායේ වගා කටයුතු කරන්නත් අවකාශයක් නැහැ. මම කියන්නේ මෙම නිවාස ව්‍යාපෘතිය සකස් කිරීමේදී මහල් නිවාස වැනි ව්‍යාපෘතියක් කළොත් ඉඩම්වලින් වැඩි ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. මෙය අපේ ප්‍රදේශයේ විතරක් නෙවෙයි. සියලුම ප්‍රදේශවල එසේ කරනවා නම් ඉඩම් ප්‍රශ්නයට විසඳුමක්.

ඒ වගේම අපි තරයේ දැඩි විරෝධය ප්‍රකාශ කර සිටියා. එදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණ කමිටුව තිබ්බ දිනයේ දී, මම ගමේ මිනිස්සුත් සමග ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිය අවස්ථාවේදී ප්‍රාදේශීය ලේකම්තුමිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක් කියලවත් සත පහකටවත් ගනන් ගත්තෙ නැහැ. අඩුම තරමේ ඉඳගන්න ආසනයක්වත් දුන්නේ නැහැ. මාධ්‍යවේදී මහත්වරුන් ආදී සියලු දෙනා ඉඳගෙන හිටියේ. නමුත් මම කතා කළේ හිටගෙන ඉඳන්. අපේ මන්ත්‍රීවරු විසි හත් දෙනා වෙනුවෙන් මම මගේ කණගාටුව ප්‍රකාශ ගන්නවා. මම කියන්නේ අද මට ඒ දේ සිද්ධ වුණා. මම ඉතාමත් අපහසු තාවට පත් වුණා. හෙට තවත් මන්ත්‍රීවරයෙකුට ඒ දේ සිදුවෙන්න පුළුවන්. අවසානයේ මම සභාපතිතුමාට දුරකථන ඇමතුමක් අරගෙන කිව්වා. මම දොර ළඟ ඉන්නවා. ලේකම්තුමියට කියන්න කියලා. ඔබතුමා ඒ වෙලාවෙ කතා කළා. ඉඩම ළඟදී මම මන්ත්‍රීවරයෙක් විදියට අදහස් ප්‍රකාශ කලා. ඒ නිසා එතුමිය මාව දන්නවා. ඒ වගේම මේවා රජයේ ඉඩම්. අපි පක්ෂ පාට භේදයකින් තොරව මුළු ගමම ඒ සඳහා විරෝධය ප්‍රකාශ කරනවා. ඒ ඉඩම බෙදන්න එපා. මොකද රජයේ වැඩ පිළිවෙළක් කරන්න අවකාශ තියන හොඳම ස්ථානය තමයි එතන. බෙදා දුන්නට පස්සේ කතා කරලා වැඩක් නැහැ. මම මේ පිළිබඳව දේශපාලන කෝණයෙන් කතා කරන්නෙ නැහැ. ඒ

වෙලාවෙ අපේ ඉහළ දේශපාලන අධිකාරියේ මැති ඇමැතිවරු පවා ඔය සඳහා විරෝධය ප්‍රකාශ කරලා තිබුණා. මේ සම්බන්ධව මට ලොකු චෝදනාවකුත් තියෙනවා. අර ඉඩම්ලාභීන් මට යන යන තැන බනිනවා. මම ඒකට විරුද්ධ වෙලා වැඩ කරනවා කියලා. නමුත් මම ආණ්ඩු ගැන නෙවෙයි කතා කරන්නේ. යම් අවස්ථාවක අපිට ආණ්ඩුවක් ආවොත්, අපේ රජය යටතේ ඔය ඉඩම් ලැයිස්තුවේ සියලු දෙනාට ඉඩම් ලබාදීමේ වගකීම මම සම්පූර්ණයෙන්ම බාර ගන්නවා. මම කියන්නේ නැහැ. එතන දේශපාලන වශයෙන් හැම කෙනාම ඉන්නවා. ගැටළුවක් නැහැ. ඒ අහිංසක මිනිස්සු ටිකක්. ඒ වගේම අපේ වනමල් මන්ත්‍රීතුමා ලක්ෂ 6 කට සමෘද්ධිය දෙනවා කියලා බොහොම උජාරුවෙන් කතා කළා. අපේ රටේ දිළිඳු සහන පනතක් තියෙනවා. ඒ දිළිඳු සහන පනතේ තියෙනවා රුපියල් තුන්දාහක් තමයි ආදායම. භූමිතෙල් මුද්දරය ඇතුළුව මුද්දර ලබාදීමේ අවකාශය. මම සමෘද්ධි අමාත්‍යාංශයේ සේවකයෙක් විතරයි. මම සමෘද්ධිය දෙන ඇමති නෙවෙයි. හැබැයි මට කියන්න තියෙන්නෙ ඔබතුමා සඳහන් කළා, 2015 ට පෙර ඉතා අඳුරු යුගයක් තිබුණා. 2015 වෙන් පස්සේ මේ අය වැයෙන් ලක්ෂ හයකට සමෘද්ධිය දෙනවා කිව්වා. එකේ තේරුම තමයි ඉතාම දුප්පත් පිරිසක් මේ රටේ බිහි වෙලයි කියන එක. එය සතුටු වෙන්න කාරණයක් නොවෙයි. පිටරටින් ණය අරගෙන දුවන මේ ආර්ථික රටාව තුළ ලක්ෂ 6 කට නිකන් කන්න දුන්නොතින් මම දන්නෑ මේ රට කොහේ යයිද කියලා.

ඒ වගේම දැන් හැම මාධ්‍යයකින්ම අති විශිෂ්ඨ ලෙස අයවැය ජයග්‍රහණය කලයි කියලා ප්‍රචාරණය වුණත්, මේ අයවැයෙන් අපි ණයකාරයන් කරන එක තමයි කරලා තියෙන්නෙ කියලා තමයි අපට පේන්නේ. ඒක මේ අය විතරක් නෙවෙයි ඉතිහාසෙ සෑම අයවැයකදිම ණය වෙලා තමයි කටයුතු කරන්න වෙලා තියෙන්නෙ. මේ අය වැයේදී ගොඩක් දුරට දේශීය කෘෂිකර්මාන්තය අමතක කරලා තියෙනවා. දේශීය වශයෙන් තියෙන ගොරකා, ගම්මිරිස් වගේ දේවල් වලට සම්පූර්ණයෙන්ම ඇණ ගැහුවා වගේ තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඒ නිසා ජන ජීවිතය ඉතාම අමාරු තත්ත්වයකට පත්වෙලා තියෙනවා. වෙනදනම් දේශීය කෘෂි කර්මාන්තය නංවාලීමට සහනාධාර වැඩපිළිවෙලක් යෝජනා කරනවා. නමුත් වර්තමානයේ කෘෂි කර්මාන්තය වෙනුවෙන් යෙදුණු නිලධාරීන් කාර්යාලවල නිකරුනේ වේලෙනවා. ඒ සඳහා සුදුසු නායකත්වයක්, වැඩපිළිවෙළක් නැහැ. අපේ වැඩිහිටියෝ ඉස්සර අවුරුදු කැවේ ගොරකා, ගම්මිරිස්, කරුංකා විකුණලා. අද ඒ තත්ත්වය නැහැ

ඊළඟට මම කතා කරන්නේ උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ මාර්ගය අපේ ඉනෝකා මන්ත්‍රීතුමිය යම් ව්‍යාපෘතියකින් ලක්ෂ විස්සක් වැනි මුදලක් යොදවලා පාර කොන්ක්‍රීට් කළා. කොන්ක්‍රීට් කරන්න ඉස්සර වෙලා ඔබතුමිය දන්නවා ඒක මම මේ සභාවට භාර දීලා තිබුනා. අපි ශ්‍රමදාන මට්ටමින්, තාක්ෂණ නිලධාරි මහත්තයාගේ අධීක්ෂණය යටතේ ඒ කටයුත්ත සිදු කළා. ඒ සඳහා දැන් මාස හයක් විතර වෙනවා. ගරු සභාපතිතුමාගෙන් අවසර ඇතුව තමයි අපි ඒ කටයුත්ත කළේ. ඒ සඳහා මුදල් ගෙවීම් කටයුත්තක් කරන්න තියෙනවා. ඒ සඳහා අවශ්‍ය සියලු දේවල් භාර දීලා තියෙන්නෙ. ඒ ගැන ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියලා ගෞරවයෙන් සිහිපත් කරනවා.

උඩවැලිවිටිය කොට්ඨාශයේ 2019 සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් සිංහ ප්‍රජා සංසදය එකතු කරගෙන ඉතාමත් සාර්ථක අන්දමින් පස්වෙනි වරටත්, සංවිධානය කරනු ලබන අවුරුදු උළෙල අප්‍රේල් මස 15 වන දින පවත්වනවා. ඒ සඳහා පැමිණෙන්න කියලා සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට ආරාධනා කරනවා. පැමිණෙන ඔබතුමන්ලා වෙනුවෙන් දිවා ආහාරය සූදානම් කරලා තියෙනවා. සිද්ධාලේප හෙට්ටිගොඩ ආයතනය, අපේ මාධ්‍යවේදී හේමපාල මැතිතුමාගේ අනුග්‍රහයෙන් ලංකාදීප, මව්බිම පුවත්පත්වල අනුග්‍රහයෙන් තමයි මේ උත්සවය පවත්වන්නේ. නැවතත් ඒ සඳහා සියලු දෙනාටම ආරාධනා කරමින්, සියලු දෙනාට සුබ අනාගතයක් පතමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රීනී කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද, ලේකම්තුමියගෙන්ද, සියළුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගෙන් ද අවසරයි. මම අද දින සභාව අමතන්න නෙවෙයි සිටියේ. නමුත් අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා උඩවැලිවිටිය ගම ගැන සඳහන් කිරීමත් සමඟ මටත් නැගිටින්න අවස්ථාව සැලසුණා. උඩවැලිවිටිතලාව අබරයි ගොවිපල අසල තියෙන ඒ ඉඩම සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් අනුව, නිවාස විසිපහකට බෙදන්න යෝජනා කරලා තියෙනවා. ඒ අනුව ඒ නිවාසලාභීන් පළවෙනි දිනයේදී ඒ ඉඩම සුද්ද කළා. දෙවැනි දවසේ තමයි ඔය විරෝධය ආවේ. එම විරෝධය අවස්ථාවට ලක්රුවන් මන්ත්‍රීතුමා පැමිණ සිටියා. ඔවුන් ප්‍රකාශ කළේ එය පාසලට අයත් ඉඩමක් විදියටයි. නමුත් ප්‍රාදේශීය ලේකම්තුමිය මේ අවස්ථාව වන විට එය නියමිතවම පාසලට අයත්ද කියලා පරීක්ෂණයක් පවත්වනවා. ඒ අනුව තමයි එම ඉඩම බෙදීම තාවකාලිකව නැවැත්තුවේ. නැතුව සම්පූරණයෙන් නැවැත්තුවෙ නැහැ. ඒ මගින් අපේ ගමට ලැබෙන්න තිබුන කෝටි ගානක මුදලක් අහිමි වෙන්න යනවද කියලා මට සැකයක් ඇතිවෙනවා. විසි පස් දෙනාට පමණක් නිවාස හිමිවුවත්, ගමේ බ්ලොක් ගල් හදන මනුස්සයගෙ ආදායම වැඩිවෙනවා. පෙදරේරු මහත්මයාගේ ආදායම වැඩි වෙනවා. ඒ විදියට ගමට එන මුදලක් තමයි අපිට අහිමි වෙන්නේ. ඒ වගේම සජිත් ඇමතිතුමා පැමිණෙන විට සියලු පාරවල් කාපට් කරනවා. ඒ වගේ අවස්ථාවක් තමයි අහිමි වුනේ. එම ඉඩම් ලබා දීමේදී පක්ෂ, පාට භේදයක් බැලුවේ නැහැ. එහෙම තිබුන නම් ඔවුන් කියාවි. අපේ පක්ෂයේ අයට විතරක් ලබාදීලා කියලා. එතුමාගේ අදහස තියෙන්නෙ එතුමන්ලාගේ රජයක් යටතේ මේ ඉඩම් බෙදා දෙන්න. මොකද මේ අවස්ථාවේ දී ඒ බව සඳහන් කළා. අපේ රජයක් යටතේ සියළු දෙනාට ඉඩම් ලබා දෙනවා කියලා කිව්වා. ඉතින් එය ගමට ලැබුණු සම්පතක් කියලා තමයි මම හිතන්නේ. ඒ ගැනත් මතක් කරමින්, මම මගේ කතාව අවසන් කරනවා. සියලු දෙනාට ස්තුතියි.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමනි, සියලු මන්ත්‍රීවරුන්, ලේකම්තුමිය, මාධ්‍යවේදී මහතා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. මම මුලින්ම අපේ නව ලේකම්තුමියට සුභ පතනවා. සියලු කටයුතු හොඳින් කරගෙන යන්න අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබෙන්න කියලා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි අතින් යම් කිසි වැරද්දක් වුනොත්, ඒ වැරැද්ද මොකද්ද කියලා කවුරුහරි පෙන්වා දුන්නොත්, අපි ඕන වෙලාවක සමාව ගන්න ලෑස්තියි. අපි ඉතිහාසයේත් එහෙමයි. මෙතන ඉන්න ජේෂ්ඨතම මන්ත්‍රීවරයා විදියට, සුසන්ත මන්ත්‍රීතුමා වුණත් එතුමගෙ වචන ආපස්සට ගන්න කැමතියි. වැරැද්දක් වුනහම ඒක නිවැරදි කලාම මදිපුංචිකමක් සිදුවන්නේ නැහැ. අපි අතින් වැරදි අඩුපාඩු සිදුවෙනවා. ඒක නිහතමානීව පිළිගන්න පුළුවන් නම්, එයා හොඳ මහත්මයෙක්. පහුගිය දවස් වල කතා කරනකොට මගේ අතින් වචන අඩු පාඩුවක් වුණා. මම විජිත් සහබන්දු මහත්මයාගෙන් සමාව ගත්තා. මටත් ඒ ගැන ඇත්තටම කනගාටුයි. අපි කොයි වෙලාවකවත් අපේ අඩුපාඩු පෙන්නලා දුන්නම ඒකට තර්ක කරන්න ගියේ නැහැ.

ගරු සභාපතිතුමනි, පොදු දේපල අඳුනගන්නෙ කොහොමද කියන එක, විශේෂයෙන්ම අපි මේ පරිහරණය කරන දේවල් පොදු දේපල ද? එහි අයිතිය කොහොමද? එම ක්‍රමවේදය තුළ මේ පිට්ටනි ලොකු ප්‍රශ්නයක් වෙලා තිබුණා. අජිත් මහත්තයා නම් කොහොමහරි විසඳ ගත්තා. නමුත් අපටත් ඒ ප්‍රශ්නෙම ඇති වෙලා තියෙනවා. මාපලගම පිට්ටනිය, ඌරල පිට්ටනි ගානක් තියෙනවා. බීඩී5 මාමාණදොල මේ හැමතැනම පොදු ක්‍රීඩාංගන පොදුවේ පාවිච්චි කරනවා නම් ඒ නිර්ණායකය තුළ අපට පොදු කියලා හැඳුන්වුවාම, ඔබතුමාට පුළුවන් මේ සභා තීරණය අනුව ඒක පොදු දෙයක්. මේක අපි පාවිච්චි කරනවා කියලා බලතල දෙන්න. එවිට අපට පුළුවන් ඒ සඳහා මුදල් වියදම් කරන්න. පොදු දේපල කියන්නේ මොනවද, ඒක පොදුවේ පාවිච්චි වෙන්නෙ කොහොමද කියන එක සභා පනතේ අර්ථකථනය කරලා තියනවා. ඔබතුමා ඒ අවධානය යොමු කරන්න අපි මුදල් ගෙනැල්ලා තියෙන්නේ. මේ කාර්යය පස්සට ගියොත් ඒ මුදල් වෙනත් තැනකට යාවි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා

සිටින්නේ ඔබතුමාගේ බලතල අනුව මෙන්න මේ දේ පොදු දෙයක් කියලා ඔබතුමා තීරණය කරන්න. ඒ වගේම මාමණදොල පිට්ටනිය සභාවට අයිති කියලා මන්ත්‍රීවරු කියනවා. ඔබතුමා කියනවා, මම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් එක්ක ඒක බේරගන්නම්. ඒ වෙනුවෙන් අපිට කොළඹ ගිහිල්ලා ලොකු වැඩ ටිකක් කරගෙන එන්න වෙනවා. අන්තිමට මිනින්දෝරු මහත්මයාට සල්ලි ගෙවන්න වෙන්නේ මේ ආයතනයෙන්. ඒ මොකුත් නැතුව අධි භාරයකට කොහොමවත් අහුවෙන්නේ නැහැ. ඔබතුමා කියනවනම්, ඒක ගමේ පොදු ක්‍රීඩා පිටිය කියලා, ඒ ඇති. අපි මාමනදොල පන්සලට ලක්ෂ හතළිහක් දුන්නා. නමුත් ඒකෙත් අපට අයිතියක් නැහැ. 70 කන්දටත් මුදල් ප්‍රමාණයක් අපි යොමු කරලා තියනවා ඒකෙත් අයිතියක් නැහැ. බණ්ඩාරනායකපුර එකෙත් තවම ඔප්පුව නීත්‍යානුකූල මට්ටමට ඇවිල්ල නැහැ. 18 පන්සලටත් දුන්නා එකෙත් ඔප්පුව නැහැ. අපි කණගාටු වෙනව අපේ සල්ලි වලට දාපු බැරියර් එකක් මේක. වෙනවා. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ සමන් මන්ත්‍රීතුමා පාලම් පිළිබඳව කතා කළා. අපි මුල්ගල් තියපු සෑම පාලමක්ම මේ මාසය අවසන් වන විට වැඩ පටන් ගනීවි. ඒ වගේම මුල් ගල් තියන්න හඳුනාගත් තව පාලම් විසි හතක් තියෙනවා. ඒ පාලම් 27න් ඕනනම් දෙකක්, තුනක් බෝක්කු තත්ත්වයට පත්වේවි. නැත්නම් පැහැදිලිව හඳුනාගත් පාලම් 27ක් තියෙනවා. ඒ විසි හතම අගෝස්තු මාසයට කලින් මුල්ගල් තියනවා. සමන් මන්ත්‍රීතුමා, ඔබතුමාටත් එහෙම වුවමනාවක් තියෙනවා නම්, ඒ පිළිබඳව විස්තර දෙන්න. අනිවාර්යයෙන්ම ඒක කරනවා. විජිත් සහබන්දු මන්ත්‍රීතුමාට මම කියනවා. එතුමාගේ ගෙදර ළඟ පාලමත් හදනවා. නමුත් අනිත් පැත්තට යන්න විදියක් නැහැ. පාරේ එහා පැත්තෙ යන්න තැනක් නැහැ කියල එතුමන්ලා දන්නවා. පතිනායක මන්ත්‍රීතුමත් එක්ක මම කතා කළා. නාගොඩ ප්‍රාදේශීය සභාව තුළ හඳුනාගත් සියලු පාලම් ටිකේ වැඩ අපි ඉවර කරනවා. ඒ සඳහා සම්පූර්ණයෙන්ම යකඩ ගෙන්වන්නේ නෙදර්ලන්තයෙන්. ඒ වගේම ඒ පාලමේ ඇස්තමේන්තුව තියෙන්නෙ මීටර් 8 ඉඳන් මීටර් 30 වෙනකම්. වජිර අබේවර්ධන ඇමතිතුමා අත්සන් කරපු පාලම් එකකින්වත් ගඟ හරහා පාලමක් දාන්න බැහැ. මොකද පාලමක් දාන්න පුළුවන් උපරිම මීටර් 30 යි. මේව අයවැයෙන් කරන දෙයක් නෙවෙයි. ඒ වගේම අපි හඳුනා නොගත් ඔබතුමාලා හඳුනානොගත් ජනතාව හඳුනාගත් තැනක් තියෙනවා නම් අපේ මන්ත්‍රීවරයෙකුට දෙන්න. අපි පුළුවන් ශක්ති ප්‍රමාණයෙන් ඒක කරනවා. මාමනදොල පන්සලට දහම් පාසලක් ආරම්භ කරන්න ගොඩනැගිල්ලත් දුන්නා. ඒ වගේ ගොඩනැගිලි නැති තැන් තියෙනවා නම් ඒ ගැනත් කියන්න. අපේ විශේෂ අවධානය යොමුකරලා, අපි අපේ බලධාරීන්ට කියන්නම් ආසන සංවිධායකයකට තමයි ඒවයි බලේ තියෙන්නෙ. මාමනදොල, අක්කර 80 දෙකේම දහම් පාසල් නැහැ. ඒවත් පටන් ගන්නවා. සභාපතිතුමාගේ ප්‍රාදේශීය සභා පාරක් අපි ලක්ෂ එකසිය ගානක් වෙන්කරලා තියෙනවා. පාර හදන්න. මේවා විවෘත කරන දාටත් හැමෝම එන්න. හැබැයි මේ සල්ලි ගේන්නේ අපි කියලා මතක තියාගන්න. අපි අපේ ප්‍රාදේශීය සභාවට මොකක්හරි යෝජනාවක් දැම්මම ඒක විසික් කරල දානවා. ඒ ගැන කණගාටු වෙනවා. ඒ වගේම ලබන්නාවූ සිංහල අළුත් අවුරුද්ද, සියලු දෙනාටම වාසනාවන්ත සුබ අලුත් අවුරුද්දක් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

ගරු නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා කතා කරන අතරෙ මම වෙලාව ගන්නවා. ගරු සභාපතිතුමනි, පනතේ බොහොම පැහැදිලිව තියෙනවා. යම් මාර්ගයක් හෝ වෙනත් දේපලක් යම් බහුතර පිරිසක් භුක්ති විඳිනවා නම්, ඒක ප්‍රාදේශීය සභාව විසින් වැඩි දියුණු කිරීමට, පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න පුළුවන් කියලා තියෙනවා. එනිසා ඔබතුමාට මේකෙ සභා තීරණයක් අරගෙන, පනතේ තියෙන වගන්තිය දක්වලා ප්‍රාදේශීය ලේකම්ට ලියුමක් ලියන්න පුළුවන් මෙන්න මේ ප්‍රාදේශීය සභා පනතේ අසවල් වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව සහ අසවල් දින සභා තීරණය මත, මෙම ක්‍රීඩා පිටිය ප්‍රාදේශීය සභාව මගින් පරිහරණය කරන ක්‍රීඩා පිටියක් බැවින්,

රජයේ මුදල් යොදා සංවර්ධනය කිරීමට මෙයින් අනුමැතිය ලබා දෙමි. අනුමැතිය දෙනවද නැද්ද කියල විතරයි අහන්නේ සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නෙ, ඔබතුමාගේ උපදෙස් පරිදි ලේකම්තුමිය මේකට වහාම යොදවලා, පනත පිළිබඳ අධ්‍යානයක් කරලා, වැඩි කාලයක් එපා. අපට පනතේ වගන්තිය පෙන්නලා දෙන්නත් පුළුවන්. ඒක ඒ ආකාරයෙන් සඳහන් කරන්න නිලධාරියා දක්ෂ විය යුතුයි. එතකොට ඔබතුමා ආරක්ෂා වෙනවා. පනතේ තියෙන වගන්තියක් ඉස්මතු කරල ඒ සමග පරිහරණය කරන බව සහ සභා තීරණය දැනුම් දිය යුතුයි. අසවල් දිනයේ ගනිපු සභා තීරණය මත මා වෙත පැවරී ඇති බලතල අනුව, මේ ක්‍රීඩාංගනය පරිහරණය කරනවා කියලා දන්වන්න. ගරු සභාපතිතුමනි, දැන් ඔය විදියට පළාත් සභාවේ පසුගිය දවසේ උඩුගම දකුණ පෙර පාසැල් මිදුල සංවර්ධනය කළා. මම හිතන්නේ ලක්ෂ හයක් විතර ගියා. ප්ලෑන් එකක් ඇඳලා තිබුනා විතරයි. ඉඩම නිවාස සංවර්ධන අධිකාරියට තියෙන්නේ. ඉඩම එහෙනම් අපට මුදල් දාන්න බැහැනෙ. ඒ උනාට ඒකට අපි මුදල් යොදවනවා. මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනයේ සංවර්ධනයක් ආවොත්, මේ මන්ත්‍රීවරු උපදින්න කලින් ඉඳලා අපි ක්‍රීඩාංගණය පරිහරණය කළේ. එවිට අපිට සල්ලි යොදවන්න බැරි වෙනවා. ඒක නිසා තමයි මම කිව්වේ, ඔබතුමා තනියෙන් වගකීම ගන්න එපා. පනතෙන් බලගන්වපු ඒ වගන්තිය, අද මේ යෝජනා අනුව ගනිපු සභා තීරණයකුත් එක්ක ඉදිරිපත් කරන්න. මේක නන්දන මන්ත්‍රීතුමාට, සහබන්දු මන්ත්‍රීතුමාට පමණක් නෙවෙයි. පොදුවේ කාටත් බලපාන ප්‍රශ්නයක්. ඒ සමහම අපි අහන්න කැමතියි. ගරු සභාපතිතුමනි, දැන් මේ සල්ලි ගේන්න පුළුවන් උඩුගම දකුණ ක්‍රීඩාංගණයට. මොකද ඉස්කෝලේ විදුහල්පතිතුමා වන අපේ මන්ත්‍රීතුමත් ඉන්නවා. ඒ දරුවො ටික සෙල්ලම් කරන්නෙත් ඒකේ. අපිට ප්‍රේක්ෂකාගාරයක් ඉදි කරන්න සල්ලි තියෙනවා. නමුත් අයිතිය පිළිබඳ ප්‍රශ්න ආවහම හතර වටේ යන්න බැහැ. ඊළඟට ක්‍රීඩාංගන දෙකකට ගිහිල්ලා ගොඩක් අපහසුතාවයන්ට පත් වුණා. මාමානදොල සල්ලිත් නැවත යනවා. අපරාදේ සල්ලි කාගේ වුණත්, ඔබතුමාගේ, අපේ බලප්‍රදේශ. එනිසා මේ ක්‍රීඩාංගන අප සතු ක්‍රීඩාංගන හැටියට සංවර්ධනය කරන්න ඔබතුමා නිසියාකාරව කටයුතු කරන්න. මේ මොහොතේදී ප්‍රාදේශීය ලේකම්තුමා ඔබතුමාට දෙන උත්තරේ තමයි. සභාපතිතුමා අපිට කිසි ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා මේක සභාව සතු ක්‍රීඩාංගණයක් කියලා ඔබතුමා කියනවනම් කමක් නැහැ. අපි මේක කරන්නම්. අපිට ෆයිල් එකට දාගන්න ඒ ලියුම විතරයි ඕන. ඒ නිසා පනතේ වගන්ති ඉස්මතුකරලා, සභා තීරණය දාලා, පරිහරණය කරන ක්‍රීඩාංගනයක් වන බැවින්, මේ ක්‍රීඩාංගනය මුදල් යොදා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ලිපියක් දෙන්න. ඒ කටයුතු පිළිබඳ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. සභාපතිතුමනි, දැන් අර පාරවල් ලැයිස්තුවක් තියෙනවා. ඔබතුමා ඒකට අනුමැතිය දෙන්නෙ අපේ හින්ද නෙවෙයි පරිහරණය කරන නිසා. ඉතින් සභාපතිතුමා මේ අයිතිය ඉල්ලන එක හරි අසාධාරණයි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. මුලින්ම මම කියනවා අපි සභාව මෙහෙය වන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ රටේ ප්‍රාදේශීය සභාවේ සියලු කාර්යයන් කරන්න එයාලයි කියන මතයකට මේ සභාව පත්වීම පිළිබඳව මම විශේෂයෙන්ම අපේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගෙ දූර්වලතාවය පිළිබඳව මේ අවස්ථාවේ දී කණගාටුව ප්‍රකාශ කරනවා. මේ මන්ත්‍රීවරුන්ට මම අභියෝග කරනවා. උඩලමත්ත මීපෙ ගෙදර පාලම තමයි මාමනදොල පාලම කියලා බෝඩ් එක ගහලා තියෙන්නේ. බෝඩ් එකේ ලක්ෂ තුන්සිය ගානක් තියෙනවා. ඒකෙ ආරම්භයේ ඉඳන් ටේප් එක අල්ලලා, පාලම් 1000 ව්‍යාපෘතියට ඇතුලත් කරලා, මහ ගංවතුරට ගසාගෙන ගිහිපු මීපෙ ගෙදර පාලම වෙනුවට අපි යෝජනා කරල ලැබුණ පාලම තමයි මාමණදොල පාලම. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් සහය අධ්‍යක්ෂක, බන්දුල මහත්මයා ගොඩක් නිවැරදි කරුණු දන්නවා. මම අනිත් පාලම් ගැන කියන්න යන්නේ නැහැ. දැන් මේ ආණ්ඩුව පත් වුණාට පස්සේ බෝඩ් එක ගහලා විවෘත කිරීමේ උත්සවයක් තියලා, ඒක විතරයි මෙතුමන්ලගෙන් කෙරුනෙ.

ජනතාවගේ ඉල්ලීම මත, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම, දකුණු පළාත් අමාත්‍ය යූ.ජී.ඩී. ආරියතිලක මහත්මයාගේ ඉල්ලීම මත, නිශාන්ත මුතුහෙට්ටිගම මහත්මයාගේ ඉල්ලීමට අනුව තමයි මම ගමේ මහජන නියෝජිතයෙක් විදිහට මැදිහත් වෙලා, 99% ක්ම කාර්යයන් කරල තියෙන්නෙ. බෝඩ් එක දාන්නයි, සමරු ඵලක හයි කරන්නයි තමයි ආවේ නැත්තේ. ඒ වගේම ඒ පාලමට ඉදිවන මාර්ගයේ ඉඩම් පවරා ගන්න මිනිස්සුන්ගෙන් කැමැත්ත අර ගත්තෙ මම. හම්බන්තොට පාලම් 1000 ව්‍යාපෘතිය සිදු කරන අය කිව්වේ ඉඩම් හිමියන්ගේ කැමැත්ත නැතුව පාලම් හදන්න බැහැ කියලා. ඒ නිසා ඒ මිනිස්සු කැමති කරගෙන, ඒ වගේම පාලමෙන් අනිත් පැත්තට වැටුණු ගමන් නඩුවක් තියෙනවා. ඒ නඩුව තියෙද්දි, ඒ නඩුවට හවුල් වුණ මිනිස්සු කැමති කරගෙන, උසාවියටත් දැනුම් දීලා ඒ සියලු කටයුතු කළේ මම. ඒ ලියුමෙ පිටපතක් මම ළඟ තියෙනවා. මම අභියෝග කරනවා මේ අයට පුලුවන්නම් කියන්න ඒක නෙවෙයි මේ පාලම කියලා. ඒ වගේම රෑ එළි වෙනකොට ව්‍යාපෘතියක් පටන් ගෙන ඇස්තමේන්තුවක් නැතුව ටේප් එකක් අල්ලන්නේ නැතුව, ජනතාවගේ ඉල්ලීමක් නැතුව, පාලම් දාන්න පුලුවන්නම් මේ රට ලෝකේ කොතන තියේවිද? සහබන්දු මහත්තයා කිව්ව වගේ 91 ඉඳන් ප්‍රාදේශීය සභාව ගැනත් කියන්නම්. සභාපතිතුමාගෙන් මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා ඔබතුමා නොසැලී ඉන්න. ඔබතුමාට විසඳන්න පුළුවන් ගැටළු තුන හතරක් තියෙනවා. ඒ විසඳන්න ඕන ගැටලු ක්‍රමානුකූලව විසඳන්න. හිටපු සභාපති වරු මේ ගැටලු විසඳුවනම් අද මේ ප්‍රශ්න නැහැ. ඒ වගේම නැහිනිගල පාරෙ වරුසාවට ආව බොරළු විශාල ප්‍රමාණයක් මම දැක්කා. ඒ වෙලාවේ තමයි කාටත් ඇහැරුනේ. උපන්දා ඉඳන් මියයනකම් හිටපු ජනතාවට ඒක පෙනුනේ නැහැ. ඒ මනුස්සයාගේ පැත්තට කතා කරනවා නෙවෙයි. ඒ මනුස්සයා තාප්පය බැන්දා. ඒ නිසා සභාපතිතුමනි, මම කතා කරන්නේ මූලාසනයට. ඔබතුමා විධිමත්ව නීත්‍යානුකූලව කටයුතු කරන්න.

ඒ වගේම ගරු සභාපතිතුමා තවත් ගැටළුවක් තියෙනවා. වටවල වැව්ලි සමාගමේ කටුපොල් වගාව පිළිබඳව. ඒ කර්මාන්තශාලාව පිළිබඳව අද රටේ පාරිසරික ඇමති ජනාධිපතිතුමා මොකක්ද ගත්ත ක්‍රියාමාර්ගය, මේ කටුපොල් වගාව නවත්තන්න මධ්‍යම රජයට බැරි වුණා. ප්‍රාදේශීය සභාවක් වශයෙන් ඔබතුමාගේ බලතල අනුව, අද මේ කර්මාන්ත ශාලාව ආරම්භ කරලා පාරිසරික බලපත්‍ර දීලා තියෙනවා. කටුපොල් වගාවෙන් පීඩා විඳින පුද්ගලයෙක් හැටියට 1997 වර්ෂයේ ඉඳන් මමත් කතා කරනවා. අපි දැන් මේ ගන්න කියන තීන්දුවට එන්න කිසිම කෙනෙකුට බැරි වුණා. මේ කර්මාන්ත ශාලාව පවත්වාගෙන යමින් මේකට විසඳුම් හොයනවා මිසක් වෙන විසඳුම් නැහැ. අද වුණත් වගාව නවතිනවා නම්, මම හරි කැමතියි. කර්මාන්තශාලාව නතර වුනොත් විශාල පිරිසක් අනාථ වෙනවා. ඒ නිසා ඔබතුමාට උපදෙස් දෙන අයගෙන්, නිලධාරීන්ගෙන් සාකච්ඡා කරලා හොඳ තීන්දුවක් ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ ප්‍රාදේශීය සභාවේ දිගින් දිගට ඇදී යන ප්‍රශ්නයක් තමයි. අපේ අයිතිය. ප්‍රාදේශීය ලේකම්තුමිය එවනවා සංවර්ධනය කරන්න අපේ අයිතිය ඉල්ලලා. ගොඩනැගිල්ලක් හදන්න, පිට්ටනියක් සකස් කරන්න අපේ අවසරය ඉල්ලනවා. මේ පාරවල් කීයක් සංවර්ධන කරනවද? නමුත් එතුමිය කාගෙන්ද අවසර ගත්තේ? අපේ නොවන පාරවල් වලට අවසර අරගෙන තියෙනවද? අඩුම ගණනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියටවත් ඔප්පුවක් තියෙනවද කියලා මම දන්නේ නැහැ. ඒ සඳහා මොකද්ද තියෙන විසඳුම. මේවට චක්‍රලේඛ එවලා, ලියුම් හදන අයත් දැනගන්න ඕන මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න. සභාපතිවරුන්, නිලධාරීන් ලේකම්වරු, මධ්‍යම ආණ්ඩුවේ ඇමතිවරු ගෙන්නලා ඒව සාකච්ඡා කරන්න ඕන. දැන් මෙතුමා අපහසුතාවට පත් වෙලා. ඒ නිසා ගරු සභාපතිතුමා, එක එක්කෙනාගෙ ඉල්ලීම් අනුව, යෝජනා අනුව මැදිහත් නොවී, හොයලා බලලා කටයුතු කරන්න කියලා ඔබතුමාට මතක් කර සිටිනවා.

ඒ වගේම උඩුගම පොළ පිළිබඳව කතා කළා. අපේ වෙරංග ගරු මන්ත්‍රී තුමා සෑහෙන උත්සාහයක් ගන්නවා පොල නව ගොඩනැගිල්ලට ගෙනියන්න. අප්‍රේල් වලට ඉලක්ක කරගෙන හිටියත් ඒක කරගන්න බැරි වුණා. එතුමාගේ මිනිස්සු ගෙන්නලා ඇප්තොප් එකෙන් ගස් කපාගෙන ඇවිල්ලා

හැඳුවා. සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා වගේ ඒ ලී දඬුත් නැහැ. නමුත් අපට බැරිවුණා. තව කීයක් හරි වියදම් කරලා ඒකට උදව් කරලා ඒ කටයුත්ත කරන්න. උඩුගම පොළේ ගොඩක් අඩුපාඩු තියෙනවා. විශේෂයෙන් උඩුගම මන්ත්‍රීවරු, මේ උඩුගම පොළෙන් ලබාගන්නා වූ ආදායමට සරිලන මුදලක් මේකට වියදම් කරළා මේක නඟා සිටුවන්න කටයුතු නොකිරීම පිළිබඳව කනගාටු වෙනවා. ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, අද මේ පරිපාලනයත් එක්ක සියල්ල සිදු කළාට හෙට වෙනකොට මේ පරිපාලනය සියල්ල වෙනස් වෙනවා. ඒ නිසා ඔබතුමන්ලා මේ අවස්ථාවේදී ශක්තිමත්ව මේවට මුහුණ දීලා, මේ කියන සියලු දේවල් සියලු සංවර්ධන කාර්යයන් කරන්න පුළුවන් වුණානම් මීට අවුරුදු තුනකට කලින් කරලා. ඒ නිසා මේවා අපි කියන්නේ නැහැ සාර්ථක වෙයි කියලා. ප්‍රාර්ථනා කරනවා කරන්න පුළුවන් වෙන්න කියලා. ඒවට සැලෙන්නේ නැතුව අපි අපේ ගමන යන්න තමුන්නාන්සේලාට ආරාධනා කරමින්, සභාපතිතුමා, මට අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, මාධ්‍යවේදී මහත්මායණිනි, අද සභාවේ කටයුතු ඉතා සාර්ථක අන්දමින් සිදු වුණා. විශේෂයෙන්ම මම සතුටු වෙනවා මගෙන් කිව යුතු කරුණු උප සභාපතිතුමා අතින් කියවුනා. ඒක මට යෝධ ශක්තියක් වුණා. ඒ වගේම ගරු මන්ත්‍රීවරුනි, මම මේ දැන් කතා කරන වචනයේ සිට අවංකව, සද්භාවයෙන් තමයි කතා කරන්නේ. කිසිම කෙනෙකුට ඒක පාක්ෂිකව හෝ කිසි කෙනෙකුගේ පැත්තට කතා කරන්නේ නැහැ. මම සර්ව සාධාරණව වැඩකටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. දේශපාලන කෝණයෙන් බලලා කටයුතු කරන්නේ නැහැ. මම කියන දේ මූණටම කියනවා. නමුත් කටයුතු කිරීමේදී මගේ හදවතින් එහෙම එන්නේ නැහැ. සමහර අවස්ථාවලදී ප්‍රසිද්ධියේම කතා වෙනවා. නමුත් කිසි කෙනෙක් එක්ක වෛරයෙන්, ක්‍රෝධයෙන් වැඩ කටයුතු කරන්නේ නැහැ. ඉදිරියට එහෙම කරන්න බලාපොරොත්තු වෙන්නෙත් නැහැ.

අපේ සහබන්දු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට මම උත්තරයක් දෙන්න ඕන. 2018 වර්ෂයේ උඩුගම පොළේ රු. 30000.00ක හිඟයක් තියෙනවා. අනිත් ගෙවීම් සියල්ල ගෙවලා තියෙන්නෙ. උප සභාපතිතුමා පොළ ගැන මේ අවස්ථාවේ කථා කළා. ලක්ෂ 70ක පොළ සංවර්ධනය කිරීම අපේ පහුගිය කාලයේ යෝජනාව ඉදිරි මාස දෙක තුන ඇතුළත අනුමත වෙලා එයි. එතකොට අපි ඒ කටයුත්ත කරන්නම්. විශේෂයෙන්ම උප සභාපතිතුමා කිව්ව විදියට අළුත්වැඩියා කටයුතු කරන්න ලක්ෂ දෙකකට ආසන්න ප්‍රමාණයක් වියදම් කරලා තියෙනවා. ඩවුන් පයිප්ප දාන්න එක් ලක්ෂ ගණනක් වැය වුණා. ඒ වගේම මම ඔබතුමාලාට අදහසක් ගන්න කියන්නම්. ආදායම් විශ්ලේෂණය, මේ අවුරුද්ද තුළ අපට ආදායම එක් කෝටි විසි නම ලක්ෂයක් ලැබිලා තියෙනවා. එක්කෝටි තුන් ලක්ෂ ගණනක් වියදම් කරලා තියෙනවා. මේ දළ වශයෙන් තමයි කිව්වේ. රජයේ ආධාර මත අපි දළ වශයෙන් ලක්ෂ 43 ක පමණ වැඩ කරලා තියෙනවා. ගරු උප සභාපතිතුමනි, මන්ත්‍රීතුමනි, මේ අවුරුද්ද තුල නොයෙක් අඩුපාඩුකම් මැද අලුත් සභාපති කෙනෙක් හැටියට ඒ භූමිකාව සිදුකළා. ඇත්තටම වර්ෂ ගානක් මහජන නියෝජිතයෙක්, මන්ත්‍රීවරයෙක් විදියට මෙහි හිටියත්, සභාපතිට තියෙන බලතල මෙහෙමයි කියලා දැනුවත්ව නෙවෙයි මම මෙතනට ආවෙ. නමුත් හිතට එකඟව හොඳ වැඩ කොටසක් කරන්න තමයි මෙතනට ආවේ. නමුත් මේ පුටුවේ වාඩි වුණාට පස්සේ තමයි තේරෙන්නේ කොච්චර බලතල තිබුණත්, බලතල ප්‍රකාරව ඒ කර්තව්‍යයන් සිදු කිරීමට යාමේදී ගොඩක් බලපෑම් එනවා. ඕන කෙනෙකුට කියන්න පුළුවන් බලතල ඉටු කරන්න කියලා. නමුත් මේකේ දෙපැත්තක් තියෙනවා. මේක හරියට දැලිපිහියෙන් කිරි කනවා වගේ වැඩක්. අපි දකින වැරැද්ද තව කෙනෙකුට නිවැරදි ලෙස පේනවා. තමන්ගේ කටයුතු නිවැරදි ලෙස පෙනෙන, අනුන්ගේ කටයුතු වැරදි ලෙස පේන කොටසක් එක්ක තමයි කටයුතු කරන්න වෙන්නේ. සමහර වෙලාවට යම් කර්තව්‍යයන් සිදු කිරීමට යාමේදී, මම ඉතාමත් අසරණ වෙනවා. නමුත් ඒ කිසිම අවස්ථාවකදී ඒකපාර්ශික වෙලා, කාගෙවත් බස අහල

කටයුතු කරන්නේ නැහැ. කරලත් නැහැ. යම් සාධාරණත්වයක් තියෙන පැති වලට මම යම් සහනයක් ලබා දෙනවා. ඒ නිසා මේ අවුරුද්ද තුළ යම් යම් අඩුපාඩු වෙන්නැති. නමුත් ඉදිරි වර්ෂයේ අඩු පාඩු මකා ගෙන යන්න තමයි මගේ බලාපොරොත්තුව. ඒ සඳහා මේ විසි හත් දෙනාගේම ආශිර්වාදය සහ ශක්තිය මට අවශ්‍යයි. මෙතන ඉන්න මන්ත්‍රීතුමෙක් හරි මන්ත්‍රීතුමියෙක් හරි මොනව හරි ඉල්ලුවොත් බැරි නම් බැහැ. පුළුවන්නම් පුළුවන්. හැබැයි බැරි දේ කොහොම හරි කරලා දෙන්න උත්සාහ ගන්නවා. නමුත් එකපාරටම මට කරල දෙන්න පුලුවන් කියලා කියන්නේ නැහැ. මොකද එවිට මම බොරුකාරයෙක් වෙනවා. යම් යම් අවස්ථාවලදී යම් යම් අඩු පාඩු සිදු වෙන්න ඇති. විශේෂයෙන්ම වර්තමානයේ මට ලොකුම ගැටලුව තියෙන්නේ විදුලිය සහ කුණු ප්‍රශ්නය පිළිබඳ කටයුතු වල දී, අපිට පුළුවන් ආකාරයෙන් උපරිමයට කටයුතු කරලා තියෙනවා. කවදාවත්, කොහේවත් වීථි පහන් දාන්න එපා කියලා නැහැ. අදත් පොළේ විදුලිය ප්‍රශ්නයක් ආවා. තාක්ෂණ නිලධාරි මහතා යවලා සොයා බැලුවා. මම පොල අයිතිකරුට කිව්වා අද හදන්නෙ අන්තිම වරට. මීට පස්සෙ එහෙම වුනොත් ලයිට් හදන කටයුතු අපට කරන්න බැහැ කියලා. ඔයාට පොළ කරන්න බැරිනම් අපට දෙන්න. අපි කරන්නම් කියලා. මොකද අපට හැමදාම ඒ පිටිපස්සේ ගිහින් බලන්න බැහැ. ඒ වගේම අපේ අයත් දුරකථනයෙන් කතා කරලා, අපේ බල්බ් එක පිච්චිලා හදන්නෙ නැහැ කියලා කියනවා. ඉතින් මට ක්ෂණිකවම ඒ වෙනුවෙන් යවන්න බැහැ. මොකද තවත් පැතිවල යන්න තියෙන නිසා. සමහර වෙලාවට කියනවා. ජීවිත්තේටම විදුලිය හදන්න ආවෙ නැහැ කියලා. නමුත් මීට මාස 2කට උඩදි ඒ ප්‍රදේශවලට ගිහින් තියෙනවා. මට ඉතින් අර ධර්මපාලතුමා කියලා තියෙන විදියට කරන්න බැහැ. එතුමා කියලා තියෙන්නේ දේශපාලනය, සමාජ සේවා කරන අය බැනුම් අහන්න පුරුදු වෙන්න කියලා. ඉවසන්න කියලා. නමුත් මට නිවැරද්දෙ බැනුම් අහන්න බැරි නිසා මමත් බනිනවා. ඉතින් මාත් එක්ක අමනාප වෙනවා.

අපේ මන්ත්‍රීවරු සියලු දෙනා කියන දේ මම අහගෙන හිටියා. අපේ ධනංජය මන්ත්‍රීතුමා, තරුණ මන්ත්‍රීතුමන්ලා ඉවසීමෙන් කටයුතු කරන්න. මම එතුමට කිව්වෙ අනිත් මන්ත්‍රීවරුනුත් එක්ක ගැටුම් ඇති කර ගන්න එපා. ඔබතුමාගේ පියා හිටපු සභාපතිතුමා මේ ප්‍රාදේශීය සභාවේ වැඩ කොටසක් කරපු සභාපතිතුමෙක්. තමන්ගේ පුතත් ඒ අනුව හැඩ ගැහිලා සමාජ සේවයට ආවා. යම් යම් දේවල් නොදන්නවා වෙන්න පුළුවන්. නමුත් එතුමාගේ හැඟීම් අනුව තමයි. යම් යම් දේවල් පළ කරලා තියෙන්නෙ. අනිත් මන්ත්‍රීවරු ඒ ගැන හිතන්න යන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම දේශපාලනයේදී අපි ගොඩක් ආවේගශීලි වෙනවා. නමුත් මෙතුවක් කල් බොහොම සුහදශීලීව කටයුතු කරපු ප්‍රාදේශීය සභාවක් හැටියට අපි හැම තැනම ප්‍රසිද්ධ වෙලා තියෙන්නේ. ඒක අපට ලොකු ගෞරවයක්. ඒ නිසා ඒ ආකාරයෙන්ම කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම විශේෂයෙන් කියන්න ඕන. මේ දවස්වල අපේ බල ප්‍රදේශයේ උග්‍ර ජල හිඟයක් තියෙනවා. මිනිස්සු පෞද්ගලිකවත්, පොදුවේත් එම ජල ප්‍රශ්නය විසඳගන්න අපෙන් බලාපොරොත්තු වෙනවා. පෞද්ගලිකව ඉල්ලද්දී, අපි නීතිය නොසලකා සමහර වෙලාවට වැඩ කරන්න වෙනවා. සමහර හදිසි අවශ්‍යතාවයන් මත නොමිලේ ජල බවුසර් ලබාදීමට සිදුවෙනවා. අපේ තරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ උඩුගම රෝහලේ ජල ප්‍රශ්නයේදිත් මීට මාස ගාණකට කළින් අපි ජලය ලබා දුන්නා. මේ ඊයේ පෙරේදා නැවතත් ජලය ලබා දුන්නා. උඩුගම රෝහලට ජලය සපයා දීම සම්බන්ධව සෞඛ්‍ය සායනයේදී මහ ඇමැතිතුමා සමගත් කතා කරලා කිව්වේ මේක අපට කරන්න බැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා. නමුත් අපි අපේ යුතුකමක් හැටියට ජලය ලබා දෙනවා කියලා කිව්වා. මොකද අපට වතුර ලබා ගැනීමේ අපහසුතාවන් තියෙනවා. විශේෂයෙන්ම රෝහල්වලට හෝ පෞද්ගලිකව අපි වතුර ලබා දෙන කොට ඒවා වගකීමක් ඇතුව ලබා දෙන්න ඕන. ඒ අනුව ජලසම්පාදන දෙපාර්තමේන්තුවේ වතුර තමයි ලබාදෙන්නෙ. නමුත් පසුගිය දිනක රෝහලේ ඉල්ලීමට අනුව මට මෙහෙන් ජලය ලබා දීමට නොහැකි නිසා තවලම ප්‍රාදේශීය සභාවට කතා කරලා

නොමිලේ මම ජලය ලබා දුන්නා. නමුත් ඊයේ තරංග මන්ත්‍රීතුමා මම සමඟ ප්‍රකාශ කළේ මිනිස්සු කියන්නේ තවලම ප්‍රාදේශීය සභාව අපට වතුර ලබාදෙන බවත්, නාගොඩ ප්‍රාදේශීය සභාවෙන් කෙරෙන්නේ නැති බවත්. එහිදී මිනිස්සු දන්නැහැ තවලම ප්‍රාදේශීය සභාවෙන් වතුර එව්වෙ මම කියලා. ඒක නිසා තමයි අසාර්ථක සභාපති කියන්නේ. අපි බෝඩ් ගහ ගහ, රතිඤ්ඤා පත්තුකර විශාල ප්‍රචාරණයක් කරන්නේ නැහැ. මම පුළුවන් ආකාරයට තමයි කටයුතු කරන්නෙ. නිල ඇඳුම් ලබා දීමේදී මට තිබුණා ළමයි දෙමව්පියන් සමඟ කැඳවලා, උඩුගම ශාලාවේ ලොකුවට උත්සවයක් පවත්වලා කටයුතු කරන්න. නමුත් මම එසේ කළේ නැහැ. මම කිව්වා මම ඕනෙත් නැහැ. ඔය නිල ඇඳුම් ටික ගිහිල්ලා දෙන්න කියලා. ඒ වගේම අපේ සිවිලිම අධිපතිතුමා මගේ ඉල්ලීමට අනුව ළමයි 381 කට වතුර බෝතල් සහ ප්‍රමිතිගත කෑම පෙට්ටි ලබාදීමට කටයුතු කළා. එතුමාගේ නම ගහන්න ඕන නැහැ කිව්වා. මට ඕන්නං ඒකත් මගේ නමින් කරන්න තිබුණා. අනුන්ගේ පානෙන් එළිය බලන්න තිබුනා. නමුත් මම ඒ වගේ කටයුතු වලට යන්නේ නැහැ. නිල ඇඳුම වුණත් අපට දීගන්න බැරුව තමයි තිබුණේ. ධනංජය මන්ත්‍රීතුමා කිව්වා වගේ වැඩිම පෙර පාසල් ළමයි සංඛ්‍යාවක් ඉන්න ප්‍රාදේශීය සභාව තමයි අපේ නාගොඩ ප්‍රාදේශීය සභාව. අඩුම පසුගාමී සභාව වශයෙන් හැඳින්වුවත්, අපි දරුවන්ට අපෙන් විය යුතු කර්තව්‍යය උපරිම ආකාරයෙන් කරන්න ඕන. ඒ නිසා තමයි නිල ඇඳුමක් හෝ නොමිලේ ලබාදීමට කටයුතු කළේ. පසුගිය කාලයේදී නම් අපේ සභාවේ ආදායම් මට්ටම යහපත්. ඒ කාලයේ වැලි ආදායම, විස මත්පැන් වල ආදායම එනවා. ඒ මුදල් තිබුණ නිසා නිල ඇඳුම් දෙකක් දෙන්න හැකියාවක් තිබුණා. ඒ වගේම මන්ත්‍රීතුමන්ලා දහතුන් දෙනාගේ ප්‍රශ්න වෙනුවට දැන් විසි හත් දෙනෙක්ගේ ප්‍රශ්න විසඳන්න වෙලා තියෙනවා. ඒ නිසා දැන් ආර්ථික තත්ත්වය එතරම් යහපත් නැහැ. ඒ වගේම සහබන්දු මහත්තයා කිව්වා වගේ අපේ යෝජනා ඉටු වුණාද නැද්ද කියලා, මමත් 2002 වර්ෂයේ ඉඳලා ඉන්නවා. අපි ඒ කරපු යෝජනා මොනවද ඉටු වුනේ කියලා හදවතින් අහන්න පුළුවන්. මන්ත්‍රී කෙනෙක් ගේ ප්‍රතිපාදන ගෙනත් මොනවාහරි දෙයක් කළොත් මිසක් මේ සභාවෙන් අපට යෝජනාවක් ඉටුවුනේ නැහැ. මමත් 2002 ඉඳලා මේ සභාවේ හිටියා. මං මේ කරුණු කාරණා කියන්නේ, වර්තමානයේ තියෙන තත්ත්වයත් එක්ක සංසන්දනය කරන්න ඕන හින්ද මිසක් හිටපු උදවියත් එක්ක අමනාපයකට නෙවෙයි. අපි යන ගමන අපි යන්න ඕන. මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, යම් දෙයක් ඉල්ලනකොට අපට දෙන්න හැකියාවක් නැත්තේ, සභාවේ ආර්ථික තත්ත්වය හොඳ නැති නිසා. නැතුව මම දේශපාලන වශයෙන් පක්ෂ පාට බලන්නේ නැහැ. ඒ වගේම කොට්ඨාස 15 වේ යම් මන්ත්‍රී කෙනෙක් යෝජනා දුන්නම මම නිතරම කියන්නේ සියලු දෙනා සහභාගී වෙන්න, එකතු වෙන්න කියලා. එක කොට්ඨාශයක මන්ත්‍රීවරු හතර දෙනෙක් හිටියොත් මට හතරක් කරන්න බැහැ. එක් නියෝජිතයෙක් ඉන්නවා. එයත් එක්ක සම්බන්ධ වෙලා කටයුතු කරන්න. මේක පොදු ස්ථානයක් කියල හිතන්න. දේශපාලනය ගැන හිතන්න එපා. මම සර්වසාධාරණයෙන් සියලු දෙනාට එක සමානව බෙදන්නේ. මට මින් පසු අපේ මන්ත්‍රී කෙනෙක් වත් කියන්න එන්න එපා. අනේ අරක කරන්න එපා. මේක කරන්න එපා කියලා. මට පුළුවන් ආකාරයෙන් මම කටයුතු කරනවා. එහෙම නොකරන නිසා තමයි මට මේ දේ වෙන්නේ. මම හදවතින් සතුටින් යුතුව සභාපති හැටියට වැඩ කරනවා. නමුත් යම් යම් අයගේ කීම් වලට මගේ හිත වේදනාවට පත් වෙනවා. මම මා ගැන කියනවා නෙවෙයි. උදේ ආවම සමහර වෙලාවට මම කන්න යන්නේ හවස 4.30 ට විතර. පෞද්ගලික ජීවිතේ යම් යම් කැපකිරීම් කරනවා. ඒ නිසා සමහර වෙලාවට මට හිතෙනවා මම අත්සන් සභාපතිද කියලා. ඒ වගේම යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් නිලධාරියෙකුට කිව්වම, ඒක නිසි පරිදි ඉටු කරයි කියලා මම විශ්වාස කලත්, ඒක වෙනවද කියලා අන්තිමට බලනකොට තමයි දන්නෙ ඒ දේ සිදු වෙලා නැහැ කියලා. මේ විසි හත් දෙනාගේ ප්‍රශ්නත් සමඟ අනිත් ප්‍රශ්න සියලුම දේ දරාගන්න බැහැ. සමහර ඒවා මට අමතක වෙනවා. අපේ මන්ත්‍රීවරුන් සමහර වෙලාවට සහය දක්වන්නෙ නැහැ. අඩුපාඩු කියන එක විතරයි කරන්නෙ. ඒ නිසා සියලු දෙනාගේම සහාය මට අවශ්‍යයි. මම වැඩ කරන්නේ මගේ පෞද්ගලික ඕනෑ එපාකම් ඉටු කරගන්න නෙවෙයි. හෙට අනිද්දා පළාත් සභාව විසුරුවනවා. එතකොට ඒ බරත් එන්නෙ

අපට. මොකද පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් යම් මට්ටමකට හෝ ප්‍රතිපාදන එන්නේ නැහැ. ඒ නිසා බොහොම කල්පනාකාරීව ඔබතුමන්ලා ඒ අවශ්‍ය තැන්වලදී සහයෝගයෙන් කටයුතු කරන්න. මට සහය ලබාදෙන්න.

ඒ වගේම කටු පොල් පිළිබඳව කතාකරද්දී, අපි ඊයේ එම කර්මාන්ත ශාලාවට ගියා. මට පුළුවන් එදා සභාවේ තීරණය ගත්තට. රීට් ආඥාවක් ගෙනැල්ලා මේක නවත්වන්න. එහෙම කළා නම් මේ ප්‍රාදේශීය සභාව මිනිසුන් විසින් වටලාවි. සභාවේ සභාපති තමයි මේක සිදු කලේ කියලා කියාවි. ඒක ප්‍රශ්නයක් නෙවෙයි. මොකද මම සද්භාවයෙන් යුතුව තමයි කටයුතු කරන්නෙ. නමුත් අපි සියලුම නිලධාරීන් සමඟ ගිහිල්ලා කතා කරලා තමයි ඒ කටයුතු කළේ. අද වෙනකොට 10% ක් හරි යමක් කරපු බව පේන්න තියෙනවා. මොකක් හරි දෙයක් කරන්න යනවා කියලා තේරෙනවා. විශේෂයෙන්ම මේ කටු පොල් අපද්‍රව්‍ය එළියට දානකොට අද වැරැද්දක් වෙලා තිබුනට, එදා නාගොඩ ප්‍රාදේශීය සභාවේ දායකත්වය ලබාදීලා තියෙනවා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ ට්‍රැක්ටර්, බවුසර් ගිහිල්ලා ඒවායේ වැඩ කරලා තියෙනවා. ඒ නිසා මේක වර්තමානයේ වෙච්ච වරදක් නෙවෙයි. මම මෙහෙම කියන්නේ ඔක්කොම පීඩනය මට දානකොට මටත් යම් වේදනාවක් ඇති වෙනවා.

ඒ වගේම ඌරල පාර මීට අවුරුදු දහයකට දොළහකට කලින් තමයි වතුර බැහැල යන එක වහල තියෙන්නෙ. මමත් එතනට ගිහිල්ලා ඒ ගැන සොයා බැලුවා. චන්ද්‍ර සහබන්දු මහතා කිව්වට එක පැත්තක් අරගෙන කටයුතු කරලා නැහැ. අපි සද්භාවයෙන් ඒ කටයුත්ත කළේ. ගරු මන්ත්‍රීතුමා මම ඒ වගකීම ඉටුකරනවා. AGA එක හරහා මුදල් ඇවිල්ලා තියෙනවා. අපිට තියෙන්නෙ ඒ අවහිරතාව ඉවත් කරන්න. තාප්ප බැදලා තියෙන ඒවා අපට අදාළ නැහැ. ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් අවහිරතාවයය ඉවත් කිරීම සම්බන්ධව විමසූ විට, දැන් ඇස්තමේන්තු සකස් කරමින් පවතින බව කිව්වා. දැන් ඇස්තමේන්තු වෙනස් කිරීමක් කරනවා. තාම අනුමත වෙලා ආවේ නැහැ. අනුමත වෙලා ආපු ගමන් සිදු කරනවා කිව්වා. මම ඒ කටයුත්ත ගැන බොහොම කල්පනාවෙන් ඉන්නේ.

ඒ වගේම අනතුරුදායක ගස් කැපීමේදී ගොඩක් ප්‍රශ්න එනවා. අනතුරුදායක ගස් ඉවත් කරන්න කියලා මගේ නමින් නියෝග ගියාම, මිනිස්සු හිතන්නේ මට ඕන විදිහට තමයි කටයුතු කරන්නේ කියලා. ඒකට කරන්න දෙයක් නැහැ. ඒ වගේම ඔය දූරියන් ගහ ගැන කතා කිරීමේදී, අවුරුදු ගානකට උඩ ඉඳලා ඔය අනතුරුදායක තත්වය ඇතිවෙලා තියෙන්නේ. කුමක් හෝ පෞද්ගලික හේතුවක් නිසා පහු වෙලා තියෙනවා. නමුත් ඒවා අපට අදාල නැහැ. අපි ඒක කළ යුතුයි. ඒකේදි ඇත්තටම අපිට ඒ ගස කපා ගන්න බැහැ. මොකද රුපියල් ලක්ෂයකට වඩා වැඩි මුදලක් යනවා. වෙන්දේසි කරලා අපට ගන්න පුලුවන් නමුත් එහෙම කරන්න ගියාම ප්‍රශ්න ඇති වෙනවා. යථා කාලයේදී ඒ කටයුත්ත සිද්ධවෙයි.

ඊළඟට කුණු ප්‍රශ්නය ගැන කතා කිරීමේදී, තල්ගස්වල, නාගොඩ, යටලමත්ත, උඩුගම, උනන්විටිය ප්‍රදේශ වල අපි කුණු එකතු කරනවා. ඉස්සර නාගොඩ කුණු එකතු කළාට දැන් එකතු කරන්නේ නැහැ. ඒ වගේම අපි කුණු ලබාගන්නා ක්‍රමවේදයක් තියෙනවා. දිරන කුණු සහ නොදිරන කුණු එකට දාලා අපි අරන් යන්නේ නැහැ. ඒක ලොරියෙ යන අයව දැනුවත් කරලා තියෙන්නේ. ඒ වගේම අපට ඉන්නේ සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනයි. ඒ දෙන්නත් එක්ක තමයි සියලු දේ කරන්න වෙන්නේ. ඔබතුමාල දැන් කොම්පෝස්ට් එකට ගිහිල්ලා බලන්න. දැන් බොහොම පිරිසිදු තත්ත්වයට තියෙනවා. කොම්පෝස්ට් කිලෝ 3000 ක් විතර තියෙනවා. කොම්පෝස්ට් අවශ්‍ය අය ඉල්ලන්න. කොම්පෝස්ට් එකට පළාත් ලේකම් තුමා අලුත් මැෂින් එකක් සඳහා විස්තර ඉල්ලුවා. ඒ විස්තරත් අපි යැව්වා. මේ වෙනකොට පොල් ආදායම රු. 88,406.00 ක් වෙනවා. එමෙන්ම අනවසර ඉදිකිරීම් පිළිබඳව සභාවට නිතරම පැමිණිලි එනවා. සමහර අවස්ථාවලදී ඒ සම්බන්ධව රෑ දොළහට එකට විතර මට කතා කරනවා. පසුගිය දවසක තල්ගස්වල මාළු ලැල්ල සම්බන්ධව මට කතා කලා. එතන මාළු විකුණන

මනුස්සයම ගඩොල් වලින් බැඳලා ඉදිකිරීමක් කරලා තියෙන්නෙ. මම කිව්වා අවශ්‍ය වුනොත් කඩන්න වෙයි කියලා. මම RDA එකට මේ ගැන කිව්වම, RDA එකෙන් එම අනවසර ඉදිකිරීම ඉවත් කල යුතු බව කිව්වා. ඒ වගේම අලුත්වත්ත ප්‍රදේශයේ තියෙන අනවසර ඉදිකිරීම් RDA එකෙන් ඉවත් කරන බව ප්‍රකාශ කළා. මාපලගම හන්දියේ තියෙන අනවසර ඉදිකිරීම් යථා කාලයේදී ඉවත් කිරීමට අපි කටයුතු කරනවා. ඒ අවස්ථාවන් වලදී අපේ සමහර අය කියනවා සභාපති තමයි ඕක කරන්නේ කියලා. ඉතින් ඒ සියලුම දේවල් දරාගෙන තමයි මම කටයුතු කරන්නේ. ඒ වගේම අපේ සභාවේ, ඉඩම් පිළිබඳ කර්තව්‍යයේදී ඔය ඉඩම් පිළිබඳව ආණ්ඩුකාර තුමා ඇතුළු සියලු දෙනා කතා වෙලා කටයුතු කිරීමේදී, අපි භුක්තිවිදින අපිට අයිති නැති සියළු ඉඩම් නම් කරලා ලබා දුන්නා. ආදාහනාගාරයට සහ තල්ගස්වල තියෙන LRC ඉඩම් අපට ලබා දීලා තියෙනවා. මැනුම් නියෝග අරගෙන තියෙනවා. මිනින්දෝරු මහත්මයා අසනීප වෙලා මේ වෙනකොට ඒක කරගන්න අපහසු වෙලා තියෙනවා. මම වෙන කෙනෙක් හරි අරගෙන මැණුම් කටයුතු කරලා අපේ භුක්තියට අරගෙන සංවර්ධන කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මේ

ඒ වගේම තමයි අපේ වනමල් මන්ත්‍රීතුමා බස්රථ පිළිබඳව කතා කළා. අපි ඉදිරියේ දී අදාළ ආයතන වෙත දැනුම් දෙන්න කටයුතු කරනවා. ලේකම්තුමිය අදාළ ආයතනවලට ලිපි යවන්න. අපේ ධනංජය මන්ත්‍රීතුමා, උඩුගම බස් නැවතුම් පොලේ වැසිකිලිය පිළිබඳව කතා කලා. මම ඊට කලින් අදාළ ආයතන වෙත කතා කළහම එයාල පොරොන්දු වුණා ඒ කටයුතු කරන්න. අපට කිව්වා ලියුමක් එවන්න කියලා. ඒ අය ඒ කටයුතු ටික කරනවා. සුද්ද පවිත්‍ර කරන්න මනුස්සයෙක් යොදාගන්න පුළුවන් ද කියල අපෙන් ඇහුවා. ඒ වගේම පියල් මන්ත්‍රීතුමා අපේ වැයම අසාර්ථකයි. ඔබතුමාලා ඒ වැඩ කලාට, ඒ ගැන අවධානයෙන් ඉන්නෙ නැහැ. ඒ නිසා ඇයි අපි මේවට වියදම් කරන්නේ කියලා හිතෙනවා. අපි හදනවා. වෙන අය කඩනවා. CCTV කැමරාවක් තියෙනවනම්, නඩුවක් දාන්න පුළුවන්. අපිට ඕක බේරගන්න බැරි නම් කරුණාකරලා ටොයිලට් එක ගැන කතා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා අපට ඔතනට වෙලා ඉන්න බැහැ. ඒ නිසා අපි ඒ සම්බන්ධව පොලිසියේ පැමිණිල්ලක් දාමු. ගරු මන්ත්‍රීතුමන්ලා ඔබතුමාලත් හොයලා බලන්න මේවා කරන්නේ කවුද කියලා.

මාපලගම බස් නැවතුම්පොලේ දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් ඉදි කිරීමට යෝජිත වැසිකිලි පද්ධතියට අදාලව කලින් සකස් කරන ලද ඇස්තමේන්තුව වෙනස් කිරීමට හැකියාවක් තියෙනවද? කියලා අපෙන් අහලා තියෙනවා. අපිට තාක්ෂණ නිලධාරි මහත්තයා යවලා ඇස්තමේන්තුව සංශෝධනය කරන්න පුළුවන් නම් සංශෝධනය කරලා, අපි කවුරුත් ඒ කටයුත්තට සහයෝගය දක්වලා කටයුතු කරමු. කවුරු විරුද්ධ වුනත් ඒ කටයුත්ත කරන්න එකතු වෙන්න කියලා මම ගෞරවයෙන් ආරාධනා කරනවා. ඒ වගේම අපේ වනිගරත්න මන්ත්‍රීතුමා ප්‍රකාශ කල බංගම පාරේ පස් කන්ද, මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දීලා එම පස් කන්ද ඉවත් කරන්න කටයුතු කරන්නම්. ඒ වගේම ධනංජය මන්ත්‍රීතුමා කිව්වා වගේ පිරිසිදු කටයුතුවලදී තමයි ප්‍රශ්නෙ වෙන්නේ. ඒ කාලේ සේවකයන් හිටියා. නමුත් අද වෙනකොට විශ්‍රාම ගිහිල්ලා සේවකයෝ පස් දෙනයි ඉන්නේ. මම සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගන්න ඉල්ලීමක් කළා. නමුත් කම්කරුවන් බඳවා ගත්තෙ නැත්තෙ ආදායම් තත්වය යහපත් නැති නිසා. කම්කරුවන් දෙන්නෙක් තුන්දෙනෙක් ගත්තොත් රුපියල් පනස්දාහක් විතර යනවා. ඒ නිසා තමයි මම ඉන්න අයගෙන්ම කටයුතු කරන්න හැදුවේ. නමුත් ඉදිරි වර්ෂය තුළ මම යම් වැඩපිළිවෙලකට අවතීර්ණ වෙනවා. ඒ වගේම විදුලිය සහ කුණු ප්‍රශ්නවලදී සුබදායක වැඩපිළිවෙළක් කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම අපේ ප්‍රාදේශීය සභාවට අවුරුද්දක් පිරුණු පහුගිය 28 වෙනිදා මේ සභාවේ නවීකරණය කරන ලද පුස්තකාලය පාඨක අයිතියට ලබාදීම හා සභාපති නිල කාමරය පරිහරණය කිරීමට කටයුතු කළා. ඒකෙදි අපේ හිටපු සභාපතිවරුන්, උප සභාපතිවරුන්,මන්ත්‍රීතුමන්ලා කැඳවලා උපහාර

උළෙලක් පවත්වන්න කටයුතු යොදාගෙන තිබුනත්, එතුමන්ලා සම්බන්ධ කර ගැනීමට හා කාලය වෙන්කර ගැනීමට නොහැකි වුණා. ඒ නිසා ඒක ඉදිරි කාලෙට තියලා, ගිහි පිරිතක් කියලා මේ සභාවට ආශිර්වාද කරන්න අපි බලාපොරොත්තු වුණා. ඒ කටයුත්ත ඉතා සාර්ථක ව, පක්ෂ භේදයකින් තොරව ඔබතුමන්ලා සියලු දෙනා එකතු වෙලා ඒ කටයුත්ත සිදු කළා. ඒ වගේම සභාවේ ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරී මහත්වරුන්, නිලධාරී මහත්මියන් තමන්ගේ ගෙදර කටයුතු කරන වගේ උදව් වෙලා සාර්ථකව කටයුතු කලා. ඒ සම්බන්ධව මම මේ අවස්ථාවේදී උප සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ට ගෞරවය පුද කරනවා. ඒ වගේම මගේ බලාපොරොත්තුවක් තියෙනවා. 1991 වර්ෂයේ සිට හිටපු සභාපතිවරුන්ගේ පින්තූර, ඒ වගේම සමූහ පින්තූර අපේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රදර්ශනය කරන්න. පහුගිය කාලයේදී පින්තූර ටික මෙහෙ තිබුණා. අලුත්වැඩියා කටයුතු සිදුකිරීමේදී උඩුගම උප කායීලයට ගෙන ගියා. නමුත් දැන් ඒවා සොයා ගැනීම අපහසු වෙලා තියෙනවා. ඔබතුමාලටත් පුලුවන්නම්, මේ සඳහා ඡායාරූප ලබා දීලා මට උදව් කරන්න. ගම්සභා කාලේ ඡායාරූප හොයාගන්න අපහසු වේවි. නමුත් මම ඒ දේ කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් අද සභාවේ ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු දෙනා අදහස් ප්‍රකාශ කිරීමේදී තමන්ගේ හදවතට එකඟව, අවංකව අදහස් ප්‍රකාශ කිරීම ගැන මම සතුටු වෙනවා. අපේ හදවතේ තියෙන මනුස්සකම එළිදක්වමින්, සහෝදරත්වයෙන්, අපි සියලු දෙනාගේ ම වගකීම වෙන්නේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ උපතේ සිට මරණය දක්වා වූ සැම දෙයක්ම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවෙන් අපි සියලු දෙනා එකාමෙන් කටයුතු කරන්නේ. අපි එක අම්මගෙ දරුවො වගේ ඉදිරි අවුරුද්දෙත් වැඩකටයුතු කරන්න අවශ්‍ය වාසනාව, ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. අවසාන වශයෙන් අප්‍රේල් 18 වැනිදා මගේ ගාල්ලේ නිවසේ පැවැත්වෙන දිවා භෝජනය සඳහා සියලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්, කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම සහභාගි වෙන්න කියලා ආරාධනා කරමින්, ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වාසනාවන්තම අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. සැමට සම්මා සම්බුදු සරණයි.

සභාපති,

නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:- ............................